# පාරුපනනය

## (චීවරප්‍රමාණාදිය සහිතයි)




**දෙඩන්දූවේ ගංගාරාමාධිපති විනයාචරිය සද්ධම්මකිත්තිස්සිරි**

**මහොපාධ්‍යාය**

**ශ්‍රී සීලරතන සරණජෝතිතිස්සාභිධාන**

**මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් සම්පාදිතයි.**

නැවත සංරක්‍ෂණය : මැදින්/2557 ( 2014 මාර්තු )

## සංරක්‍ෂණය සහ ධර්මදානය

පින්වත් පුණ්‍ය ශ්‍රී තුෂන්ත මහතා සහ උපේක්‍ෂා පියරංගිකා මහත්මිය විසින් අභාවප්‍රාප්ත ඥාතීන්ට පුණ්‍යානුමෝදනා කිරීම පිණිසත් කල්‍යාණමිත්‍රයන් වහන්සේලාට හා දෙමවුපියන්ට සෙත් පැතීම පිණිස මෙන් ම තමන්ට ධර්මාවබෝධය පිණිසත් මෙම ධර්මදානය සිදු කරන ලදී.

සැ.යු.

දෙඩන්දූවේ ගංගාරාමාධිපති විනයාචරිය සද්ධම්මකිත්තිස්සිරි මහෝපාධ්‍යාය අතිපූජනීය ශ්‍රී සීලරතන සරණජෝතිතිස්සාභිධාන මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් සම්පාදිත **'පාරුපනනය'** නම් වූ මෙම ධර්මග්‍රන්ථයෙහි ඇති දුර්ලභ බව සහ වටිනාකම සලකමින් ධර්මදානය සඳහා පමණක් කර්තෘ අවසරය රහිත ව අප විසින් මෙය සංරක්‍ෂණය කරන්නට යෙදුණු අතර කර්තෘ වෙනුවෙන් යම්කිසි පාර්ශ්වයකට අලාභයක් සිදූ වී ඇතිනම් මේ සඳහා අලාභ ගෙවීමට අප සූදානම් බව දන්වා සිටිමු.

පුණ්‍ය ශ්‍රී තුෂන්ත
'සදහම් සෙවණ'
134/A, ගලගෙදර වත්ත,
වැල්හේන පාර, මාතම්මන,
මිනුවන්ගොඩ.
දුර. 071-4417813

# පාරුපනනය

(චීවරප්‍රමාණාදිය සහිතයි)

දෙඩන්දූවේ ගංගාරාමාධිපති විනයාචරිය සද්ධම්මකිත්තිස්සිරි
මහෝපාධ්‍යාය
**ශ්‍රී සීලරතන සරණජෝතිතිස්සාභිධාන**
**මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ**
විසින් සම්පාදිතයි

සව්නිකායික "විනයවාදිනී" කාරක සංඝ සභාව
විසින් ප්‍රතිගෘහිතයි.

දෙඩන්දූවේ "සනීඩේල්"හි නිවැසි
**චාර්ලස් ජයවර්ධන මහතා**
විසින් ප්‍රකාශිතයි.

මහාබෝධි යන්ත්‍රාලයෙහි මුද්‍රිතයි.

බු: ව: 2492
ක්‍රි: ව: 1948



සවගීසත්වී වදල

ආචාර්ය

**අම්බලම්ගොඩ සිරි සීලරතන**

මහානායකමාහිමියන්වහන්සේ

# ගන්ථකතතු විනයාචරියපරමපරා.

සංසුද්ධකුන්දසිතකිතති මහාමහින්ද-
-ථෙරන්වය විසදසීල ගුණෙනුපෙතො
ඤාණාභිවංස ඉති විස්සුත සංඝරාජා
ආසී මරමමවිසයෙ විනයෙහිජෙතො

තසසනතිකමහි විනයෙන සහෙව ධමමං
ආචෙරවාචිතනයෙන සමුගගහීසො
මෙතතාදයාප පරිපූත මනොසපඤ්ඤො
සො ධමමජොතී යති සඞ්ඝපතී ඉභාග.

තං ථෙරපාදමුපගමම සගාරවෙන
නානා නයෙන විනයං පරිපුචඡමානො
සමමාව ගමම විනයො සුගතසස ධමමා-
-රාමඩිභගො අභවි නො යතිසඞ්ඝනෙතා.

එතං මහාමතිමුපජඣ මථතතනොමයො
තසසනතිකෙව නිවසං විනයෙ පවුතතං
පතතො මහාගුණධනො ගරුභාවනීයො
පොරෙසි සීලරතනවහය සඞඝනෙතා.

එසොව මං විනයසුතතවරෙ තථෙව
සුතතානුලොම සහිතාචරියපපවාදෙ
වාදෙපි අතතමතිකෙ පඨමං විනෙසි
එසාව මෙ විනයආචරියපපවෙණී

ලඞකාය ඝික්ඛඩුව නාම පතීත ගාමෙ
ජාතොති නිමමලයසො විනයෙ විනීතො
පාචෙරකො සුමනතිසස සමඤඤුපෙතො
නෙතා අකා මමභිවුඩ්ඪිපථං හිතාය.

සම්මාම්බලම්ගොඩ ඉති ස්සුත ගාමකස්මිං
ජාතො විසුද්ධචරිතො විනයත්ථවෙදී
යොවාසි සීලරතනාවහස සඩ්ඝනෙතා
එසො මමාචරිය ථෙරවරො අහොසි.

සද්ධස්සිතාචරිය ථෙරවරානුභාවං
නිස්සාය දුම්මත නිරාකරණෙ සමත්ථං
සුත්තාදිනෙක නයමෙත්ථ විනිච්ඡයන්තා
සද්ධාය පාරුපනආදිනයං භජන්තු.

ලඞ්කාය දක්ඛිණෙවාළු-කාරමහි විදූරකරෙ
පුප්ඵාරාම විහාරස්මිං-අධිවුත්ථො මහාකවි.

උක්කට්ඨාදිමහානිස්සා-පිසවංසධජවහයො
ඤාණතිලක නෙතාසී-සද්දසත්ථමහිමෙ ගුරු.

කොළම්බනගරෙ විජ්ජා-දසසත්ථාලයෙඅපි
සිස්සා පොරාණකො ආසිං-මහානායක සාමිනො.



දොඩන්දූවේ

**ශ්‍රී සරණජෝති මහානායක**

ස්වාමීන්ද්‍රයන්වහන්සේ

# සංඥාපනය.

පාරුපනනය නම්වූ මෙම ග්‍රන්ථය නිපදවනලද්දේ පණ්ඩිත කෝද්දාගොඩ ඥානාලෝක ස්ථවිරයන්විසින් ශාසනිකචීවරයත් උභයාංශපාරුපනයත් විනාශකර දුෂ්ප්‍රතිපත්තියක් පහළ කරණු පිණිස කරන ලද පාරුපන සිඛ නමැති ග්‍රන්ථයෙහි දක්වෙන විනයවිරුද්ධමත නිරාකරණය කිරීමෙන් ශාසන සංග්‍රහය පිණිසය.

මේ ස්ථවිරයන් කලින් ප්‍රකාශ කරණලද පාරුපනපාලි නමැති ග්‍රන්ථයෙක්ද ඇත. මේ පාරුපනපාලිය පාරාජික පාලි පාචිත්තියපාලි ආදියමෙන් ත්‍රිවිධ සංගායනාවට ඇතුළත් නැතත් අනාගත කාලයෙහි දෙශනා පෙළේම පාලියක් යයි සැක කිරීමට ඉඩතිබේ.

තවද පාරුපනපාලියෙහි සුපටිච්ඡන්නසික්ඛාපදට්ඨකථායං වුත්තං යනු කියාතිබෙන බැවින් සුපටිච්ඡන්න ශික්ෂාපද අටුවාවක්ද තිබෙන බවක් හැඟේ මේ කරුණු සලකනවිට පාරුපනපාලියත් සුපටිච්ඡන්නසික්ඛාපද අටුවාවත් ත්‍රිපිටකයෙන් බැහැරවන බැවින් වෛතුල්‍ය පිටකයෙහි කොටසක් යයි සැක කිරීමටද ඉඩ තිබේ.

එහි සිංහල අනුවාදයක් හැටියට පාරුපනසිඛ කර තිබේ. පාරුපනපාලියෙහි දක්වෙන සමහර කරුණු පාරුපනසිඛ යෙහි වෙනස්කර තිබේ. ඉන් හැඟෙන්නේ ඒ පාලි ග්‍රන්ථය නියම ශුද්ධ ග්‍රන්ථයක් නොවන බව තමන්ම ප්‍රකාශ කිරීමකි. ශුද්ධ ග්‍රන්ථයක් නම් වෙනස් නොකොට පරිවර්තනය පමණක් කටයුතුවේ. එබැවින් පාලිග්‍රන්ථයට උත්තරපොතක් ලිවීම නිරර්ථක කටයුත්තකි

පාරුපනය උගතමනා දෙශනාර්ථකථාදිය එමට තිබේ. එහෙයින්ම ලඞ්කාශාසන භාරධාරී පඬිවරයෝ නිශ්ශබ්දවූහ. ඉන් ශජීයට පත් සිඛකර්තෘ තම ඇදකරවන භාෂායෙන් පාරුපනසිඛ කළේය.

භාෂාවක ලොපාදෙශාගමාදිය වූවමනා කරන්නේ උච්චාරණ පහසුවත් වාක්ශලිෂ්ටතාවත් අපෙක්ෂාවෙනි. ඒ කිසිවක් බලාපොරොත්තු නැතිව ස්ථාන අස්ථාන විචාරයක්

නැතිව විකාර ආකාරයන්ගෙන් ගහණකොට පාරුපනසිඛ ලියා තිබේ. රළු අකුරු නැති මදසමාස ඇති චූර්ණිකගද්‍ය ලක්‍ෂණයෙහි පිහිටියේ නම් මීට වඩා කියවීමට පහසු වන්නේය.

ආකාර විකාරය කරණකොට එබඳු මාධුර්‍යයෙක් පාරුපනසිඛයෙහි නැත. ගුරුළුගෝමීන් විසින් කරනලද අමාවතුරෙහි කව ඇදකරවන භාෂාවක් නැත. ඒ මධුර මනොහර කොමල ශිෂ්ට පණ්ඩිතයන්ගේ භාෂා නීති රීති උල්ලඞ්ඝනය කොට සිංහල භාෂාව දූෂ්‍ය කිරීමට අදහස් කළාක් මෙන්ම අළුත්කූරුවේ පඬිහු මෙන් සම්බුද්ධශාසනයද විනාස කරනු පිණිස දෙශනාට්ඨකථා ටීකා පොත්වල දක්වෙන අදහස් නොපිළිගෙන දුටු දුටු පාඨ දක්වියයුතු තැන නොතැන නොසලකා කිසිම පිළිවෙළක් නැතිව අවිචාරිත පරිදි කරුණු දක්වා තිබේ.

තර්කානුගතව ගත් වාදස්ථාන සුගතදෙහප්‍රමාණය. සුගත් විදත, සුගතචීවරය, භික්‍ෂූන්ගේ චීවරය, පාරුපනය, බුදුපිළිමය, යනාදිහු වෙති. බුද්ධදෙහප්‍රමාණය උන්නතභාවයෙන් සිඛකතීයට වඩා වෙනසක් නැති බව කියයි. කසුප් බුදුන් සම විසිරියනක් උස බව බුද්ධවංසපාලියෙහි වදාළ සේක. අටුවාහි අප බුදුන් දොළොස්රියනක් උස බව දක්වේ. කසුප්බුදුන් හා සමකොට බැලීමේදී අප ගෞතම බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී දෙහය දොළොස් රියනයයි අටුවාහි දක්වෙන ගණන හා සංසන්දනය වේ.

භික්‍ෂුණීවිභඞ්ගපාචිත්තියපාලියෙහි භික්‍ෂුණීයට ජලස්නානයට වදාළ දියසළුව සිඛකතීා කියන්නේ දිග දෙරියනයි. පළල රියනයි. අටුවාහි කී ගණනින් මැනගත් විට දිග සරියනයි. පළල තුන්රියනයි. අටුවාහි කී ගණන ජලස්නානයට පමණය. සිඛකතීා කියන දෙරියන් රියන්කඩ භික්‍ෂුණීයට තබා සාමාන්‍යස්ත්‍රියකටවද විළිවසා හැඳ ස්නානයට නොපිළිවන් බැවින් බුදුමතය දක්වෙන අටුවා මතයම පිළිගතයුතු. සිඛමතය හළයුතු.

සුගත් වියත මධ්‍යමපුරුෂ වියත් තුන බව අටුවාහි කියා තිබේ. ටීකාවලත් ඒ ගණනම ලැබේ.

භික්ඛුණීවිභඞ්ග පාචිත්තියපාලියෙහි ජලසාටිකයෙහි පමණ වදාළේ සුගත් වියතෙනි.

සුගතදෙහප්‍රමාණය තමන්වහන්සේගේ වියතෙන් වියත්අටක් උස බව බුදුන්ම වදාළ බැවින් අප බුදුන් දොළොස්රියනකැයි අටුවාහි දක්වූ ගණන බුද්ධඝෝෂාචාර්‍ය්‍ය මතය නොව සම්ඥමතය බව සැලකියයුතු. කරුණු මෙසේ බැවින් සිඛකාමීනට දෙශනාපෙළට පහර නොගසා සවමතය ස්ථිරකරන්නට නොපිළිවන. යටකී පරිදි බුදුමතය අනුව සුගත චීවරය මැනගත් විට මධ්‍යමපුරුෂ රියනින් දිගත තෙළෙස්රියන් සමාරත් සරස නවරියනත් ලැබේ. ඒ සුගත චීවරයාගේ ප්‍රමාණය මෙසේ යයි වදාළසේක.

සුගත් අතින් නවවියත් සවියත් චීවරයෙහි සාධාරණ පරිභොගය වදාළේ ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේට පමණක් බැවින් සෙසු ශ්‍රාවකයන්ට එපමණ සිවුරු පරිහරණය තහනම්ය. මේ බැව් නොසලකා නවවියත් සවියත් සිවුරු පරිහරණය බුදුන්ට පිළිවන් නම් අපට නොහැකිවන්නේ මන්දැයි කරණ තර්කය මෝඝතර්කයකි. සුගතචීවරප්‍රමාණසිවුරු දැරීමට පිළිවන්යයි කියන්නේ අධික ඌනක සිවුරු ගැන විනයනීතිය නොදත් බවම ප්‍රකාශ කිරීමෙනි. මෙසේ නොවේයයි බුදුන් සමග වාද නොකර සිඛකාමීාට ගැලවී යා නොහැක.

සුගතචීවරයට ඌනවත් ථෙරවාදයේ දක්වෙන මුට්ඨිපඤ්චක සිවුරට උත්කෘෂ්ටවත් අතර සිවුර කරගැනීමට වදාළේ පළමු ඍද්ධියෙන් ලද සිවුරු විද්‍යමාන බැවින්ම එපමණින් කරගැණීමටයි.

ඒ සිවුරුවල ප්‍රමාණය සඞ්ඝාටි උත්තරාසඞ්ගදෙක දිග පස්රියන් සමාරයි. පළල සිව්රියන් සමාරයි. අඳනය දිග පස්රියන් සමාරයි. පළල දෙරියන් සමාරයි. මේ සිවුරු තුන් සිවුරු අධිෂ්ඨානයට ගතයුතු නියම සිවුරු වෙති. සිඛකාමීා කියන මුට්ඨිපඤ්චකය තුන්සිවුරු අධිෂ්ඨානයට නොගතයුතු. ඌනකයක් බව විනයෙහි දක්වා තිබේ.

පාරුපනය වනාහි ඒකාංශපාරුපනය උභයාංශපාරුපනය යයි ද්විප්‍රකාරයි. මහණකම ලැබූ දා පටන් විහාරයෙහි විසීමට ස්වාභාවික ඒකාංශපාරුපනයක් ගම්වැදීමට උභයාංශපාරුපනයත් පැවැත්වියයුතු ආකාර විනයපිටකයෙහි ප්‍රකටව තිබේ.

ලෝකයෙහි කා අතරත් ගෙදර සිටි වේශය වෙනස් කරගෙන පිටතයාම ශිෂ්ට සම්මත සිරිත වේ. සඞ්ඝරත්නය පහළවූ දා පටන් සුපටිච්ඡන්න ශික්ෂාපදය පැනවීමට කලින්ම ගම්වැදීමෙහි උභයාංශ පාරුපනය පැවැති බැව් විශාලාමහනුවර පිරිත් දෙශනා කළ ආනන්ද මහතෙරුන්වහන්සේගේ උභයාංශපාරුපනය පැවතීමෙන් ප්‍රකාශවිය. ඒ සිරිත ෂඩ්වර්ගීය භික්ෂූන් කඩකළ බැවින් සුපටිච්ඡන්න ශික්ෂාපදය පැනවූසේක.

සියළු තැන ඒකාංශපාරුපනය පැවතියේ නම් සුපටිච්ඡන්න උභයාංශපාරුපන ශික්ෂාපදය පැනවීමෙන් වුවමනාවක් නැත. මේ පමණක්වත් සිතාගත නොහැකිවීම බලවත් වරදෙකි. බුදුපිළිම දක්වන්ට සිඛකතීහු ඕනෑකලේ ඒකාංශපාරුපනය දක්වනු පිණිසයි.

වඩිනපිළිමයක් කිරීම නොහැකි බැවින් විහාරයෙහි වැඩසිටින ආකාර පිළිම කරතිබේ. ඒකාංශපාරුපනය බුරුම ලඞ්කා රටවල ඇති නැතිවූ සැටි මෙහි ඉතිහාසපරිච්ඡෙදය බැලීමෙන් දතයුතු.

ස්වමතය ස්ථිරකිරීමට සිඛකතීහු ගෙනහැරදක්වූ කරුණු උත්තරපරිච්ඡෙදයෙහි නිරාකරණය කර ඇත.

මේ පාරුපනනය නමැති ග්‍රන්ථය කියවන මැදහත් කා හටත් ස්වමතය තහවුරු කරන්නට සිඛකතීහු දැක්වූ කරුණුවල අතිශය නිශ්සාරභාවය උත්තරපරිච්ඡෙදයෙහි විස්තර කර ඇති බැවින් කියවා හොඳින් තේරුම්ගෙන පන්දහසක් හවුරුදු පවත්නා සම්බුද්ධශාසනය රැකගැණීමෙන් ප්‍රතිපත්ති පූරා නිවන් පසක් කරගැනීමට උත්සාහ කටයුතු.

මීට-ශාසනස්ථිතිකාමී,
දෙඩන්දූවේ සරණජෝතිතිස්ස
මහානායක ස්ථවිර.

25-8-1918.
ගංගාරාම විහාරය,
දෙදඩන්දූව.

# පාරුපනනය

(චීවරප්‍රමාණාදිය සහිතයි)

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

වන්දිත්වා සිරිසම්බුද්ධං-ධම්මඤ්ච ගණමුත්තමං
විනයෙ ච යමාදාය-නයං පාරුපනෙ වදෙ

ආදිතො ජිනපුත්තෙහි-ආභටං බුද්ධසාසනෙ
ලිඞ්ගං සාමණකං කල්‍යාණා-ලොකො යති විනාසයං

දුප්පාරුතං පකාසෙත්වා-විනයක්කමතො පරං
අතො පාරුපනෙ සික්ඛං-නෙව සාධෙය්‍ය සාහිතං

දුප්පොසිතං මහාලක්කා-පාතං විය අනත්ථදං
සම්මග්ගතෙ විහෙඨෙන්තං-දප්පහත්ථප්පසාරිතං

පාරුපනාදි සික්ඛාඛ්‍ය-හජං සාසනනාසකං
විනයඤ්ඤූසතො එව-පාපෙය්‍යං වනපනන්තකන්ති

ශ්‍රී සද්ධර්ම චක්‍රවර්ති ස්වාමී සුගත තථාගත සම්මා සම්බුද්ධ සර්වඥ රාජෝත්තමයන් වහන්සේද

සපර්‍යාප්තික නවලෝකෝත්තර ශ්‍රී සද්ධර්මයද සෞශීල්‍යාදි අමිත ගුණෝපශෝභිත ප්‍රවර අෂ්ටාර්‍ය පුද්ගල සඞ්ඝයාවහන්සේද සායාදී වාරත්‍රයෙන් වැඳ විනය නය ගෙන පාරුපනනය නමැති ග්‍රන්ථයක් කියන්නෙමි.

පණ්ඩිත කෝදාගොඩ කල්‍යාණාලෝක ස්ථවිරයන් වහන්සේ ශාසනික භික්ෂූන් විසින් ශාසනයෙහි මූල පටන් මේතාක් ගෙනෙනලද මහණරූප සංඛ්‍යාත ශ්‍රමණ ලිඞ්ගය විනාශ කරනුයේ විනයාගත ක්‍රමයෙන් වෙනස් අන්‍ය දුෂ්ප්‍රාවෘතයක් ප්‍රකාශ කොට පාරුපනසික්ඛා නමැති ග්‍රන්ථයක් කළහ. ඒ ග්‍රන්ථය ශාසනික භික්ෂූන්ගේ හිතසම්පත්තිය සිදු නොකරන්නේ මය,

තපුරු කොට පෝෂ්‍ය කරන ලද මහා උල්කාපාතයක් මෙන් අනර්ථ ගෙනදෙන්නාවූ මිථ්‍යා පිළිවෙත පිළිපදින්නන් වෙහෙසට පමුණුවන්නාවූ දෘෂ්ටි නමැති සොඬය දිගුකරගෙණ සිටින්නාවූ ශාසන නාශකවූ පාරුපනඞ්ග නමැති හස්තියා විතණ්ඩකුණයෙන්ම වනප්‍රාන්තයට පමුණුවන්නෙමි.

අධිශීල අධිචිත්ත අධිප්‍රඥ සංඛ්‍යාත ශික්ෂා පූරණයට විනය සූත්‍රාභිධර්ම යන පිටකත්‍රය පිහිට වන්නේය. ඒ බව "සුත්තන්තෙ රක්ඛිතෙ සන්තෙ පටිපත්ති හොති රක්ඛිතා"යි සූත්‍රාන්තය රක්නා ලද කල්හි ප්‍රතිපත්ති තොමෝ රක්නා ලද්දී වන්නී යයි වදාළ බැවින් උද්ග්‍රහණ ධාරණ විසින් ත්‍රිපිටකය අවිපරීත කොට දැරිය යුතු වේ.

හේ විපරීත වී නම් ප්‍රතිපත්ති තොමෝ ද විපරීත වන්නීය. සිඛන්තීය ශාසනික භික්ෂූන්ගේ පාරුපනය හා චීවරය සම්බන්ධ වරදවා ගත් සම්මතය සඳුව කරන්නට දේශනාර්ථ කථා ටීකා පාඨ හා සිංහල පත්පොත්වල වශවාසගම්ද තවත් වාදීන්ගේ වාදකථාද ග්‍රන්ථ බහුල වන බහුකථාද නිදර්ශනය කොට අයථාර්ථ පහළ කෙරෙමින් අර්ථකථා ටීකාගත සඳීඥ දෙක ප්‍රමාණය ව්‍යාජකථාවෙන්ම බැහැර කොට ශාසන විලෝමක විපරීත පාරුපනයක් හා චීවරයක් ගෙන ඒකාංශ පාරුපනය මිස උභයාංශ පාරුපනයෙක් නැතැයිද සියම් අමරපුර රාමඤ්ඤ යන නිකායවල සිටි භික්ෂුවක්හට ශ්‍රමණ ලිඞ්ගය (මහණ අවයවය) නැතැයිද කියමින් එතම බුදුපුතා තමා යයි හඳුන්වනු වස් විපරීත ඒකාංශ පාරුපන ප්‍රතිබිම්බයකින් පෙනී සිට අනනුකම්පසන පරවම්භන වාගාඩම්බර ගතී කොට කරුණු දක්වයි.

"අත්ථඤ්ඤෙව මෙ බ්‍රෑහි කිං කාහසි ව්‍යඤ්ජනං බහුං" යි මට අර්ථයක් ම කියනු මැනව. බොහෝවූ අක්ෂරපද කුමක් කෙරේද? අර්ථසිද්ධිය නොකෙරේය යන උපදේශය ඇතැම් නවීන පණ්ඩිතයන්ට අරුචි වුවත් පෙර වැඩසිටි ප්‍රවීණ පණ්ඩිවරයන්ට රුචි විය.

අප බුදුන් උස සම්බන්ධව දෙලොස්රියන් වුවද අටලොස් රියන් වුවද පස්විසි රියන් වුවද පනස්රියන් වුවද සියක්

රියන් වුවද අභිරුසියක් රියන් වුවද යන සිබකතීන්ගේ යට දක්වෙන වක්‍ය ඛණ්ඩයෙන් බොහෝ කොට කථාකිරීමෙහිත් අගරු අනාදර කථායෙහිත් තත්ත්වය අහන බලන කාහමිත් ඉතා සංවේග ජනක මය. මෙපමණක් නොව පොත මුළුල්ලම මෙබඳුවූම වාක්‍ය ඛණ්ඩයන්ගෙන් ගහණය. මෙසින් සිබ කතීගේ තුතුරුවත් විෂයෙහි පවත්නා නිපචච කාරයේ තරම ප්‍රකාශ වේ. ශාසනික භික්ෂූන්ගේ ප්‍රතිපත්ති විභාග කරන්නහු විසින් විනයපෙළ අටුවා ටීකාපාඨ ගෙන යථාර්ථයම දක්වා විභාග කටයුත්තේය. උක්තප්‍රකාර විභාගයෙහිද

"සුත්තමේව බලවතරං සුත්තං හි අප්පතිවත්තියං"යි සූත්‍රයම ඉතා බලවත්ය. බුදුන් විසින් වදාළ පෙළ වෙනස් කොට නොපැවැත්විය හැකි යයි විනය පිටකයෙහි වදාළ බැවින් යම් විවාදාධිකරණයක් විනිශ්චයකින් සම්ථයකට පමුණුවා ලීමේදී වදාළාවූ පෙළෙහි නොබැස ගන්නාවූ අත්ත නොමිති ආදි සියල්ල හළයුත්තේය. පෙළෙහි බැස සිටින සියල්ල ගතයුත්තේය. මේහිලා වාද නොකටයුත්තේය. බුඩ කාලයෙහි ශාසනික භික්ෂූන්ගේ ශ්‍රමණ විලාසය යම්සේද එපරිදි විනයාගත ක්‍රමයෙන් තම තමන්ට ප්‍රමාණවත් සිවුරු හැඳීමෙන් හා පෙරවීමෙන් ශ්‍රමණ ලිඞගය සිදු කෙරේ.

පෙළ අටුවා ටීකා හා සසඳා නුවණ මෙහෙයා බැලීමේදී පාරුපත සිබයෙහි දක්වෙන රූපසණ්ඨානයෙන් එකල පැවැති ශාසනික නියම ශ්‍රමණ වේශය නොදක්වෙන බව ඉඳුරාම දතහැක.

ඒ රූපසණ්ඨානයෙහි වමත යම්කිසි ආකාරයකින් වත් පාතට නෙළුව නොත් වරදවා තබනු ලැබූ තතිපොවේ ගැට වටුව ගිලිහීමෙන් සිවුරුකෙළ පාමුල් ඇදවැටෙනු ඒකාන්තය. එකල්හි පරිමණ්ඩලය යථාස්ථානයෙහි නොසිට වකාලිය නොහැකි පරිදි කත් එල්බීමෙන් පවතිනවා ඇත.

මේ කිම සත්‍ය බව අන්ධයන් හැර ඇස් ඇති කාහටත් ප්‍රත්‍යක්ෂකර ගැනීමට ඒ පාරුපත සිබයෙහි දක්වෙන රූපට

හන ප්‍රමාණ වේ මය. ඒ වෙශය ථෙරවාදයේ ආවාවූ නියම ශ්‍රමණ වෙශයයි සිඛකතීං කියයි. මේ සත්‍ය කිමක්ද? නැත. විමංසන බුඩිය ඇති කිසිවෙක් සත්‍යයයි නොපිළිගනියි. ථෙරවාදයේ ආයේ යයි අවිචාරිතව සිඛකතීං කියන ශ්‍රමණ වෙශය සිදු කරන්නට නම් වමන යවට නොහෙළෙන පරිදි යමකින් බැඳ සවිකර තිබිය යුතු වේ. එබඳු විකාර ශ්‍රමණ වෙශයක් ථෙරවාදයේ ආයේයයි කීම ථෙරවාදයට කරන බලවත් නින්දාවකි.

ඒ රූපසණ්ඨානය පන්දහසක් අවුරුදු කල් පවත්නා සම්බුද්ධ ශාසනයෙහි ශ්‍රමණ ලිඞ්ගය කල් නොයවා අතනධීන කරනු පිණිස පහළ කළ මහාර්බුදයකි. ශාසනාවචර කුල පුත්‍රයන්ගේ ඒකාංශ පාරුපනය උභයාංශ පාරුපනායයි ක්‍රම දෙකෙක් වෙති. ඔවුනතුරෙන් ඒකාංශ පාරුපනය අතැඹුලක්සේ දතයුතු සියල්ල දන වදාළාවූ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස් නුවර ඉසිපතනාරමයෙහි ප්‍රථම බොධිසමයෙහි මහණුවම් පිණිස වදාරණ ලද්දේය.

මහණුවම් කැමති කුලපුත්‍රයන් ඒ ඒ දිසාවලින් තමන් වහන්සේ කරු කැඳවාගෙන ඊමෙහි නොපහසු දන වදාරා මහණුවම් කරනු පිණිස භික්ෂූන්ට අනුදන්නා භාග්‍යවතුන් වහන්සේ මහාවග්ගපාලියෙහි මෙසේ වදාළසේක.

අනුජානාමි භික්ඛවෙ තුමෙහ ව'දානි තාසු තාසු දිසාසු තෙසු තෙසු ජනපදෙසු පබ්බාජෙථ උපසම්පාදෙථ; එවඤ්ච පන භික්ඛවෙ පබ්බාජෙතබ්බො, උපසම්පාදෙතබ්බො. පඨමං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදාපෙත්වා ඒකංසං උත්තරාසඞ්ගං කාරාපෙත්වා භික්ඛූනං පාදෙ වන්දාපෙත්වා උක්කුටිකං නිසීදාපෙත්වා අඤ්ජලිං පග්ගණ්හාපෙත්වා එවං වදෙහී'ති වත්තබ්බො. බුද්ධං සරණං ගච්ඡාමි -පෙ- අනුජානාමි භික්ඛවෙ ඉමෙහි තීහි සරණගමනෙහි පබ්බජ්ජං උපසම්පදන්ති.

භාවය: මහණෙනි දන් තෙපිම ඒ ඒ දිසාවන්හි ඒ ඒ දනව්හි (කුලපුත්‍රයන්) පැවිදි කරව්, උපසපන් කරව්.

මහණෙති මෙසේ පැවිදි කටයුතුය. උපසපන් කටයුතුය. පළමු කොට හිස කෙහෙ රැවුල් හරවා කාෂාය වස්ත්‍රය (අඳනය) අන්දවා කායබන්ධනය (පටිය) බන්දවා උත්තරාසඞ්ගය (තනිපොට සිවුර) ඒකාංශ කොට පාරුපනය කරවා, එහි රැස්වූ ස්ථවිර භික්ෂූන්ගේ දෙපා වන්දවා උක්කුටිකව හින්දවා අත මුදුන්හි ගන්වා, මෙසේ කියවයි කියයුත්තේය. කෙසේද යත්? බුද්ධං සරණං ගච්ඡාමි-පෙ-මහණෙති, මේ සරණ ගමන තුනෙන් මහණකමද උපසම්පදාවද අනුදනිමි යනුයි.

මෙහි කාසායානි වත්ථානි යන උපයෝග බහුවචනයෙන් ගෙන් පළමු සාඩියෙන් ලද සිවුරු පමණින් යුක්තවූ අඳනය සමග පටියත් උත්තරාසඞ්ගං යන්නෙන් තනිපොට සිවුරත් ගැනේ. එහෙයින් අඳනය අන්දවා පටිය බන්දවා තනිපොට සිවුර ඒකාංශ කොට පාරුපනය කරවා මහණකම කරණ සැටිම වදාළා මිස මෙපමණ දිග පළල සිවුරු ගෙන මහණකම කළයුත්තේ යයි නොවදාළසේක. මේ මහණ කමට මෙපමණ දිග පළල සිවුරු කටයුතු යයි නොවදාරන්නට හේතු කවරේද යත්? ප්‍රථම බොධිසමයෙහි එහිභික්ෂුභාවයෙන් පැවිදිවූ රහතන් වහන්සේලාට සාඩියෙන් ලැබූ අටපිරිකර විද්‍යමාන වීම හේතු විය. ඒ බැව් විනයාජී කථායෙහි මෙසේ දක්වා තිබේ.

භගවාති එහිභික්ඛුභාවාය උපනිස්සයසම්පන්නං පුග්ගලං දිස්වා රත්තපංසුකූලන්තරතො සුවණ්ණවණ්ණං දක්ඛිණ හත්ථං නීහරිත්වා බ්‍රහ්මඝොසං නිච්ඡාරෙන්තො එහි භික්ඛු. චර බ්‍රහ්මචරියං සම්මා දුක්ඛස්ස අන්තකිරියාය'ති වදති තස්ස සහෙව භගවතො වචනෙන ගිහි ලිඞ්ගං අන්තරධායති. පබ්බජ්ජා ච උපසම්පදා ච රූහති.

භාවය: භාග්‍යවතුන් වහන්සේ වනාහි එහිභික්ෂු වීමට බලවත් උපනිශ්‍රයයක් ඇති පුද්ගලයා දැක රක්තවර්ණ පාංශුකූල සිවුරු අබතුරෙන් සුවර්ණවර්ණ දක්ෂිණ ශ්‍රී හස්තය

බැහැර කොට අෂ්ටාඞ්ග සමුපෙත බ්‍රහ්මඝොෂය නික්මවමින් මහණ! මෙහි එව මනා කොට දුක් කෙළවර කරනු පිණිස ශාසන බ්‍රහ්මචර්‍ය්‍යයෙහි හැසිරෙවයි වදාරණසේක.

ඒ භාග්‍යවතුන් වහන්සේගේ වචනය සමගම ගිහි වෙශය අතුරුදහන් වේ. මහණකම්ද උපසම්පදාවද පහළ වේ යනුයි.

ඍද්ධිමය චීවර ප්‍රතිලාභය "ඉද්ධිජනති එහි භික්ඛුතං පුඤ්ඤිද්ධියා නිබ්බත්තචීවරං" ඍද්ධියෙන් ලද සිවුර නම් එහි භික්ෂු භාවයට පැමිණි භික්ෂූන්ට පූර්ව කුශලකර්මය ඍද්ධියෙන් උපන් සිවුරක් යයි විමති විනොදනී ටීකායෙහි විවරණය කර තිබේ.

මෙසේ ඍද්ධියෙන් ලද සිවුරු යටකී මහණකමේදී ප්‍රඥප්ති පැනවීමේන් නොවෙනස් කොට එපමණින් සිවුරු පිළියෙල කර ගැනීමට අවකාශ තබා මහණකම කරන සැටිම වදාළසේක.

තඳ තෙරුන්වහන්සේ සුගත චීවරප්‍රමාණ සිවුරක් කොට දැරීමෙහිදී සුගත් සිවුරට වැඩි තරම් හෝ සුගත් සිවුර තරම් හෝ සිවුරක් නොකට යුතුයයි වදාළ අවස්ථාවේදීද විකප්පනය කටයුතු පශ්චිම පරිච්ඡෙද ඌනක සිවුර පැනවීමෙහිදීද, වැසිසළු, දියඟළු, කඨ්පිළිසන්සළු පැනවීමෙහිදීද යටකී සිවුරු වෙනස් නොකළ සේක.

ප්‍රථම බොධියෙහි පටන් ශාසන පරම්පරාවේ අතින් අත අද දක්වා පැවත එන ඒ මේ සිවුරුවල ප්‍රමාණය උත්තරාසඞ්ගය හා සඞ්ඝාටිය දිග පස්රියන් සමාරයි. පළල සිව්රියන් සමාරයි. අන්තරවාසකය දිග පස්රියන් සමාරයි. පළල දෙරියන් සමාරයි මේ තුන් සිවුර විනයපාලිය සමග සංසන්දනය කොට බලන විනයවාදීන්හට විනයානුකූල බැව් වටහා ගැනීමට විනයාගත ක්‍රමයෙන් කරුණු දක්වන්නෙමු.

පාචිත්තිය පාලියෙහි

යො පන භික්ඛු සුගතචීවරප්පමාණං චීවරං කාරාපෙය්‍ය අතිරෙකං වා ඡෙදනකං පාචිත්තියං තත්‍රිදං සුගතස්ස සුගත

චීවරප්පමාණං දීඝසො නව විදත්ථියො සුගත විදත්ථියා තිරියං ඡ විදත්ථියො; ඉදං සුගතස්ස සුගතචීවරප්පමාණන්ති.

භාවය: යම් මහණෙක් තෙමේ සුගත් සිවුර පමණ සිවුරක් කරවා නම් හෝ කෙරේනම් හෝ සුගත් සිවුරට වැඩි තරම් සිවුරක් කරවා නම් හෝ කෙරේ නම් හෝ ඡේදනක පාචිත්තිය මොහුට වන්නේය.

ඒ ආපත්තිකර චීවරයෙහි මේ සුගතයන් වහන්සේගේ සුගත් සිවුරේ පමණ වේ. සුගත් වියතින් දිගින් නව වියත් වෙති. සරසින් සවියත් වෙති. මේ සුගතයන් වහන්සේගේ සුගත් සිවුරේ පමණ වේ යයි වදාළසේක.

මෙසින් සුගත් සිවුර පමණ සිවුරත් සුගත් සිවුරට වැඩි තරම් සිවුරත් කරන කරවන මහණහට ආපත්ති යයි වදාරා එම අනාපත්ති වාරයෙහි

අනාපත්ති ඌනකං කරොති අඤ්ඤෙන කතං පටිලභිත්වා ඡින්දිත්වා පරිභුඤ්ජති විතානං වා භූම්මත්ථරණං වා සාණිපාකාරං වා භිසිං වා බිම්බොහණං වා කරොති උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

භාවය: සුගත් සිවුරට අඩුව කෙරේද අනෙකකු විසින් කරන ලද සිවුරක් ලැබ සිඳ පරිභොග කෙරේද වියනක් හෝ බුමුතුරුණක් හෝ තිරපවුරක් හෝ බිස්සක් හෝ බිම්බොහනයක් හෝ කෙරේද ආපත්ති නොවේ. උම්මත්තකයාහටද, ආදිකම්මික නන්දතෙරුන් වහන්සේටද ආපත්ති නොවේ.

මෙසින් සුගත් සිවුරට අඩු පමණින් සිවුරු කරගැනීමට නියම කර වදාළ බැවින් යට දැක්වූ සිවුරු විනිශ්චය කරගැනීමට සුගත් වියතෙහි පමණ දතයුත්තේ වේ.

සමන්තපාසාදිකා නම් විනයාට්ඨකථායෙහි

සුගත විදත්ථි නාම ඉදානි මජ්ඣිමස්ස පුරිසස්ස තිස්සො විදත්ථියො යනු කියා තිබේ.

භාවය: දූන් හෙවත් මේ කාලයෙහි මධ්‍යම පුරුෂයෙකුගේ වියත් තුනක් සුගතයන් වහන්සේගේ එක්වියතකි යනුයි. මෙහි මධ්‍යමපුරුෂ වියත අඟල් නවයකි.

කඞ්ඛාවිතරණී ටීකායෙහි

එත්ථ සුගතඞ්ගුලෙනාති ඉදානි මජ්ඣිමස්ස පුරිසස්ස තීනි අඞ්ගුලානී ති.

භාවය: සුගත් අඟුලෙන්ය යන මෙහි (සුගත් අඟුල නම්) දූන් මධ්‍යම පුරුෂයෙකුගේ අඟල් තුනක්ය යනුයි.

මේ අටුවා ටීකා දෙකෙහි දක්වෙන වියත හා අඟුල වියතෙන් දක්වුවත් අඟුලෙන් දක්වුවත් එකම ගණනක් ලැබෙන හෙයින් මධ්‍යම පුරුෂයෙකුගේ වියතෙන් වියත් තුනක් සුගත් වියතෙහි පමණ වේ.

මධ්‍යම පුරුෂ රියන් තුනක් සුගත් රියනෙහි පමණ වේ.

සුගත් රියනය, වඩුරියනය, මධ්‍යමපුරුෂ රියනය, මිටි රියන යයි විනය පිටකයෙහි රියන් සතරක් දක්වේ.

ඒ සතරේ ප්‍රමාණය මෙසේ දක්වනු ලැබේ.

පරමාණු ප්‍රමාණ සතිසක් අණු එකයි. අණු සතිසක් තජ්ජාරි එකයි. තජ්ජාරි සතිසක් රථරේණු එකයි. රථරේණු සතිසක් ලික්ෂා එකයි. ලික්ෂා හතක් ඌකා එකයි. ඌකා හතක් ධාන්‍යමාස එකයි. ධාන්‍යමාස හතක් අඟල් එකයි.

'විදත්ථි ද්වාදසාඞ්ගුලෙ‍ා තද්වයංරතනං මතං' යනු ශාස්ත්‍රයෙහි කියනලද නයින් අඟල් දොළහක් වියත් එකයි. වියත් දෙකක් රියන් එකයි.

'සුගතඞ්ගුලෙන අඨඞ්ගුලං වඩ්ඪකීහත්ථප්පමාණං' යි විනයෙහි දක්වූ පරිදි සුගත් අඟුලෙන් අඟල් අටක් වඩු රියන් ප්‍රමාණ වේ. මධ්‍යම පුරුෂ රියන වඩුරියනට වඩා අඟල් හයක් ඌනා බැවි

'වඩ්ඪකීහත්ථෙන දියඩ්ඪො හත්ථො හොති' යි වඩු අතින් වියත් එකහමාරක් $1\frac{1}{2}$ක් මධ්‍යම පුරුෂ රියනෙහි පමණ දැක්වූ පරිදි අඟල් දහඅටක් වේ. මිටිරියන මධ්‍යම පුරුෂ රියනට වඩා ඌන බැවින් අඟල් දහසයක් වේ. වඩුරියනටත් මිටිරියනටත් අතරෙහිවූ රියන මධ්‍යම පුරුෂ රියන වේ.

'මජ්ඣෙ භවො මජ්ඣිමො, මජ්ඣිමො ච සො පුරිසො චෙති මජ්ඣිමපුරිසො. තස්ස රතනං මජ්ඣිමපුරිසරතනං, යන නිර්වචනයෙන් දැක්වෙන මධ්‍යම පුරුෂ රියනෙහි අඟල් දහඅටක් ලැබේ. ඒ අඟලෙන් අඟල් තුනක් සර්වඥයන් වහන්සේගේ රියනෙහි එක් අඟලක් වේ. ඒ අඟලෙන් අඟල් විසිහතක් සුගත් වියත් එකක් වේ. සුගත් වියත් දෙකක් සුගත් රියන බැව් දතයුතු. වඩුරියනටත් මිටිරියනටත් අතර මධ්‍යම පුරුෂරියනෙන් මැනගැනීමට:-

සුගතවිදත්ථි නාම ඉදානි මජ්ඣිමස්ස පුරිසස්ස තිස්සො විදත්ථියො, යනු සමන්ත පාසාදිකා අටුවායෙහි වදාළසේක. පෙළේ වදාළ සුගත් වියත අටුවා ටීකාවන්හි කියනලද ගණන්මයයි සැකහැර දතගණු පිණිස

භික්ඛුණී විභඞ්ගපාචිත්තිය පාලියෙහි වදාළ උදකසාටික යෙහි ප්‍රමාණය දක්වනු ලැබේ.

'උදකසාටිකං පන භික්ඛුණියා කාරයමානාය පමාණිකා කාරෙතබ්බා. තත්‍රිදං පමාණං දීඝසො චතස්සො විදත්ථියො සුගතවිදත්ථියා තිරියං වෙ විදත්ථියො, තං අතික්කාමෙන්තියා ඡෙදනකං පාචිත්තියං, යි.

භාවය: ජලසාටිකය කරවන භික්ෂුණිය විසින් පමණින් යුක්තව කරවිය යුත්තීය. එහි මේ ප්‍රමාණයයි. දිගින් සුගත් වියතෙන් සිව් වියතෙකි. සරසින් දෙවියතෙකි. ඒ නියමිත ගණන් ඉක්මවන භික්ෂුණියට ඡේදනකපාචිත්තියාපත්තිය වන්නීයයි වදාළසේක.

භික්ෂුණීයකට ජලස්නානය පිණිස වදාළ මේ ජලසාටිකය සුගත් වියතෙහි පමණ නොදත් සිඛකාමීහු කියන අනනතෝමතික ගණනින් ගත් කල්හි මධ්‍යම පුරුෂ රියනෙන් දිග දෙරියනක් හා පළල රියනක් වේ.

දෙරියනක් දිග රියනක් පළල කඩක් හැඳ භික්ෂුණියක් කෙසේ ජලස්නානය කරන්නීද?

දෙරියනක් දිග රියනක් පළල කඩ කැසබැඳගැණීමට නම් ප්‍රමාණය. ඉනවට දවටා ඇඳීමට ප්‍රමාණ නොවන්නේ මය. ශාසන සංවර විනය ඇති භික්ෂුණියකට තබා සාමාන්‍ය ස්ත්‍රියකටද විළිවසා හැඳ ජලස්නාය කට නොහැකිය.

ශාසනයෙන් පිටත් සාමාන්‍ය ස්ත්‍රීන් පවා සළු හඳින සැටි නොවගමුවේ ශ්‍රී රාහුල මාහිමියන් වහන්සේගේ කාව්‍යශේඛර යෙහි

නාඹිය නොදක් — වා
සළු හැඳ බොලව දක් — වා

යනාදියෙන් ප්‍රකාශ කර තිබේ, ශාසනයෙන් පිටත් ස්ත්‍රීන් සළු හඳින සැටි මෙසේ නම් දෙරියනක් දිග රියනක් පළල දියකඩක් හැඳ තනමත්තෙහි පටන් බොලට දක්වා හිරිකෝපීන පටිච්ඡාදනත්‍ථං, යනුවෙන් වදාළ ලජ්ජාස්ථාන යන් වසා ජලස්නානය කටනොහැකි බැවින් සිඛකාමීගේ සුගත් වියතෙහි පමණ දැනීම මෝහසහගතවේ.

'බුද්ධමතඤ්ඤූ අට්ඨකථාචරියා,' යි බුදුමතය දන්නෝ අටුවාචාර්‍ය්‍යයෝ යයි වදාළ බැවින් සිඛකාමී බුදුමතය නොදත් කෙනැ යි සැලකිසයුතු.

යට විස්තර කළ, අටුවා ටීකා දෙකේ දක්වෙන සුගත් වියත හා අඟුල පමණින් භික්ෂුණීයට ජලස්නානයට වදාළ ජලසාටිකය මැනගත් කල්හි දිග සරියනකි. පළල තුන් රියනකි. මේ බුදුන් වදාළ ජලසාටිකයෙහි පමණ යට දක් වෙන පමණම වේ. මෙය වුවමනා විවක තුඩාකර ගැණීමට

'අත්තපත්ති පමාණිකං කරෙන්ති ඌනකං කරෙන්ති, යි පමණින් ශුකතව කෙරේද. අඩුවෙන් කෙරේද ඇවැත් නැතැයි අත්තපත්තිවාරයෙහි සර්වඥයන් වහන්සේ විසින් ම වදාළ බැවින් සිඛතනී. මෝහයෙන් ගත් දෙරියනක් දිග රියනක් පළල කඩ තවත් කුඩා කර නැණීමට නොපිළිවන් බැවින් ම අටුවා ටීකාහි කියන ලද සුගත විදත් ප්‍රමාණය ප්‍රකෘති මධ්‍යම පුරුෂයෙකුගේ අතින් වියත් තුනහැයි නිසැකව දතයුත්තේය. මේ දක්වූ ගණනින් සුගත දෙහ ප්‍රමාණය තමන් වහන්සේගේ අතින් ව්‍යාම මාත්‍ර නමුත් අට්ඨකථායෙහි ආවා වූ

'අම්හාකං බුද්ධො චාදසහත්ථො,' යි අප බුදුහු දොළොස් රියන යයි වදාළ ගණන පෙළ හා සංසන්දනය කරනු පිණිස දීපංකර බුදුන් පටන් අප බුදුන් දක්වා වදාළා වූ බුදුවරයන් වහන්සේලාගේ උස ප්‍රමාණ අතුරෙන් මේ කප බුදු වූ කකුසඳ කොණාගමන, කාශ්‍යප යන තුන්බුදුවරයන් වහන්සේලාගේ උස ප්‍රමාණය බුද්ධවංස පාලියෙහි වදාළ පිළිවෙළින් දක්වන්නෙමු.

චත්තාළීසරතනං අච්චුග්ගතො මහාමුනි
කණකප්පභා නිච්ඡරති සමන්තා දසයොජනං,

භාවය: කකුසඳ මහ මුනිරජතෙමේ සතළිස් රියනක් උස් වී. හාත්පස දස යොදුනක් උන්වහන්සේ කෙරෙන් රන්වන් පැහැය නික්මෙයි.

'උච්චත්තෙන සො බුද්ධො තිංසහත්ථ සමුග්ගතො,
උක්කාමුඛෙ යථා කම්බු එවං රංසීහි මණ්ඩිතො'

භාවය: ඒ කොණාගමන බුදුරජතෙමේ උත්තත භාවයෙන් සමතිස් රියනක් මොනවට උඟතවී රන්කරු කෝවෙහි හුණුවන රන්තිකයෙක් මෙන් රශ්මීන් ගෙන් සමලඞ්කෘත වී.

"උච්චත්තෙන සො බුද්ධො වීසතිරතන මුග්ගතො
විජ්ජුලසීව ආකාසෙ චන්දොව ගහපූරිතො"

භාවය: ඒ කාශ්‍යප බුදුරජතෙමේ උන්නත භාවයෙන් සම්විසි රියනක් උද්ගත වී. විදුලිය මෙන්ද ආකාශයෙහි පරිවෙශ ග්‍රහ පරික්ෂිප්ත පූර්ණචන්ද්‍රයා මෙන්ද වී.

මෙසේ බුද්ධවංශ පාලියෙහි විදළා වූ බුදුවරයන් වහන්සේලාගේ උසප්‍රමාණය හා අට්ඨකථා ටීකාහි ආවා වූ අප බුදුරජාණන් වහන්සේගේ උසප්‍රමාණයත් එකිනෙක සංසන්දනය වන හෙයින්

"සුගත විදත්ථි නාම ඉදානි මජ්ඣිමස්ස පුරිසස්ස තිස්සො විදත්ථියො" යනුවෙන් සුගත් වියත නම් මෙකල්හි මධ්‍යම පුරුෂයාගේ වියත් තුනකැයි කීම බුද්ධඝෝෂාචාර්යපාදයන් වහන්සේගේ හෝ ථෙරවාදී මහාසුමම මහාපදුම මතය හෝ නොව බුදුරජාණන් වහන්සේ ම වදාළ මතය බැවින් සුගත චීවරයාගේ ප්‍රමාණය මධ්‍යම පුරුෂ රියනින් උස තෙළෙස් රියන් සමාරක්ද සරසින් නවරියනක්ද වේ.

යට දැක්වූ පාචිත්තිය පාලියෙහි හා එම අත්ථාපත්ති වාරයේත් සුගත් සිවුරට අඩුපමණින් සිවුරු කරගන්නට අනුදත් සේක. ඒ හැර මුට්ඨිත්තික මුට්ඨිපඤ්චක ඌනක සිවුරු හෝ දිග පළල අසුවල් ප්‍රමාණයෙන් කටයුතුයයි හෝ නොවදාළ සේක.

සිවුරු සම්බන්ධව දිග පළල අසුවල් ප්‍රමාණයෙන් කටයුතුයයි නොවදාරන්නට හේතු කවරේද?

ශාසනික භික්ෂූන්ගේ චීවරප්‍රතිලාභය ප්‍රඥප්ති පැනවීමෙන් ලද්දක් නොව සෘද්ධියෙන් ලද්දක් බැවිනි.

"ඉද්ධිජාති එහිභික්ඛුනං පුඤ්ඤිද්ධියා නිබ්බත්තචීවරං" යනුවෙන් ටීකාහි දැක්වෙන සෘද්ධියෙන් ලද්ද නම් එහිභික්ෂු භාවයට පැමිණි භික්ෂූන්ට පූර්වකුශලකර්මමය සෘද්ධියෙන් උපන් සිවුරක් යයි විවරණය කළහෙයින් ම සෘද්ධිමය සිවුරු ශාසනයෙහි මුල පටන් ම විද්‍යමානව එන බැවින් ම සිවුරු සම්බන්ධව අසුවල් පමණින් දිග පළල කටයුතුයයි නොවදාළ සේක. සුගත චීවරයාගේ පමණ දිගින් තෙළෙස්රියන් සමාරත් පළලින් නවරියනක් බැවින් ඊට අඩුව සිවුරු කරගන්නට වදාළ බැවින් සුගත් සිවුරට උනුව කරගැණීමම සිවුරේ ඉහල පරිච්ඡේදය වේ.

විකප්පනූපග පශ්චිම පරිච්ඡේද (ඌනක) සිවුර කවරේද? මහාවග්ග පාලියෙහි මෙසේ දක්වා තිබේ.

"අථ ඛො භික්ඛූනං එතදහොසි කිත්තකං පච්ඡිමන්නුඛො චීවරං විකප්පෙතබ්බන්ති භගවතො එතමත්ථං ආරොචෙසුං. අනුජානාමි භික්ඛවෙ ආයාමෙන අට්ඨඞ්ගුලං සුගතඞ්ගුලෙන චතුරඞ්ගුල විත්ථතං පච්ඡිමං චීවරං විකප්පෙතුං"යි.

භාවය: විකප්පනය කටයුතු පශ්චිම (ඌනක) චීවරය කවරේදැයි කුකුස් උපනේ යම්කලෙකද එකල්හි වනාහි විකප්පනය කටයුතු පශ්චිම පරිච්ඡේද සිවුර කොපමණ දැයි භික්ෂූන්ට මෙබඳු සිතක් වී. භගවත්හට මේ කරුණ සැළ කළෝය. මහණෙනි, සුගත් අඟුලෙන් අටඟුලක් දික් වූ සතරඟුලක් පළල් වූ පශ්චිම (ඌනක) චීවරය විකප්පනය කරන්නට අනුදනිමි යනුයි. සුගත් අඟුල මධ්‍යම පුරුෂ අඟුලෙන් තුනඟුලක් බව යට විස්තර විය. ඒ ගණනින් විකප්පනය කටයුතු පශ්චිම (ඌනක) චීවරය දිගින් සූවිසි අඟුලක් හා පළලින් දොළොස් අඟුලක් වේ. සුගත් සිවුරම උනුවත් පශ්චිම චීවරයට උත්කෘෂ්ටයත් අතර සිවුරු කර ගැනීමට අවසරය වදාළ බැවින් විකප්පනය කටයුතු පශ්චිම (ඌනක) චීවරයාගේ හිම්බැදීම පිණිස ථෙරවාදයෙහි මුෂ්ටිපඤ්චකය දක්වීය.

සුගත් සිවුරට වැඩිතරම් හෝ සුගත් සිවුර තරම් හෝ සිවුර අධිකයි. මුෂ්ටිපඤ්චකය පටන් සූවිසි අඟුල් දොළොස් අඟුල් සිවුරු ඌනකයි. අධික ඌනක චීවරයන් ගෙන් වෙනස් කොට සුගත් සිවුරට උනුවත් පශ්චිම (ඌනක) චීවරයට වැඩිවත් තම තමන් පමණින් සිවුරු කර ගැනීමෙන් අසුවල් ආපත්තියයි කියන්නට පිළිවන් විනයවාදී සම්මතෙක් බුද්ධශාසනයෙහි නැත.

සුගත් සිවුරටත් පශ්චිමාන්ත ඌනක මුෂ්ටිපඤ්චක චීවරයටත් අතර සාධියෙන් ලද සිවුරු පමණින් සිවුරු කර ගැනීම කැපයයි විනිශ්චය කරගැනීම පිණිස මහාපදෙසා ගතනය දක්වන්නෙමු. මහාවග්ග පාලියෙහි

"තෙන බො පන සමයෙන භික්ඛූනං කිස්මිඤ්චි කිස්මිඤ්චි ඨානෙ කුක්කුච්චං උප්පජ්ජති කිංනුඛො භගවතා අනුඤ්ඤාතං, කිං අනනුඤ්ඤාතන්ති භගවතො එතමත්ථං ආරොචෙසුං"

යම්භික්ඛවෙ මයා ඉදං නකප්පතීති අප්පටික්ඛිත්තං තං චෙ අකප්පියං අනුලොමෙති කප්පියං පටිබාහති තං වො නකප්පති"

"යම්භික්ඛවෙ මයා ඉදං නකප්පතීති අප්පටික්ඛිත්තං තං චෙ කප්පියං අනුලොමෙති, අකප්පියං පටිබාහති තං වො කප්පති.

යම්භික්ඛවෙ මයා ඉදං කප්පතීති අනනුඤ්ඤාතං තං චෙ අකප්පියං අනුලොමෙති කප්පියං පටිබාහති තං වො න කප්පතීති.

යම්භික්ඛවෙ මයා ඉදං කප්පතීති අනනුඤ්ඤාතං තං චෙ කප්පියං අනුලොමෙති අකප්පියං පටිබාහති තං වො කප්පතීති.

භාවය: කැප අකැප විභාගයෙහි කුකුස් උපනෝ යම් කලෙකද එකල්හි මනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් කුමක් අනුදන්නා ලද්දේද? කුමක් නො අනුදන්නා ලද්දේ දැයි භික්ෂූන්ට කිසියම් කිසියම් තැන කුකුස් උපදියි. භගවත් හට මේ කාරණ සැල කළෝය.

මහණෙනි, මා විසින් යමක් මෙය නොකැප යයි නො පිළිකෙවු කරණ ලද්දේද එය ඉදින් නොකැපයට අනුලොම් වේද කැපය වලකාද එය තොපට කැප නොවේ.

මහණෙනි, මා විසින් යමක් මෙය නොකැප යයි නො පිළිකෙවු කරණ ලද්දේවේද? එය ඉදින් කැපයට අනුලොම් වේද අකැපය වලකාද එය තොපට කැප වේ.

මහණෙනි, මා විසින් යමක් මෙය කැපයයි නොඅනු දන්නා ලද්දේ වේද එය ඉදින් අකැපයට අනුලොම්වේද කැපය වලකාද එය තොපට කැප නොවේ

මහණෙනි, මා විසින් යමක් මෙය කැපයයි නො අනු දන්නා ලද්දේ වේද එය ඉදින් කැපයට අනුලොම්වේද නො කැපය වලකාද එය තොපට කැපවෙයි යනුයි.

සඞ්ඝරත්නය ලොව පහළ වූ දා පටන් බුද්ධශාසනයෙහි පැවතෙන තුන්සිවුර සම්බන්ධව කැපයයි විනිශ්චය කර ගැනීමට යට දක් වූ සතරමහාපදෙසපාලියෙහි මහණෙනි, මා විසින් යමක් ප්‍රතික්ෂෙප නොකරණ ලදද එය ඉදින් කැප යට අනුලොම්වේද අකැපය වළකාද එය තොපට කැපයයි වදාළ නියමය ම ප්‍රමාණ වේ.

"යෙ භගවතා එවං වුත්තා චත්තාරො මහාපදෙසා සුත්තානුලොමං නාම,

භාග්‍යවතුන් වහන්සේ විසින් මේ ආකාරයෙන් වදාළාවූ යම් මහා ප්‍රදෙශ සතරක් වෙත්ද ඒ සූත්‍රානුලොම නම් වේ.

එහෙයින් සුගත් සිවුරට උනුව සිවුරු කරගැනීමට වදාළ සූත්‍රයෙහි හා උක්ත ප්‍රකාර සූත්‍රානුලොමයෙහිත් බහා මහ සිවුරම කැපය යි විනිශ්චය කටයුතු. තුන්සිවුරු වශයෙන් අදිටන් කටයුතු උත්කෘෂ්ඨාන්ත මහාචීවරය විනයාර්ථකථායෙහිද මෙසේ දක්වා තිබේ.

"තිචීවරං අධිට්ඨහන්තෙන රජිත්වා කප්පබින්දුං දත්වා පමාණයුත්තමෙව අධිට්ඨාතබ්බං තස්ස පමාණං සුගත චීවරතො ඌනකං වට්ටති"

භාවය: තුන්සිවුරු අදිටන් කරන්නාහු විසින් (කැප පඬු රඳන් කොට කප්බින්දු දී (පළමු සෑඩියෙන් ලද) පම ණින් යුක්තවූ ම සිවුර අදිටන් කටයුත්තේ වේ.

ඒ අදිටන් කටයුතු චීවරයාගේ ප්‍රමාණය සුගත් සිවුරට අඩු මහ සිවුර වටී යනුයි. 'මෙහි' එව, යන අවධාරණයෙන් අධික ඌනක සිවුරු ප්‍රතික්ෂෙප කෙරේ. මෙයින් සුගත් සිවුරට යට කෙළවරින් වදාළ මහ සිවුරම තුන්සිවුරු අධිෂ්ඨානයට සුදුසු බව දක්වා වදාළ සේක.

ථෙරවාදයෙහි පරික්ඛාර චොළවශයෙන් අධිෂ්ඨාන කට යුතු පශ්චිම චීවරය මෙසේ දක්වා තිබේ.

"ලාමකපරිච්ඡෙදෙන සඞ්ඝාටියා උත්තරාසඞ්ගස්ස ච දීඝතො මුට්ඨිපඤ්චකං තිරියං මුට්ඨිත්තිකප්පමාණං වට්ටති'

භාවය: ලාමක පරිච්ඡේදයෙන් හෙවත් පශ්චිම කොට සින් සඟලේද නාභිපොට සිවුරේද දිගින් මිට්පසකත් සරසින් මිට් තුනකත් පමණ පරික්ඛාරචොළ වශයෙන් අධිෂ්ඨානයට වටී, යනුයි.

යට පාඨයෙහි දක්වෙන මතය චතුර්විධ විනය අතුරෙන් මහාසුමත්ථෙරාදීන්ගේ අත්තනොමතය බව සැලකියයුතු.

"මුට්ඨිත්තික මුට්ඨිපඤ්චක ඌනක සිවුරක් බව විමති විනොදනී ටීකාවෙහි මෙසේ දක්වා තිබේ.

"අතිරෙකන්ති සුගත චීවරප්පමාණතො අධිකං ඌනකන්ති මුට්ඨිපඤ්චකාදිතො ඌනකං තෙන ච තෙචීවරාධිට්ඨානං නරුහති"

භාවය: අතිරේකය යනු කවරේද? සුගත් සිවුර තරම් හෝ සුගත් සිවුරට වැඩිතරම් හෝ සිවුර අධිකයි. මුට්ඨිපඤ්චකය පටන් ආදි ශබ්දයෙන් දක්වෙන සූවිසි අඟුල් දෙළොස් අඟුල් පශ්චිම චීවරය ඌනකයි. එහෙයින්ම ඒ අධික ඌනක සිවුරු අතුරෙහි තුන්සිවුරු අධිෂ්ඨානය නොනැඟෙයි කීයාය.

"ලාමක පරිච්ඡේදෙන" යනාදි පාඨයෙහි මුට්ඨිපඤ්චකං මුට්ඨිත්තිකං යනු නොදක්වා 'මුට්ඨිත්තිකප්පමාණං' යනුවෙන් පමාණ ශබ්දය යොදනු ලැබුයේ අනියමාර්ථයක් දක්වනු පිණිස ය. එහෙයින් ලාමක සිවුරෙහි මිටිපස පටන් විකප්පනූපග පශ්චිම චීවරය දක්වා වෙනස් ගණන්ද ගනු ලැබේ. හේතු කවරේද? පාචිත්තිය පාලියෙහි සුගත් සිවුරට උනුව සිවුරු කරගැනීමෙන් අනාපත්තියයි වදාළ නියමයත් සූවිසි අඟුල් දිග දෙළොස් අඟුල් පළල පශ්චිම චීවරය විකප්පනය කළයුතු චීවරයයි මහාවග්ගපාලියෙහි වදාළ නියමයත් අතර මුට්ඨිපඤ්චක මුට්ඨිත්තිකය දක්වූ හෙයින් පමාණ ශබ්දය යොදන ලද්දේ අනියමාර්ථයක්ම දක්වනු පිණිස ය. දෙකක් පමණ පසක් පමණ අටක් පමණ යනාදි ව්‍යවහාරය මෙනැයි දතයුතු.

මිට්රියන් පසින් හා මිට්රියන් තුනෙන් යුක්තවූ තුන් සිවුරු වශයෙන් අඳිවත් කටයුතු සිවුරක් ථෙරවාදයෙහි කිසි තැනෙක නොදක්වේ. මෑත ඇතිවූ ථෙරවාදයටත් සිවුරු සම්බන්ධව ප්‍රඥප්තිපැනවීමටත් කලින් ශාසනිකභික්ෂූන් විසින් අඳිවත් කටයුතු සිවුරු ලබන ලදහ.

භාග්‍යවතුන් වහන්සේ කපිලවස්තු නගරයට වැඩිය දෙවැනි දින එහිභික්ෂූන් විසිදහසක් පිරිවරා පිඬු පිණිස වැඩිය බවත් පසුදින නන්දස්ථවිරයන් වහන්සේ පැවිදිවූ බවත් විනයාට්ඨකථායෙහි දක්වේ.

නන්දස්ථෙර ශික්ෂාපදය පැනවීමට කලින් භික්ෂූන් පරිහරණය කළ සිවුරු වෙනස් කොට කිසියම් ප්‍රඥප්තියක් නොපැනවූ සේක.

නන්දතෙරුන් වහන්සේ සුගත් සිවුර පමණ සිවුරක් කරගැනීමේදී ශික්ෂාපනවන සර්වඥයන් වහන්සේ යට දක්වූ සිවුරු වෙනස් නොකොට සුගත් සිවුරට උනුව සිවුරු කර ගැනීම පිණිස චීවරයාගේ උත්කෘෂ්ටාන්තය පමණක් වදාළ සේක.

ඒ පෙළේ පශ්චිමාන්තය වෙන් නොකොට වදාළේ ප්‍රථම බොධි සමයෙහි ලද යටකී සිවුරු විද්‍යාමාන බැවිනි.

පෙළේ පශ්චිමාන්තය වෙන් නොකළ බව විනයාට්ඨකථායෙහි මෙසේ දක්වා තිබේ.

"තිචීවරස්සාපි සුගත චීවරප්පමාණතො ඌනකත්තං උක්කට්ඨප්පමාණමෙව පච්ඡිමං පනාසුතෙන වුත්තංනත්ථි"

භාවය: තිචීවරයාගේම සුගත් සිවුර පමණින් උනු බව උත්කෘෂ්ටප්‍රමාණයම වේ. නන්දස්ථෙර ශික්ෂාපදය වදාළ සූත්‍රයෙහි වෙන් කොට කියන ලද පශ්චිමචීවරයක් වනාහි පෙළෙහි වදාළේ නැත. යතුයි. සූත්‍රයෙහි වෙන් නො කළ පශ්චිම චීවරයක් ථෙරවාදයෙහි වෙන් නො කොට හැක්කේය.

අනාපත්තිවාරයෙහි පමණින් යුක්තව කෙරේද ආපත්ති නැතැයි වදාළ බැවින්ම සාඞ්ගයෙන් ලද සිවුරු පමණින් සිවුරුතර ගැනීම පෙළේ වදාළ නියමය වේ. අනාපත්ති වාරයෙහි උනුව කරගැනීමට වදාළේ සුගත් සිවුර සමසිවුරු කරගැනීමෙහි සෙතුසාතය පිණිසය.

අත්තනොමතිසංඛ්‍යාත ථෙරවාදයෙහි ආවාවූ මූසිපඬුවකය මූසිතත්තිකය පශ්චිමචීවරයෙහි කොටසබව ටීකාය විනිශ්චයයෙහිද දක්වේ.

ඒ මෙසේය.

පච්ඡිමන්තෙන සබ්බාපි-දීඝතොමූසිපඬුවකා
මූසිතත්තිකාව තිරියං-උත්තමන්තෙන සාපන
අන්‍යූනොචීවරූනාච-වට්ටතීතිපකාසිතා
ඉදමෙ උත්තරාසඞ්ග-පමාණං පරිදීපිතං

භාවය: පශ්චිම චීවරයාගේ කොටසෙන් සගල දිගින් මිටිරියන් පසද සරස මිටිරියන් තුනද වන්නේය.

විශෙෂයෙන් ඒ සගල ශාස්තෘන් වහන්සේගේ සිවුරට උනුවම චිටී යයි ප්‍රකාශකරනලදි. උත්තරාසඞ්ගයෙහි මේ පමණම ප්‍රකාශ කරන ලද්දේය. මෙහි "උත්තමන්තෙන සාපන" යන්නෙහි පන යන නිපාතයෙන් යටකී මහ සිවුරම විශෙෂයෙන් ප්‍රකාශ කෙරෙයි.

සාමාන්‍ය ශාස්ත්‍රතොන්‍යූනං විශෙෂො බලවාන්භවෙත්, යි

සාමාන්‍ය කථනයට වඩා විශෙෂ කථනය ඒකාන්තයෙන් බලවත් වන්නේ යයි ශාස්ත්‍රාකති හෙයින් යටකී මහසිවුරම අපෙක්ෂා කරන හෙයින් මූසිපඬුවකාදි සිවුරු සුපටිච්ඡන්න ශික්ෂාපදයෙහි වදාළ වැසිය යුතු තැන් වසාලීමට පමණ නොවන හෙයින් තුන් සිවුරු වශයෙන් අදිටන් නොකට යුතු. පරික්ඛාරචොල වශයෙන් අදිටන් කටයුතු වෙති.

බුදුරජහුගේ පිරිනිවීමෙන් පසු මෑතදී ලක්දිව වැඩ විසූ මහාසුමමතේරුදින්ගේ වාදයෙහි මුට්ඨිපඤ්චකය වදළේ විකප්පනුපගපශ්චිමචීවරයාගේ හිම් බැඳීම පිණිසය. එහෙයින් සුගත්සිවුරටත් මුට්ඨිපඤ්චකයටත් අතර ලොකු කුඩා සිවුරු කරගැනීමෙන් ආපත්ති නොවේ. සමන්තපාසාදිකා යෙහි ඒ ලොකු කුඩා සිවුරුවල අදිටන් නොබිඳෙනාකාරය මෙසේ දක්වා තිබේ.

“ඛුද්දකං චීවරං මහන්තං කරොති මහන්තංවා ඛුද්දකං කරොති අධිට්ඨානං නභිජ්ජති.

භාවය : කුඩා සිවුරක් හෝ මහත් කෙරේද මහසිවුරක් හෝ කුඩා කෙරේද අදිටන් නොබිඳේ.

සුගතචීවරයටත් මුට්ඨිපඤ්චකයටත් අතර සිවුරු ලොකු කුඩා කරගැනීමෙන් අදිටන් නොබිඳෙන බව යට දක්වූ පාඨයෙන් ප්‍රකාශ විය.

පශ්චිමප්‍රමාණ කුඩාසිවුරේ හා මහ සිවුරෙත් අදිටන් බිඳීම විනයාට්ඨකථායෙහි මෙසේ දක්වා තිබේ.

“පමාණ චීවරස්ස යත්ථ කත්ථචි ඡිද්දං අධිට්ඨානං භින්දති මහන්තස්ස පන පමාණතො බහි අධිට්ඨානං භින්දති”

භාවය : පශ්චිමප්‍රමාණ කුඩාචීවරයාගේ යම්කිසි තැනෙක වූ සිදුර අදිටන් බිඳියි. මහා චීවරයාගේ විශෙෂය නම් පශ්චිමප්‍රමාණචීවරයෙන් පිටත වූ සිදුර අදිටන් බිඳියි කියාය.

මහසිවුරේ තුවාව පවත් ජඞ්ඝෙය්‍ය ගීවෙය්‍ය දෙපස අඟල් (16½) දහසයාමාරක් අතරද ඉතිරි දෙපස අඟල් (9½) නවය හමාරක් අතරද වූ සිදුර අදිටන් බිඳියි. මුට්ඨිපඤ්චක පරික්ඛාරචොළයෙහි සියළුතැනවූ සිදුර අදිටන් බිඳියි.

මේ අධිෂ්ඨාන භෙදය නුවණින් විමසන විට බුද්ධ ශාසනයෙහි මුල පටන් මහ සිවුර මෙතෙක් පැවති එන බව හොඳින් වැටහෙනවා ඇත. සීමාසහිතව මහ සිවුරේ

සිඛවලඳ විනිසෙහිද මෙසේ කියා තිබේ.

"සඟල උතුරුසඟලට ද යටත් පිරිසෙයින් දිග මිටිපස් රියන් පුළුල මිටිතුන්රියන් උඩත් පිරිසෙයින් (අතර) බුදුන් සිවුරට උනුව වටී" යනුයි. මේ සිඛවලඳවිනිස පාඨයෙන් ප්‍රකාශවන්නේ මිටිපස්රියන් සිවුරටත් සුගත් සිවුරටත් අතර සිවුරු කටයුතු බවයි.

"ඌනකං පන වට්ටති" යනුවෙන් වදාළ නියමය පරිදි සුගත් සිවුරට උනුව සිවුරු කරගැනීමට ඉහළ පරිච්ඡේදයත් මුට්ඨිපඤ්චක පහළ පරිච්ඡේදයත් මේ පාඨයෙන් දැක්වෙන හෙයින් සදූන් පරපුරෙන් පැවතෙන දිගත පස්රියන් සමාරක් හා පුළුල සිවුරියන් සමාරක් ඇති මහ සිවුර නියම සිවුර බව නිසැකව දතයුතු.

සදූන් පරපුරෙන් පැවතෙන්නාවූ සුගත් සිවුරට යට කෙළවරින් කරගන්නට වදාළාවූ ඒ මහසිවුරම කැප සිවුර යයි ථෙරගාථාපෙළේ ද මෙසේ දක්වා තිබේ.

කප්පියං තං චෙ ඡාදෙති චීවරං ඉදමත්තිකං
අලංඵාසුවිහාරාය පහිතත්තස්ස භික්ඛුනො,

භාවය: කැපවූද කැපයට අනුලෝම්වූද කොමුපිළි ආදින් අතුරෙන් එක්තර යම් චීවරයෙක් වේද කැප වූම ඒ චීවරය (සුපටිච්ඡන්න ශික්ෂාපදයෙහි වදාළ) වැසිය යුතු තැන් ඉදින් වසාද ශාස්තෘන් වහන්සේ විසින් අනුදන්නා ලද ජිනිවූම සුගත්සිවුරට යටකෙළවරින් අනුදන්නා ලද පමණින් යුක්තවූ එබඳු සිවුරක් ඇත්තේවීනම් ඒසිවුර නිවන් කරා මෙහෙයන ලද සිත් ඇති මහණහට සැපවිහරණයට සුදුසු වේ. යනුයි.

යට ගාථායෙහිඅර්ථ තදට්ඨකථායෙහි මෙසේ විවරණය කර තිබේ.

සිඛවලඳ විනිසෙහිද මෙසේ කියා තිබේ.

"සගල උතුරාසඟලට ද යටත් පිරිසෙයින් දිග මිටිපස් රියන් පුළුල මිටිතුන්රියන් උඹත් පිරිසෙයින් (අතර) බුදුන් සිවුරට උනුව වටී" යනුයි. මේ සිඛවලඳවිනිස පාඨයෙන් ප්‍රකාශවන්නේ මිටිපස්රියන් සිවුරටත් සුගත් සිවුරටත් අතර සිවුරු කටයුතු බවයි.

"ඌනකං පන වට්ටති" යනුවෙන් වදාල නියමය පරිදි සුගත් සිවුරට උනුව සිවුරු කරගැනීමට ඉහළ පරිච්ඡේදයත් මුෂ්ටිපඤ්චක පහළ පරිච්ඡේදයත් මේ පාඨයෙන් දක්වන හෙයින් සසුන් පරපුරෙන් පැවතෙන දිගත පස්රියන් සමාරක් හා පුළුල සිවුරියන් සමාරක් ඇති මහ සිවුර නියම සිවුර බව නිසැකව දතයුතු.

සසුන් පරපුරෙන් පැවතෙන්නාවූ සුගත් සිවුරට යට කෙළවරින් කරගන්නට වදාළාවූ ඒ මහසිවුරම කැප සිවුර යයි ථෙරගාථාපෙළේ ද මෙසේ දක්වා තිබේ.

කප්පියං තං චෙ ඡාදෙති චීවරං ඉදමත්තිකං
අලංඵාසුවිහාරාය පහිතත්තස්ස භික්ඛුනො,

භාවය: කැපවූද කැපයට අනුලෝම්වූද කොමුපිළි ආදින් අතුරෙන් එක්තරා යම් චීවරයෙක් වේද කැප වූම ඒ චීවරය (සුපටිච්ඡන්න ශික්ෂාපදයෙහි වදාළ) වැසිය යුතු තැන් ඉදින් වසාද ශාස්තෘන් වහන්සේ විසින් අනුදන්නා ලද ජිනිවූම සුගත්සිවුරට යටකෙළවරින් අනුදන්නා ලද පමණින් යුක්තවූ එබඳු සිවුරක් ඇත්තේවීනම් ඒසිවුර නිවන් කරා මෙහෙයන ලද සිත් ඇති මහණහට සැපවිහරණයට සුදුසු වේ. යනුයි.

යට ගාථායෙහිඅර්ථ තදට්ඨකථායෙහි මෙසේ විවරණය කර තිබේ.

"කප්පියන්ති කප්පියකප්පියානුලොමෙසු ඛොමාදීසු අඤ්ඤතරන්ති අත්ථො. තං චෙ ඡාදෙතීති කප්පියචීවරං සමානං ඡාදෙතබ්බට්ඨානං ඡාදෙති චෙ සත්ථාරා අනුඤ්ඤාත ඡින්නකං සන්තං හෙට්ඨිමන්තෙන අනුඤ්ඤාතප්පමාණ යුත්තං චෙ හොතීති අත්ථො"

භාවය: කප්පිය යන්නෙහි කැප වූද කැපයට අනුලොම වූද කොමුපිළි ආදීන් අතුරෙන් යම් එක්තරා එකක්ය යන අර්ථයි. වසා යන්නෙහි කැප සිවුරක් වූම (සුපටිච්ඡන්න ශික්ෂාපදයෙහි වදාළ) වැසියයුතු තැන් ඉඳින් වසාද ශාස්තෲන් වහන්සේ විසින් අනුදන්නා ලද ඡින්නවූම සුගත් සිවුරට යට කෙළවරින් අනුදන්නා ලද පමණින් යුක්ත වූ සිවුරක් වීනම් ඒ සිවුරය යන අර්ථයි.

සම්බුද්ධශාසනයෙහි සඞ්ඝරත්නය ලොව පහළ වූ දා පටන් අතින් අත අවිච්ඡින්නව පැවත එන සුගත් සිවුරට යට කෙළවරින් කටයුතු යයි වදාළාවූ උත්කෘෂ්ට පරිච්ඡෙද මහ සිවුර මෙහි යට දක්වනු ලැබූ දෙශනාට්ඨකථා ටීකාපාඨයන් ගෙන් මොනවට ස්ඵුට විය.

ලංකා සියම් අමරපුර රාමඤ්ඤ රක්ඛඞ්ග යනාදි දෙශ දෙශාන්තරයන්හි සියළු භික්ෂූහු යටකී මහ සිවුරු මුල පටන් අද දක්වා පරිහරණය කෙරෙති. යථොක්ත මහා චීවරයම හියම විනයානුකූල බැව් මෙහි යට කරුණු විමසීමෙන් නිසැකව දතයුතුයි.

අධම්මවාදී අවිනයවාදී විතණ්ඩවාදී වජ්ජිපුත්තක මහාසඞ්ගීතිකාරකයන් මෙන් විභජ්ජවාදී කිසිවෙක් නාම ලිඞ්ග පරිෂ්කාරාදිය මේ දක්වා වෙනස් නො කළ බව සලකා නියම ශ්‍රමණ වෙශය රැක ගැනීමෙන් ප්‍රතිපත්ති පුරා නිවන් පසක් කටයුතු.

චීවරප්‍රමාණ පරිච්ඡෙද යයි.

තදනනතරව ඒකාංශපාරුපනය කටයුතු ආකාර දක්වනු ලැබේ.

ප්‍රථමබෝධිසමයෙහි එහිභික්ෂුභාවය ලැබූපරිදි ඒකාංශ පාරුපනය වදාරණ සම්බුදුයන් වහන්සේ.

"ඒකංසං උත්තරාසඞ්ගං කාරාපෙත්වා" යනු වදාළසේක. මේ මහවගපෙළේ නියමය පරිදි දෙකන් සම කොට ගත් උත්තරාසඞ්ගයෙන් බාහුව සමග වාමාංශකූටය වසා අකුලන ලද ගැටවටුව කරමතුයෙන් කිසිල්ල යටට ගෙන පෙරළා මිණිබඳත මත තබා අත්තලය විවෘත කරගැනීමත් බාහුව සමඟ දක්ෂිණාංශකූටය විවෘතකරගැනීමත් වදාළ අවසරයෙහි

"කාසායානිවත්ථානි අච්ඡාදපෙත්වා" යනු නියම හෙයින් අඳනය අඳින ආකාරය පළමු දතයුතු

මහාවග්ගපාලියෙහි

කාසායානිවත්ථානි අච්ඡාදපෙත්වා, යන පෙළේ නියමය පරිදි කාෂායවස්ත්‍රයන් හන්දවා උත්තරාසඞ්ගය (තනිපොට සිවුර) පෙරවිය යුතු යයි වදාළ පාඨයෙහි "කාසායානිවත්ථානි', යන උපයොග බහුවචන වදාළේ අඳනයත් පටියත් සඳහාය.

එබැවින් අඳනය හැඳ පටිය බැඳගැනීම කටයුතු නියමය වේ.

මෙහි සවිස්තර පරිමණ්ඩලනිවාසනය නො වදාළේ ප්‍රථමබෝධිසමයෙහි වැඩසිටි එහිභික්ෂු භාවය ලද භික්ෂූන් වහන්සේලාට මෙසේ අඳනය හැඳිය යුතුය. සිවුරු පෙරවිය යුතු යයි. යමෙකුගේ විධානයක් නැතිව පූර්ව ජන්මයෙහි රැස්කළ කුශලකර්ම බලයෙන් සෘද්ධියෙන් ලද මහණකම ප්‍රකටව පැවති බැවිනි. ෂඩ්වර්ගීයභික්ෂූන් එපරිදි අඳනය පරිමණ්ඩලව නොහැඳ කන් එල්වා අසංවරව හැඳීම නිමිති කොට ශික්ෂාපනවන සම්බුදුයන් වහන්සේ

"පරිමණ්ඩලං නිවාසෙස්සාමීති සික්ඛා කරණීයා" යන ප්‍රඥප්තිය වදාළසේක. මේ දේශනා පාඨයෙහි ඉති ශබ්දයෙන් නිදර්ශිත පරිමණ්ඩල නිවාසන ශික්ෂා තොමෝ

"සමාදාය සික්ඛති සික්ඛාපදෙසු" යනු වදාළ පරිදි මැනවින් පිළිගෙන හික්මිය යුතු. මේ පරිමණ්ඩල නිවාසනය ග්‍රාම ප්‍රවේශය හා භක්තාග්‍රවත වදාරණ බුදුරජාණන් වහන්සේ මහාවග්ග පාළියෙහි හා චූලවග්ග පාළියෙහි

"තිමණ්ඩලං පටිච්ඡාදෙන්තෙන පරිමණ්ඩලං නිවාසෙත්වා, කායබන්ධනං බන්ධිත්වා" යනු වදාළ සේක. මේ දේශනා පාඨයෙන් නැබ මඬල දෙදන මඬල යන තෙමඬුළු පිළිසන් කරන්නහු විසින් නාප්පස වට මඬුළු ඇතිව හඳනාය ඇඳ එමත පටිය බැඳගැනීම ප්‍රකාශිතය.

උක්තප්‍රකාර අඳනය හඳිනවිට ඇත්සොඬය. මත්ස්‍ය වාලධිය. සිව්කොණය. තල්වැටය. යනාදි ගිහියන් හඳිනා ඉළිවෙලින් වෙනස්ව අඳනා දෙපොට සමව අල්වා දකුණු පසින් වම්පසට පෙරළා නැවතත් දකුණු පසට ගෙනා පෙරළා වම්පස සාන්හසුන් නබා හැඳ ඊමත පටිය බැඳීමෙන් ඉදිරිපස හත් පොටකින් වසා උච්චාලිඞ්ගප්‍රාණකොපද්‍රව වලක්නා පරිදි හිරිකොපීන ප්‍රතිච්ඡාදනය කටයුතු.

එතයාජීකථායෙහි

"යොපන භික්ඛු සුක්ඛජඞ්ඝො වා මහාපිණ්ඩිකමංසො වා හොති තස්ස සාරුප්පත්ථාය අට්ඨඞ්ගුලාධිකමපි ඔතාරෙත්වා නිවාසෙතුං වට්ටති"

භාවය; විශේෂය නම් යම් මහණෙක් තෙම වියලි කෙණ්ඩා ඇත්තේ හෝ කෙණ්ඩයෙහි වැඩුනු මහා පිඩුමස් ඇතියේ හෝ (දීඝී ජඞ්ඝා ඇතියේ හෝ) වේද. එයට සරූප් බව පිණිස වඩු අඟුලෙන් අටඟුලට වඩා අඳනය පාතට බස්වා හඳින්ට වටි,

''ජඞ්ඝායචා පාදෙවා වණ්ණෝ හොති උක්ඛිපිත්වාවා ඔතාරෙත්වාවා නිවාසෙතුං වට්ටති''

භාවය : කෙණ්ඩයෙහි හෝ පාදමතුයෙහි හෝ ව්‍රණයක් වේද උක්තප්‍රකාරයට වඩා අඳනය ඔසවා හෝ යටට බස්වා හෝ හඳින්ට වටී, යනුයි.

සිඛවළඳවිනිසෙහි වඩුඅඟුලෙන් අටඟුලක් දනමඩලෙන් බඟා වමත්පස කන්හසුත් තබා එක් කෙළවරකින් නොඑල්වා අවට ඇත්තාකොට හැන්දයුත්තේය යනුයි. ප්‍රමාණය පලලින් අඩු අඳනය නාබියෙන් පාත් කොට හැඳීම වටී.

විනයවිනිශ්චයෙහි

යො අනාදරියෙනෙව පුරතොපච්ඡතො පිවා
ඔලම්බෙත්වා නිවාසෙය්‍ය තස්සෙවාපත්ති දුක්කටං

භාවය: යම් මහණෙක්තෙම ශිඤා අනාදරයෙන්ම පෙරපසින් හෝ පසු පසින් හෝ දෑලෙන් හෝ කන් එල්වා අඳනය ඇන්දේ වීනම් ඒ මහණහට දුක්කටාපත්ති වන්නීය. මේ අඳනය අඳින ආකාරයයි.

එකාංශ පාරුපනය

මහාවග්ගපාලියෙහි

1 ''එකංසං උත්තරාසඞ්ගං කාරාපෙත්වා'' යි උත්තරාසඞ්ගය එකාංශ කොට පාරුපනය කරවා යනු වදාළසේක.

ප්‍රථමබොධිසමයෙහි වදාල මේ එකාංශපාරුපනයට තනි පොට සිවුර මිස සඞ්ඝාටිය නියම නොකල හෙයින් උත්තරාසඞ්ගයෙන් හෙවත් තනිපොට සිවුරෙන් එකාංශපාරුපනය කටයුතුවේ. සගුණසඞ්ඝාටිය ග්‍රාමප්‍රවේශනාදියෙහි උභයාංශ පාරුපනයට පමණක් නියම කර තිබේ.

ප්‍රථමබොධිසමයෙහි වදාල එකාංශපාරුපනය ඒ විතිවූ පරිදි පාරුපනය නොකොට ෂඞ්වග්ගීය භික්ෂූනු පෙරපසින් හා පසුපසින් සිවුරුකන් එල්වමින් අසංවරව පාරුපනය කළෝය. මේ කරුණ භාග්‍යවතුන් වහන්සේට සැල කළාහුය. ඒ නිමිතිකොට ශිඤා පනවන භාග්‍යවතුන් වහන්සේ

පාචිත්තියපාළියෙහි

2. "පරිමණ්ඩලං පාරුපිස්සාමීති සික්ඛා කරණීයා"යි වදාලේය.

භාවය: කන් නොඑල්වා අවට ඇතිකොට පිරිමඬුළුව සිවුරු පොරවන්නෙමියි ශික්ෂාතොමෝ කටයුත්තීය යනුයි.

සමන්තපාසාදිකායෙහි

3. "එත්ථ පරිමණ්ඩලන්ති සමන්තතො මණ්ඩලං"යි මේ ශික්ෂායෙහි පරිමණ්ඩලය නම් හාත්පස මණ්ඩලය, යන අර්ථයි.

4. "ඉධවුත්තනයෙනෙව උභොකණ්ණෙ සමංකත්වා පාරුපනවත්තං පූරෙන්තෙන පරිමණ්ඩලං පාරුපිතබ්බං"යි

භාවය: මේ පරිමණ්ඩලශික්ෂායෙහි වදාළ ක්‍රමයෙන්ම සිවුරුදෙකන් සමකොට පොරවනාවත පුරන්නහුවිසින් හාත්පස වටමඬුළු ඇතිව පෙරවිය යුතුය යනුයි.

විනයවිනිශ්චය ටීකායෙහි

5. පාරුපනස්ස එකංසෙ කතස්ස පිට්ඨිපස්සෙ උදර පස්සෙ ච ඔලම්බමානෙ උභොකණ්ණෙ හත්ථිපිට්ඨෙ ඝණ්ඨාවිය සමංකත්වා"යි.

භාවය: එකාංශයෙහි කරණලද උත්තරාසඞ්ගයාගේ හෙවත් තනිපොට සිවුරේ පිටිපසෙහිද උදරපසෙහිද එල්බෙමින් එන කොන්දෙක ඇතුපිටලූ ඝණ්ඨාවන්මෙන් සමකොට යනුයි.

කඞ්ඛාවිතරණියෙහි

6. යථාච පාලිකාරකොසිකබු එකංසපාරුපනෙන පාරුතංවාමබාහුං විවරිත්වා චීවරං අංසකූටෙ ආරොපෙති එවං අපාරුපිත්වා සබ්බෙපි එතෙ අඤ්ඤෙච එවරූපෙ පාරුපනදොසෙ විවජ්ජෙත්වා, නිබ්බිකාරං පරිමණ්ඩලං පාරුපිතබ්බං"යි.

භාවය: පෙලකරණ හෙවත් භික්ෂුපටිපාටිය සදන මහණතෙම එකාංශපාරුපනයෙන් පොරවනලද වමත

විවෘතකර සිවුර අංශකූටයෙහි හෙවත් උරහිසමත තගා තබන්නේ යම්සේද එසේ නොපොරවා සියළුම මේ දෙෂද සෙසු මෙබඳු දෙෂද දුරුකොට විකාරනැතිව වටමඬුළු ඇතිව පෙරවිය යුත්තේය යනුයි.

7. බාහන්තනන්ති සුප්පමාණංචීවරං පාරුපන්තෙන සංහරිත්වා බාහාය උපරිඨපිතා උභොඅන්තා බකිමුඛා තිට්ඨන්ති තෙසං එතං නාමං.

භාවයෘ: බාහන්තය යනු මැනවින් ප්‍රමාණවත් සිවුර පොරවන්නහු විසින් පටිසංහරණය කොට හෙවත් ගැටවට්ටු කොට එම ගැටවට්ටුව වම් අතෙහි මිණිබන්ධමත තබනලද සිවුරුකොන්දෙක වකිමුඛව සිටිත්. ඒ අන්තදෙකට ඊයන නම වේ යනුයි.

සිඛවලඳවීතිසෙහි

8. අවට නැත්තා කොට සිවුරුපෙරවී නම් දුකුළා වේ. ඇතුපිට ලූ ගොටු සෙයින් දෙකෙළවරින් සමකොට වම්දතින් පත්පිටු බහාලා එක්කෙළවරකින් නො එල්වා අවට ඇති කොට පෙරවියයුත්තේය යනුයි.

මෙහි 1 පළවැනිපාඨයෙන් උත්තරාසඞ්ගයෙන් එකාංශ පෙරවීමත් 2. දෙවැනි පාඨයෙන් පරිමණ්ඩලව පෙරවීමත් 3. තුන්වැනි පාඨයෙන් හාත්පස මණ්ඩලාකාරයෙන් පෙර වීමත් 4. හතරවැනි පාඨයෙන් සිවුරේ දෙකන් සමකොට සම්පූර්ණ පාරුපන වත කටයුතු බවත්

5. පස්වැනිපාඨයෙන් එකාංශකොට පොරොවන සිවුරේ උදරපස පිටිපස ඇතුපිටලූ සණ්ඨා දෙකක් මෙන් සිවුරු කන් සමකිරීමත්

6. සයවැනි පාඨයෙන් එකාංශපාරුපනයෙන් පොරෝ වන සිවුර වම්උරය විවෘතකොට අංශකූටයෙහි සිවුරු කන් තබාහන්නා පාලිකාරකභික්ෂූන්මෙන් පාරුපනය නො කොට පරිමණ්ඩලව පෙරවීමත්

7. හත්වැනිපාඨයෙන් ගැටවටුව වම්කර මතුයෙහි බහා කිසිල්ල යටින් පෙරපසට ගෙන දකුණත විවෘත කොට මිණිබහණ මතුයෙහි තැබූ ගැටවටුමූනත වහිමූබව සිටින බවත්

8. අටවැනිපාඨයෙන් අපරිමණ්ඩලව සිවුරපෙරවී මෙන් දූකුලාවන බවත් ඇතුපිවලු සණ්ඨාවන් මෙන් දෙකන් සමකොට සිවුරැදෙපොට යටට හෙලා එක් කෙලවරකින් නොඑල්වා අවට ඇතිකොට පෙරවියයුතු බවත් ප්‍රකාශිතය.

යටදැක්වූ පාඨයන්ගේ අවයවාර්ථ පිඬුකරගත් කල්හි ඒකාංශපාරුපනය කටයුතුආකාරය මැනවින් දතහැක.

ඒ කෙසේදයත්? විධිවූපරිදි අඳනයහැඳ පටිය බැඳ උත්තරාසඞ්ගයයි කියනු ලබන තනිපොට සිවුර පොරොවන විට කොන්දෙක සමකොට එකට අල්වා ගැටවටුකර වාම ජත්‍රුව හෙවත් වම්උරය වසා ගැටවටුව කරමතුයෙහි බහා පිටිපසින් කිසිල්ලට ගෙන නැවතත් පෙරළා දකුණත සම්පූර්ණයෙන් විවෘතකර මිණිබහණ මත තැබීමෙන් ඒකාංශ පාරුපනයසිදුකෙරේ. උභයාංශපාරුපනයට වඩා මෙහි ඇති වෙනස සංඝාටිය නොගැනීමත් දකුණු උරය විවෘතකර ගැනීමත් ගණ්ඨිය පාසයෙහි අවුණා නොගැණීමත්වේ. පරිමණ්ඩලාදි අවශෙෂ විධි සියල්ල උභයාංශපාරුපනය හා සමවේ.

ඒකාංශපාරුපන පරිච්ඡේදයයි.

## ඉක්බිති උභයාංශ පාරුපනය කටයුතු ආකාරය දක්වනු ලැබේ.

---

සද්ධිවිහාරිකයාගේ මහා පැවැත්ම වදාරණ භාග්‍යවතුන් වහන්සේ චූලවග්ගපාලිවත්තක්ඛන්ධකයෙහි මෙසේ වදාළ සේක.

"සචෙ උපජ්ඣායො ගාමං පවිසිතුකාමො හොති නිවාසනං දාතබ්බං පටිනිවාසනං පටිග්ගහෙතබ්බං කායබන්ධනං දාතබ්බං සගුණං කත්වා සඞ්ඝාටියො දාතබ්බා. ධොවිත්වා පත්තො සඋදකො දාතබ්බො. සචෙ උපජ්ඣායො පච්ඡාසමණං ආකඞ්ඛති තිමණ්ඩලං පටිච්ඡාදෙන්තෙන පරිමණ්ඩලං නිවාසෙත්වා කායබන්ධනං බන්ධිත්වා සගුණං කත්වා සඞ්ඝාටියො පාරුපිත්වා ගණ්ඨිකං පටිමුඤ්චිත්වා ධොවිත්වා පත්තං ගහෙත්වා උපජ්ඣායස්ස පච්ඡාසමණෙන හොතබ්බං"ති

භාවය: උපාධ්‍යායයන්වහන්සේ ඇතුල්ගමට වඩිනු කැමතිවේනම් (චීවරවංශයෙහිතුබූ) අඳනය දියයුතු. හැඳසිටි අඳනය පිළිගෙන (චීවරවංශයෙහි) හෙළියුතු. කායබන්ධනය (පටිය) දියයුතු. එකට ගුණකොටගත් උත්තරාසඞ්ග සඞ්ඝාටි දෙක දියයුත්තාහ. ධොවනය කොට දියසමග පාත්‍රය දියයුත්තේය. උපාධ්‍යායයන් වහන්සේ පසුපස ගමන්කරණ මහණක් ඕනෑකෙරේ නම් තෙමඬුළු පිළියන් කරන්නහු විසින් පිරිමඬුළුව අඳනකන් නොඑල්වා අවට ඇතිකොට අඳනය හැඳ ඊමත පටිය බැඳ ගුණකොටගත් උත්තරාසඞ්ග සඞ්ඝාටි දෙක පිරිමඬුළුව අවට ඇතිකොට සිවුරුකන් නොඑල්වා ග්‍රීවය සමග උභයාංශය වසා හිසත් මිණිබහණෙන් යට අත්තලදෙකත් පාදෙකත් විවෘත කොට පොරවා ගණ්ඨිය මලපතෙහි හෙවත් පුඩුවෙහි අවුණා ධොවනය කොට පාත්‍රයගෙන උපාධ්‍යායයන්වහන්සේට නුදුරුව නොලන්ව පසු ගමන්කරණ මහණක් වියයුතු යනුයි.

මේ විනයදෙශනාපාඨයෙන් ගම්වදින උපාධ්‍යාය ස්ථවිරයන්සමග යන සද්ධිවිහාරිකයාවිසින් පිළිපැදියයුතු ක්‍රමයයි.

ඒ පිළිපැදීමේදී අඳනය හැඳ ඒ මතුයෙහි පටිය බැඳීමත් ගුණකොට එකටඅල්වාගත් ලැබූ තනිපොට සිවුර හෝ දෙපොට සිවුරත් ඇතුල්ගමට වදනා අවස්ථාව බැවින් දෙවුර වසා පොරෝවා ගණ්ඨිය මලපතෙහි හෙවත් පුඩුවෙහි අවුණා ගතයුතු බවත් විවාද රහිතව ප්‍රකාශවිය.

තවද කල්වේලා දැන පිඬු පිණිස ඇතුල්ගම් වදනා මහණහුවිසින් පිළිපැදියයුතු ක්‍රමය වදාරණ භාග්‍යවතුන් වහන්සේ චූලවග්ගපාළිවත්තක්ඛන්ධකයෙහි මෙසේ වදාළසේක.

“ඉදනි ගාමං පවිසිස්සාමීති තිමණ්ඩලං පටිච්ඡාදෙන්තෙන පරිමණ්ඩලං නිවාසෙත්වා කායබන්ධනං බන්ධිත්වා සගුණං කත්වා සඞ්ඝාටියො පාරුපිත්වා ගණ්ඨිකං පටිමුඤ්චිත්වා ධොවිත්වා පත්තං ගහෙත්වා සාධුකං අතරමානෙන ගාමො පවිසිතබ්බො සුපටිච්ඡන්නෙන අන්තරඝරෙ ගන්තබ්බං”

භාවය: දැන් ගම්වදින්නෙමැයි කල්දැන නැබ මඬල දෙදනමඬල යන තෙමඬුළු වසන්නහුවිසින් වටමඬල ඇති කොට අඳනය හැඳ ඒමත පටිය බැඳ එකට ගුණකොටගත් උත්තරාසඞ්ග සඞ්ඝාටිදෙක උභයාංශය වසා පොරෝවා ගණ්ඨිය මලපතෙහි හෙවත් පුඩුයෙහිඅවුණා ධෝවනය කොට පාත්‍රය ගෙන මැනවින් දියපිරූගැලක් පදවන්නාක් මෙන් යුහුසුළු නොව මිතගමණින් ගම්වැදිය යුතුයි. මොන වට පිළිසන් කරන්නහු විසින් හෙවත් ගලවළුයෙන් උඩ හිසත් මිණිබඳණෙන් යට අත්තලදෙකත් දණහි පිඬු මසෙන් යට පාදෙකත් විවෘතකොටනොහ සෙසු සිරුර වසන්නහුවිසින් ඇතුල්ඝරෙහි හෙවත් ඇතුල්ගම යායුතු යතුයි.

මේ විනයදේශනාපාළියෙන් කුමක්වදාළේදැයත්,

“පරිමණ්ඩලං නිවාසෙත්වා කායබන්ධනං බන්ධිත්වා,” යන්නෙන් පිරිමඬුළුව අඳනය හැඳ ඒ මතුයෙහි පටිය බැඳ ගැනීමත්

"සඞ්ඝාටියො පාරුපිත්වා ගණ්ඨිකං පටිමුඤ්චිත්වා" යන්නෙන් ගුණකල තනිපොට් දෙපොට සිවුරු දෙක දෙවුර වසා පොරෝවාගෙන ගණ්ඨිය පුඩුවෙහි අවුණා ගැනීමත්

"සුපටිච්ඡන්නෙන අන්තරඝරෙ ගන්තබ්බං" යන්නෙන් දෙවුර වසා පොරොවා සුපිළිසන්ව ඇතුල්ගම් වැදියයුතු බවත් මැනවින් වදාළසේක.

තවද සාරත්ථදීපනීවිනයටීකායෙහි ඇතුල්ගමට යනු සඳහා

"සුපටිච්ඡන්නසික්ඛාපදෙ වුත්තනයෙන සංඝාටිඤ්ච උත්තරාසඞ්ගඤ්ච එකතො කත්වා පාරුපන්තස්ස" යනු දක්වූ පරිදි සඟල සිවුරත් උත්තරාසඞ්ගයත් එකට ගුණකොට අල්වා පොරෝවත්ම නියමකර තිබේ, පටිය බැඳගැනීම අදනය ගිලිහී නොවැටෙනු පිණිසය. ජඞ්ඝාය පස ගණ්ඨිය අවුණා ගැනීම වාතමණ්ඩලිකායෙන් සඟළ ඉහළ නොනගනු පිණිසය. හුන්තැනින් අන්තැනට යනවිට සුපිළිසන්ව දෙවුර වසා පොරෝවාගෙන යාම ආර්යශිෂ්ටාචාරය පිණිසය. යම් දෙශනාපාඨයෙහි අර්ථ විනයාර්ථකථායෙහි මෙසේ දක්වේ.

"සුපටිච්ඡන්නො'ති" සුට්ඨු පටිච්ඡන්නො ගණ්ඨිකං පටිමුඤ්චිත්වා අනුවාතන්තෙන ගීවං පටිච්ඡාදෙත්වා උභො කණ්ණෙ සමං කත්වා, පටිසංහරිත්වා, යාව මණිබන්ධං පටිච්ඡාදෙත්වා අන්තරඝරෙ ගමිස්සාමීති අත්ථො. තථා අකත්වා පන ජත්තුං වා උරං වා විවරිත්වා ගච්ඡන්තස්ස දුක්කටං"

මේ පාඨයෙහි දෙශනාපෙළේ සඟල පොරෝවා ගණ්ඨිය අවුණාගැනීම කටයුතුයයි වදාළ බැවින්ද

"සුත්තමෙව බලවතරං" සූත්‍රයම අතිශයින් බලවත්යයි අටුවාහි දක්වූහෙයින්ද මෙහි පදයොජනාව මෙසේ කටයුතුයි.

"සුපටිච්ඡන්නොති, සුට්ඨු පටිච්ඡන්නො අනුවාතන්තෙන ගීවං පටිච්ඡාදෙත්වා උභො කණ්ණෙ සමං කත්වා පටිසංහරිත්වා

යාව මණිබන්ධං පටිච්ඡාදෙත්වා ගණ්ඨිකං පටිමුඤ්චිත්වා අන්තර ඝරෙ ගමිස්සාමීති අන්තො තථා අකත්වා පන ජත්තුං වා උරං වා විවරිත්වා ගච්ඡන්තස්ස දුක්කටං"

භාවය: "සුපටිච්ඡන්නො" මැනවින් පිළිසන් කරන ලද්දේය. යන අර්ථයි. තුවාවෙන් ග්‍රීවය හාත්පස වසා දෙකන් සමකොට අකුලා හෙවත් ගැටවටුකොට ගෙන මිණිබහණ යම්තාක්ද ඒතාක් වසා ගණ්ඨිය මලපතෙහි හෙවත් පුඩු වෙණි අවුණා ගෙන ඇතුල් සෙරෙහි හෙවත් ඇතුල්ගමට යන්නෙමියි අර්ථය වේ. එසේ නොකොට විශෙෂයෙන් දෙජත් හෙවත් අස්කුළු යයි කියනු ලබන උරහිස් දෙකද පපුවද විවෘත කොට ගම්වදින මහණහට දුක්කටාපත්තිවේ යනුයි.

මෙහි "ජත්තුංවා" යන එකවචන දැක්වූයේ ශ්‍රැයමානාර්ථයෙන් බහවර්ථය හැඟෙන නිසා වාක්‍යශ්ලිෂ්ටතාවය පිණිස ජත්තුං කියා එකවචන දැක්විය. මේයට පෞරාණිකාචාර්‍ය්‍යවරයෝ "දෙජත්" කියා අර්ථ විවරණය කළෝ

"ජත්තුම්පි උරම්පි" යනුවෙන් පාලියෙන් "දෙජත්" යයි අර්ථවිවරණය කළෝ මෙහි "අනුවාතන්තෙන" යන්නෙහි අන්තානුබද්ධය "සුතන්තං" යනාදි තන්හි මෙන් සවාර්ථයෙහි පවතින බැවින් තුවාවෙන් ග්‍රීවය වසනවා විනා තුවානන්තයෙන් වැසිය නොහැක. "ගීවාවෙඨන ඨානෙ" යන්නෙන් ග්‍රීවය වෙලන තැන යයි ප්‍රකාශවන බැවින් ග්‍රීවය වෙලන්ම තුවා අන්තයෙන් නොපිළිවන. මේ අටුවාගත අර්ථය "සාරාර්ථ දීපනී" විනයටීකායෙහි මෙසේ විවරණය කරතිබේ.

"සුපටිච්ඡන්නෙනාති තසීසංපාරුතෙන අන්තො ගණ්ඨිකං පටිමුඤ්චිත්වා අනුවාතන්තෙන ගීවං පටිච්ඡාදෙත්වා උභො කණ්ණෙ සමං කත්වා පටිසංහරිත්වා යාව මණිබන්ධං පටිච්ඡාදෙත්වා අන්තරඝරෙ ගන්තබ්බං"

මෙහිද "ගණ්ඨිකං පටිමුඤ්චිත්වා" යන්නෙහි පදයොජනාව යමදැක්වූ තයිනි.

භාවය: "සුපටිච්ඡන්නෙන" යන්නෙන් හිස සමග තොවසා පොරෝවන්නහු විසින්, යන අර්ථයි. වැලිකෙසේද යත්? "අනුවාතෙන ගීවං පටිච්ඡාදෙත්වා" යනු ටීකාහි කීනයින් හුවාවෙන් ග්‍රීවය වසා දෙකන් සමකොට අකුලා හෙවත් ගැටිවටුකොටගෙන මිණිබඳණ යම්තාක්ද ඒතාක් වසා ගෙණිය මලපතෙහි හෙවත් පුඩුවෙහි අවුණා ගෙන ඇතුල් ගමෙහි යායුත්තේ වේ. යනුයි. මේ ටීකාපාඨයෙන් විශෙෂයෙන් දක්වූයේ උභයාංශපාරුපනයේදී හිස විවෘත කරගැනීම පමණයි.

"විමති විනොදනී" විනය ටීකායෙහි මෙසේ විස්තරකර තිබේ.

"ගණ්ඨිකං පටිමුඤ්චිත්වාති ආදිනා වුත්තත්තා සංච්චව ගීවංමණිබන්ධංච අපටිච්ඡාදෙන්තස්ස ආපත්ති. එත්ථාපි පරිමණ්ඩලසික්ඛාපදස්ස සාධාරණත්තා ජාණුමණ්ඩලතො හෙට්ඨා චතුරඞ්ගුලමත්තං ඔතාරෙත්වා අනොලම්බෙත්වා පරිමණ්ඩලමෙව පාරුපිතබ්බං"

භාවය: "ගණ්ඨිකං පටිමුඤ්චිත්වා" යනු අටුවාහි මුලින් කියනලද බැවින් දූන දූත ග්‍රීවයත් මිණිබඳණත් පිළිසන් නොකරන මහණහට ආපත්තිවේ. මේ සුපටිච්ඡන්න උභයාංශ පාරුපනයෙහිද පරිමණ්ඩල ශික්ෂාපදය සාධාරණ බැවින් දණමඬලෙන් යට වඩුඅඟුලෙන් සිවුඅඟුලක් පමණ සඟල යටට බස්වා කන් නොඑල්වා පිරිමඬුඑවම පෙරවිය යුතුවේ යනුයි.

වාසොපගත මහණහට වීසීමෙහි ආපත්ති නොවන බව දක්වනු පිණිස විමතිවිනොදනී විනය ටීකායෙහි මෙසේ කියා තිබේ.

"විවරිත්වා නිසීදතොති විහාරෙ විය එකංස පාරුපනං සන්ධාය වුත්තං වාසත්ථාය උපගතස්සාති වාසාධිප්පායං. විනය ධම්මදෙසන පරිත්තභණනාදි අත්ථාය සුචිරම්පි නිසීදන්තෙන සබ්බං අන්තරඝරවත්තං පූරෙන්තෙනෙව නිසීදිතබ්බං

භාවය:- විහාරයෙහි මෙන් ඇතුල්ගම කය විවෘතකොට හිඳින වාසොපගත මහණහට ඇවැත් නැතැයි යනු එකාංශ පාරුපනය සඳහා කියනලද්දේ වේ. මින් විහාරයෙහි එකාංශපාරුපනයෙන් වසන බැව් ප්‍රකාශිතය.

ඇතුල්ගම විසීම පිණිස පැමිණි මහණහට යහි කියන ලද බැවින් විසීමේ අදහස හැර ධම්දෙශනා පිරිත් දෙශනා ආදිය පිණිස වැඩිකල් වේලාද හිඳිනමහණහු විසින් සියළුඇතුල්ගම වන පුරම්නම හිඳීයයුත්තේය. විනය විනිශචයෙහි.

1 ගණ්ඨිකං පටිමුඤ්චිත්වා–කත්වා කොණෙ උභො සමං
ඡාදෙත්වා මණිබන්ධං ච–ඝනතබ්බං ගීව මෙව ච

2 ගලවාටකතො උඩ්ඪං–සීසංච මණිබන්ධතො
කපෙළ් පිණ්ඩික මංසමහා–හෙඨා පාදෙ උභො පිච.

3 විවරිත්වාව සෙසං ච–ඡාදෙත්වා ව නිසීදති
හොති සො සුපටිච්ඡන්නො–දෙසො වාසූපගස්සනො

4 තථා අකත්වාහිකබ්බුස්ස–ජතනූනිපි උරම්පිච
විවරිත්වා යථා කාමං–ගච්ඡතො හොති දුක්කටං

භාවය:- පෙළේ වදළ පරිදි උත්තරාසඞ්ග සඞ්ඝාටි දෙක සමකොට ගැටවටුකර වම්ත්තරමතුයෙහි බහා කිසිල් ලෙන් යෙන මිණිබහණත් ග්‍රීවයත් වසා ගණ්ඨිය මලපතෙහි හෙවත් පුඩුවෙහි අමුණා ඇතුල්ගමව යායුත්තේය.

ගලවළයෙන් උඩහිසද මිණිබඳණෙන් යට අත්තල දෙකද දඟපිඬුමසෙන් යට පා දෙකද විවෘතකොට තබා ඉතිරි මුළු ශරීරයම වසාහිඳී නම් ඒ හිඳීම සුපටිච්ඡන්න උභයාංශ පාරුපනය වේ. ඇතුල්ගම විසීම පිණිස පැමිණි මහණහට උක්ත ප්‍රකාර වැසියයුතුතැන් විවෘතකොට හිඳීමෙහි ආපත්ති නොවේ.

එසේ වැසියයුතුතැන් නොවසා ඇස්කුළුදෙකත් පපුවත් විවෘතකොට ශික්ෂාඅනාදරයෙන් රිසිසේ ඇතුල් ගමට යන මහණහට දුක්කටවෙයි.

විනයවිනිශ්චය ටීකායෙහි

"උභොතොකණ්ණෙ සම්ඞ්ඝනන්ති සම්බන්ධො, ගීව මෙවච අනුවාතෙන ඡාදෙත්වාති යොජනා තථා අකත්වාති යථා වුත්ත විධානං අකත්වා ජත්තුම්පීති උභො අංසකූටානි උරම්පි වාති හදයම්පි විවරිත්වාති අප්පටිච්ඡාදෙත්වා යථා කාමන්ති ඉච්ඡානුරූපං ගච්ඡතොති එත්ථ අන්තරඝරෙති සෙසො අන්තරඝරං නාම ගාමො වා හොතු විහාරො වා පචිත්වා භුඤ්ජිත්වා ගිහීනං වසනට්ඨානං" යි

භාවය:- ග්‍රීවයම නුවාවෙන් වසාය යන පදයොජනාව කොන්දෙක සමකොටය යන්න හා සම්බන්ධ කටයුත්තේය. එසේ නොකොට යනු ඇතුල්ගමට වදනා මහණහට යම් යම් නියමයක් වදාළෝද ඒ වදාළ නියමය නොකොට ජත්‍රංව යයි කියන ලද අක්කුළු දෙකද පපුව යයි කියන ලද හෘදය විවෘතකොට යනු පිළිසන් නොකොටය. කැමති පරිද්දෙන් යනු රිසිසේය. යන්නාහට යනු මෙහි ඇතුල් ඝරෙහි යන ශේෂය සම්බන්ධ කටයුත්තේවේ. ඇතුල්ගම වනාහි ගම හෝ වේවා විහාරය හෝ වේවා උයා පිස ගිහියන් නා බී වසන තැන කියන ලද්දේ වේ යනුයි.

කායවිවෘතනොකොට සුප්‍රතිච්ඡන්නව ගම්වැදීමට වත්තක්ඛන්ධකයෙහි පනවාවදාළ මෙනියමටදූස්වෙන නියමය කඩකොට විහාරයෙහි එකාංශපාරූපනයෙන් සිවීවෙශයෙන් සවගමහණුන්ගේ ගම්වැදීම නිමිතිකොට සිකපද පනවන සර්වඥයන් වහන්සේ

පාචිත්තිය පාලියෙහි

තෙන පන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ තෙන ඛොපන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ කායං විවරිත්වා අන්තරඝරෙ ගච්ඡන්ති මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති කථංහි නාම සමණා සක්‍යපුත්තියා කායං විවරිත්වා අන්තරඝරෙ ගච්ඡන්ති සෙය්‍යථාපි ගිහී කාමභොගිනොති. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං

විපාචෙනතානං යෙතෙ භිකඛූ අපපිචඡා සනතුඨා ලජජිනො කුකකුචචකා සිකඛාකාමා තෙ උජඣායනති ඛීයනති විපාචෙනති. කථංහි නාම ඡබබගගියා භිකඛූ කායං විවරිතවා අනතරඝරෙ ගචඡනතීති අථ ඛො තෙ භිකඛූ භගවතො එතමතථං ආරොචෙසුං"

අථ ඛො භගවා එතසමිං නිදානෙ එතසමිං පකරණෙ ධමමිං කථං කතවා භිකඛුසඞඝං සනනිපාතාපෙතවා ඡබබගගියෙ භිකඛූ පටිපුචඡි. සචචං කිර තුමෙහ භිකඛවෙ කායං විවරිතවා අනතරඝරෙ ගචඡථාති. සචචං භගවා. විගරහි බුදෙධා භගවා අනනුචඡවිකං මොඝපුරිසා අනනුලොමිකං අපපතිරූපං අසසාමණකං අකපපියං අකරණීයං කථංහි නාම තුමෙහ මොඝ පුරිසා කායං විවරිතවා අනතරඝරෙ ගචඡිසසථාති. නෙතං මොඝ පුරිසා අපපසනනානං වා පසාදාය අථඛොතං මොඝපුරිසා අපපසනනානං චෙව අපපසාදාය පසනනානංච එකචචානං අඤඤථතතායාති අථ ඛො භගවා තෙ භිකඛූ අනෙකපරියායෙන විගරහිතවා දුබභරතාය දුපපොසතාය මහිචඡතාය අසනතුඨියා සඞගණිකාය. කොසජජසස අවණණං භාසිතවා අනෙකපරියායෙන සුභරතාය සුපොසතාය අපපිචඡසස සනතුඨසස සලෙලඛසස ධුතසස පාසාදිකසස අපචයසස විරියාරමභසස වණණං භාසිතවා භිකඛූනං තදනුචඡවිකං තදනුලොමිකං ධමමිංකථං කතවා භිකඛූ ආමනෙතසි.

තෙනහි භිකඛවෙ භිකඛූනං සිකඛාපදං පඤඤපෙසසාමි දසඅතථවසෙ පටිචච සංඝසුටඨුතාය සඞඝඵාසුතාය දුමමඞකූනං පුගගලානං නිගගහාය පෙසලානං භිකඛූනං ඵාසුවිහාරාය දිඨධමමිකානං ආසවානං සංවරාය සමපරායිකානං ආසවානං පටිඝාතාය අපපසනනානං පසාදාය පසනනානං භියොභාවාය සදධමමසසඨිතියා විනයානුගගහාය එවංච පන භිකඛවෙ ඉමං සිකඛාපදං උදදිසෙයයාථ"

18. "සුපටිචඡනෙනා අනතරඝරෙ ගමිසසාමීති සිකඛා
කරණීයා

14. "සුපටිච්ඡන්නො අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා"

භාවයඃ- සවගමහණෝ කය විවෘතකොට එකාංශ පාරුපනයෙන් ඇතුල්ගමට යම් කලෙක පිවිසියාහුද ඒ කාලයෙහි වනාහි පින්වත් බුදුරජතෙම සැවැත්නුවර සමීප යෙහි අනේපිඬුසිටුහුගේ දෙව්රම්වෙහෙරෙහි වැඩවසන සේක. ඒ කාලයෙහි සවගමහණෝ කයවිවෘතකොට හෙවත් "විහාරෙවිය :එකංසපාරුපනං" යනාදීන් දැක්වූ පරිදි විහාරයෙහි සිටි එකාංශපාරුපන වේශයෙන් ඇතුල් ගමට යෙත්. මිනුෂ්‍යයෝ අසංවරව යන ඒ සවගමහණුන් දැක වැසියයුතු තැන් නොවසා කය විවෘත කොටගෙන ගිහීකාමභොගීන්මෙන් ශාක්‍යපුත්‍රසවිඥායාගේ පුත්‍රවූශ්‍රමණ යෝ ඇතුල් ගමට කෙසේ නම් යන්නාහුදැයි අවමන්කොට දකිත්. ගර්හාකෙරෙත්. නුගුණපතුරුවත්. භික්ෂූහුතුමූ අවමන්කොට දක්නාවූ ගර්හාකරන්නා වූ නුගුණ පතුරු වන්නා වූ ඒ මනුෂ්‍යයන්ගේ කථාව ඇසුවාහුමය. අල්පෙච්ඡ වූ යථාලාභාදීන් සතුටුවන්නා වූ ආපත්තිව්‍යතික්‍රමයෙහි ලජ්ජා ඇත්තා වූ ත්‍රිවිධශික්ෂාව කැමැති වූ යම් ඒ මහණහු වෙත්ද ඒ ප්‍රියශීලී භික්ෂූහු සවගමහණෝ එකාංශපාරුපන යෙන් කය විවෘතකොට ඇතුල්ගමට කෙසේනම් යෙත්දැයි අවමන්කොට දකිත්. ගර්හා කෙරෙත්. නුගුණ පතුරුවත්. ඉක්බිති සිල්වත් ඒ භික්ෂූහු යට කී මේ කරුණ භාග්‍ය වතුන්වහන්සේට සැලකළෝය.

ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ මේ කරුණේදී මේ ප්‍රස්තාවේදී භික්ෂු සංඝයා රැස්කරවා මහණෙනි තෙපි කය විවෘත කොටගෙන ඇතුල්ගමට ගියහු සැබෑදැයි සවග මහණුන් පිළිවිසිසේක. පින්වතුන් වහන්ස! සැබෑය. මෝඝ පුරුෂයෙනි! ඒ ගමන ශාසනප්‍රතිපක්ෂය. අයෝග්‍යය. ශ්‍රමණයන්ට අයත් නොවේය. අකැප්ය. එහෙයින් ශ්‍රමණ යන්විසින් නොකටයුතුය. හිස් පුරුෂයෙනි! තෙපි කය විවෘතකරගෙන එකාංශපාරුපනයෙන් ඇතුල්ගමට කෙසේ නම් යන්නහුදැයි ඉතාගර්හාකළසේක. තුච්ඡ පුරුෂයෙනි!

මේ එකාංශපාරූපනයෙන් ගම්වැදීම අප්‍රසන්නයන්ගේ හෝ ප්‍රසාදය පිණිස නොපවතී, හිස් පුරුෂයෙනි! වැලි එක් කාරණයක් ඇත. එනම් අප්‍රසන්නයන්ගේ මත් බලවත් අප්‍රසාදය පිණිසද ප්‍රසන්න වූ ඇතැමුන්ගේත් අන්‍යථාත්වය පිණිසද පවතී.

ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ ඒ සවග මහණුන්ට නොයෙක් අයුරින් අතිශයින් ගර්හාකොට වදාරා රැකීම් දුෂ්කරත්වයාගේද පෝෂ්‍යකිරීම් දුෂ්කරත්වයාගේද මහෙච්ඡතාවයාගේද ලදදෙයින් සතුටු නොවීමගේද ගණසඞ්ගණිකාවගේද කුසීතභාවයාගේද නුගුණවදාරා නොඑක් ආකාරයෙන් රැකීම් සුකරත්වයාගේද පෝෂ්‍යකිරීම් සුකරත්වයගේද අල්පෙච්ඡභාවයාගේද ලදදෙයින් සතුටුවීමගේද කෙලශසංලිඛිතතාවගේද කෙලෙසුන් නසන පිළිවෙත යෙදෙන්නහුගේද පැහැදීම් එළවන්නහුගේද ප්‍රතිපත්තිපූජාවෙන් බුදුන් පුදන්නහුගේද ආරම්භධාතු නික්ඛමධාතු පරක්කමධාතු සඞ්ඛ්‍යාත වීර්‍ය්‍ය ඇත්තහුගේද අනුසස්වදාරා ඒ කරුණට ඊට අනුලෝම්වූ දැහැමි කථාවක්කොට නිමවා වදාරා භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක.

මහණෙනි! ඒකාරණ හේතුකොට කරුණු දසයක් පිණිස "සාධු සුඤ්ඤුභන්තෙ" යනාදි ක්‍රමයෙන් සවාමීන්වහන්ස! ඉතා යහපතැයි කියා සඞ්ඝයාට පිළිගැණීම පිණිස සඞ්ඝයාට ඵාසු පිණිස දුස්සීලමහණුන්ට නිග්‍රහ පිණිස ප්‍රියශීලි භික්ෂූන්ට සැප විහරණය පිණිස ඉහාත්මයෙහි ආශ්‍රවයන්ගේ සංවරය පිණිස පරලෙව්හි ආශ්‍රවයන් නැසීම පිණිස අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස ප්‍රසන්නයන්ගේ බොහෝවීම පිණිස ත්‍රිවිධ සද්ධර්මයාගේ පැවැත්ම පිණිස සිව්වැදෑරුම් විනයානුග්‍රහය පිණිස භික්ෂූන්ට ශික්ෂාකොටසක් පණවන්නෙමි.

මහණෙනි! මෙසේද වනාහි මා විසින් යථොක්තාකාරයෙන් ප්‍රාතිමෝක්ෂයෙහිලා වදාළාවූ අනුසස්ඇති සඞ්ඛලිත ඔඩ චක්‍රන්‍යායයෙන් පරිවාරයෙහිද ආවාවූ මේ ඇතුල්ගම්වදනා ශික්ෂාපදයද ඇතුල්ගම හිඳිනා ශික්ෂාපදයද උදෙසව්. පුහුණු

කරවි. දරවි. අනුත්මද උගත්වවි. උභයාංශපාරුපනයකොට මැනවින් පිළිසත්ව ඇතුල්ගමට යත්යෙමියි, යන ශික්ෂා තොමෝ කටයුත්තීය. මොනවට පිළිසත්ව ඇතුල්ගම හිඳින්නෙමියි යන ශික්ෂාතොමෝ කටයුත්තීය යනුයි. මෙම පරිච්ඡෙදයෙහි සුපටිච්ඡන්න උභයාංශපාරුපනය දක්වනු පිණිස පලමුදක්වනලද පාඨයෙන් උත්තරාසඞ්ගය හා සඟුණ කොට ගන්නාලද සඞ්ඝාටිය ගම්වදින මහණහු විසින් පෙර විය යුතු බවත් සගලපෝරොවා ගණ්ඨියඅවුණා ගැනීමත් ප්‍රකාශිතය.

ප්‍රථම බොධිසම්යෙහි මහණකම් කිරීම මහාවග්ගපාලි යෙහි "එකංසං උත්තරාසඞ්ගං කාරාපෙත්වා" යනුවෙන් තනි පොට සිවුර එකාංශකොට පාරුපනය කරවා මහණකම කිරීමේදී එකාංශපාරුපනයට සඞ්ඝාටියහි කියනලද දෙපොට සිවුර නියම නොකල බවත් සුපටිච්ඡන්නඋභයාංශපාරුපන යට පමණක් සඞ්ඝාටියනියමකල බවත් සඞ්ඝාටියේ ජඞ්ඝායපසගණ්ඨිය අවුණාගැනීමත් වදාලබැවින්ද දෙවෙනි පාඨයෙන් සුපටිච්ඡන්නඋභයාංශපාරුපනයෙන් ඇතුල් ගමට යායුතු බව විශෙෂයෙන් වදාලබැවින්ද තුනවෙනි පාඨයෙන් සුපටිච්ඡන්න උභයාංශපාරුපනයේදී ගෙලම්ඩල හාත්පස වැසියයුතුබවත් සිවුරුකන්දෙක සම්කොට අකුලා ගැටවවටුකර මිණිබඟණවසානැනීමත් අස්කූඑ දෙකත් පපු වත් වසානොනැනීමෙන් දුෂ්කටාපත්තිවනබව වදාලබැවින්ද. හතරවෙනිපාඨයෙන් නුවාවෙන් සම්පූර්ණ ග්‍රීවයවසානැනීම වදාලබැවින්ද පස්වෙනිපාඨයෙන් ග්‍රීවයත් මිණිබඟණත් නො වසන මහණහට ආපත්ති බවත් දනමණ්ඩලෙන් යටට වඩුඅඟු ලෙන් සිව්අඟුලක් සඞ්ඝාටිය යටට හෙළියයුතු බවත් ප්‍රකාශ වන හෙයින්ද හයවෙනිපාඨයෙන් එකාංශපාරුපනයෙන් විහාරයෙහි මෙන් ඇතුල්ගම නොහැසිරියයුතුබව ප්‍රකාශ වන හෙයින්ද සත්වෙනිගාථාවෙන් ග්‍රීවයත් මිණිබඟණත් වැසියයුතු බව ප්‍රකාශවනහෙයින්ද අටවෙනි නවවෙනිගාථා වලින් ගලවළුයෙන් උඩ හිසද මිණිබඟණෙන් යට අත්තල දෙකද දණපිඬුමසෙන් යට පාදෙකත් හැර අවශෙෂ මුළු ශරී

රය වසා නැනීම නියම කළබැවින්ද දසවෙනි ගාථාවෙන් මුළු ශරීරය වැසීමේදී සම්පූර්ණ ග්‍රීවයත් අංශකූටදෙකයයි කියන ලද උරහිස්දෙකත් පපුවත් වසා නොගෙන ඒකාංශපාරුපන යෙන් ඇතුල්ගමට යන මහණහට දුක්කටාපත්ති වදාළ බැවින්ද එකොළොස්වෙනිපාඨයෙන්ද නුවාවෙන් සම්පූර්ණ ග්‍රීවය වැසීමත් අස්කුළුදෙක උරහිස්දෙක ලැපැත්ත වසා නොගෙන හිතුමතේ යන මහණහට ආපත්තියයි දක්වූ හෙයින්ද දහතුන්වෙනි දහහතරවෙනි ශික්ෂාපදවලයෙහි සුප ටිච්ඡන්න උභයාංශපාරුපනයෙහි පැවතියයුතු පිළිවෙළද යමපාඨයන්හි ආචාවූ අදහස් හා පාචිත්තියපාලිය තේරුම් ගැණීමෙන් මැනවින් දතයුතු.

විශේෂයෙන්

පාචිත්තියපාලියෙහි ඒකාංශපාරුපනයෙන් උපලක්ෂිතව ගම්වැදුනු ෂඩ්වර්ගීය භික්ෂූන්ට මොඝපුරුෂවාදයෙන් සර්වඥ යන්වහන්සේවිසින් ගර්හාකළබවත් මනුෂ්‍යයන් විසින් ගර්හාතමක තුගුණ පැතිරෙව් බවත් සිල්වත් ප්‍රියශීලී භික්ෂූන් විසින් ගර්හාකළ බවත් ප්‍රකාශිතය.

දැනුදු ඒකාංශපාරුපනයෙන් ගම්වදින භික්ෂූන්ට යථොක්ත පාචිත්තියපාලියෙහි දක්වෙන ගර්හාදිය සාධා රණ බැවින් ගම්වදින අවස්ථාවේ තනිපොට සිවුර හා සඞ්ඝාටි යෙන් (සඟළසිවුරෙනුවාවෙන්) සම්පූර්ණ ග්‍රීවමණ්ඩලය වසා කන්දෙකසමකොට අකුලා හෙවත් ගැටවට්ටුකොට එම සිවුරු වැටිය වම්කරමතදමා කිසිල්ල යටින්ගෙන පෙරළා අත්තෙ විවෘතවන පරිදි මිණිබහණමත තැබියයුතු.

මෙසේ පෙරවීමේදී දණමඩලෙන් යටට වඩුඅඟුලෙන් සිව්අඟුලක් සිවුර බස්වා වටමඬුළු ඇතිකොට ග්‍රීවයෙන් උඩ හිසත් මිණිබහණෙන් යට අත්තලදෙකත් දණමඩලෙන් යට පාදෙකත් විවෘතකොට ගණ්ඩියපාසයෙහි අවුණාගෙන ගම්වැදීම සර්වඥයන්වහන්සේ විසින් වදාළ නියමය වේ.

සර්වඥයන් වහන්සේද ජීවමාන දවස සුපටිච්ඡන්න උභ යාංශපාරුපනයෙන්ම අවස්ථානුකූලව වැඩසිටිබව හා මහා විහාරීය සඞ්ඝයාවහන්සේගේ පැවැත්මත් මතුපහළවන මේ කරුණෙන් මැනවින් ඔප්පුවේ.

ශ්‍රී. බු. ව. 1463 දී පමණ ලඞ්කා රාජ්‍යශ්‍රීපදප්‍රාප්තව රජය කරවූ පර්‍ය්‍යාප්තියෙහි විශාරද බුද්ධිමත් කාශ්‍යප මහරජ තුමාණන් විසින් ලියන ලද අතිපුරාණ දම්පියාටුවා ගැටපද යෙහි සුපටිච්ඡන්නඋභයාංශපාරුපනය මෙසේ විවරණය කර තිබේ.

චීවරගබ්භතොහත්ථංපසාරෙත්වා සිවුරුගැබෙන් අත නෙරයි. අත්පහරයි. දෙඅත්වසා පොරොවුනබැවින් සිවුරු ගැබෙහි සැඟවුනු අත් එයින් නෙරයි. පහරයි. යූසේයි.

මේ කාශ්‍යපරජතුමා මහාවිහාරවංශීය මහාසඞ්ඝයා වෙතින් විනයසූත්‍රාභිධර්‍මය යන ත්‍රිපිටකය හොඳින් දත උගත් විශාරද පණ්ඩිතොත්තමයෙකි. සිංහල අටුවා ඇසුරු කොට ලියනලද මේ ගැටපදවිවරණයෙහි ශාසනපරම්පරාවේ උභයාංශපාරුපනය පැවැති බව

දෙඅත්වසා පොරවුන බැවින් සිවුරුගැබෙහි සැඟවුනු අත් එයින් නෙරයි පහරයි යන වාක්‍යඛණ්ඩයෙන් මැනවින් ප්‍රකාශිතය. සර්‍වඥයන් වහන්සේ ජීවමානව වැඩ වසන කල්හි උන්වහන්සේ හමුයෙහි, විශාලා මහ නුවර ත්‍රිවිධ භය සංසිඳවීම පිණිස අනඳහාමුදුරුවන්වහන්සේ සුපටිච්ඡන්නඋභයාංශපාරුපනයෙන් උපලක්ෂිතව ලිච්ඡවී රජ කුමාරවරුන් සමඟ ප්‍රාකාරතුන අතර ප්‍රදක්ෂිණා කරමින් පිරිත්දෙශනා කළබව
විමතිවිනොදනී ටීකාවෙහි මෙසේ දැක්වේ.

වෙසාලියං අනුපරියායිත්වා පරිත්තං කරොන්තෙනාපි ආනන්දත්ථෙරෙන සුපටිච්ඡන්නතාදිං අකොපෙන්තෙනෙව අප්පසද්දෙනෙව සික්ඛාපදෙ කතානති දට්ඨබ්බං

භාවය: විශාලාමහනුවර ප්‍රාකාරතුන අනුව ප්‍රදක්ෂිණා කොට පිරිත්දෙශනාකරන්නාවූම ආනන්දස්ථවිරයන් වහන්සේ විසින් සුපටිච්ඡන්නඋභයාංශපාරුපන භාවාදිය කොප්‍ය නොකරන්නනු විසින්ම ශික්ෂාපද නොපැනවූ කල්හි මත් කරන ලද්දේයයි දැක්කයුතු වේ. යනුයි.

මේ ටීකාපාඨයෙන් රත්නත්‍රය ලොවපහළවූද පටන් ගම් වැදීම් ආදියෙහි සුපටිච්ඡන්න උභයාංශපාරුපනය පැවැතිබව අනාවරණව ප්‍රකට විය.

එහෙයින් සැදැහැයෙන් පැවිදිවූ සියළුභික්ෂූන්විසින් උභයාංශපාරුපන අනවද්‍ය ශිෂ්ට ප්‍රතිපත්තියෙහි පිහිටා සසුන් වැඩ වඩා නිවන්පසක් කටයුතු.

උභයාංශපාරුපන පරිච්ඡේදයයි.

සකලලෝකානන්දකරසුගතතථාගතසම්බුද්ධයන්වහන්සේ ජීවමානව වැඩ වසනකල්හි ෂඩ්වර්ගීය භික්ෂූන් අපටිච්ඡන්නව එකාංශ පාරුපනයෙන් යුක්තව විහාරයෙහි සිටියාවූ වේශයෙන්ම ඇතුල් ගම්වැදීම නිමිති කොට පනවා වදාළාවූ විනයපිටකයෙහි භික්ෂුවිභඞ්ගයෙහි අයත් සූපටිච්ඡන්න උභයාංශපාරුපනය බුදුන්පිරිනිවිතැන් පටන් ජම්බුද්වීපයෙහි හා බුරුමලඞ්කාද්වීපයන්හි නොනස්වා පවත්වාගෙන ආවාවූ ථෙරපරම්පරාව හා සුපටිච්ඡන්නඋභයාංශපාරුපන ශාසනෙතිහාසය

සාසනවංසප්‍රදීපිකා නම්වූ බුරුමශාසනවංශයෙහි ආවාවූ පිළිවෙළින් දක්වනු ලැබේ.

ආදිතොපඨායථෙරපරම්පරාකථාවත්තබ්බා

සම්මාසම්බුද්ධස්සහි භගවතො සද්ධිවිහාරිකො උපාලිත්ථෙරො තස්ස සිස්සො දාසකත්ථෙරො තස්ස සිස්සො සොනකත්ථෙරො තස්ස සිස්සො සිග්ගවත්ථෙරො තස්ස සිස්සො චණ්ඩවජ්ජිත්ථෙරො තස්ස සිස්සො මොග්ගලිපුත්තතිස්සත්ථෙරො ඉධෙවං සීහලදීපෙ සාසනානුග්ගාහකා මහාමහින්දත්ථෙරතො ආගත සිස්සපරම්පරා බහු හොති. ගණනපථවීතිවත්තා. කථං? මහාමහින්දත්ථෙරස්ස සිස්සො අරිට්ඨොනාමථෙරො. තස්ස සිස්සො තිස්සදත්තො. තස්ස සිස්සො කාලසුමනො. තස්ස සිස්සො දීඝො. තස්ස සිස්සො දීඝසුමනො. තස්ස සිස්සො කාලසුමනො. තස්ස සිස්සො නාගො. තස්ස සිස්සො බුද්ධරක්ඛිතො. තස්ස සිස්සො තිස්සො. තස්ස සිස්සො දෙවො. තස්ස සිස්සො සුමනො. තස්ස සිස්සො චූළනාගො. තස්ස සිස්සො ධම්මපාලිතො. තස්ස සිස්සො ඛෙමො. තස්ස සිස්සො උපතිස්සො. තස්ස සිස්සො ඵුස්සදෙවො. තස්ස සිස්සො සුමනො තස්ස සිස්සො පුප්ඵනාමො. තස්ස සිස්සො මහාසිවො. තස්ස සිස්සො උපාලි. තස්ස සිස්සො මහානාගො. තස්ස සිස්සො අභයො. තස්ස සිස්සො තිස්සො. තස්ස සිස්සො පුප්ඵනාමො තස්ස සිස්සො චූළාභයො. තස්ස සිස්සො තිස්සො. තස්ස සිස්සො චූළදෙවො. තස්ස සිස්සො සිවො'ති.

භාවය: මුලපටන් හෙවත් බුදුන්පිරිනිවි තැන් පටන් කොට ස්ථවිර පරම්පරා තමා තොමෝ කියයුත්තීය. මොනවට චතුසසත්‍ය ධර්මයන් අවබොධකර වදළාවූ භාග්‍ය වතුන්වහන්සේගේම සද්ධිවිහාරිකවූ උපාලිස්ථවිරයන් වහන්සේද උන්වහන්සේගේ ශිෂ්‍යවූ දාසකස්ථවිරයන් වහන්සේද උන්වහන්සේගේ ශිෂ්‍යවූ සොනකස්ථවිරයන් වහන්සේද උන්වහන්සේගේ ශිෂ්‍යවූ සිග්ගවස්ථවිරයන් වහන්සේද උන්වහන්සේගේ ශිෂ්‍යවූ චණ්ඩවජ්ජිස්ථවිරයන්වහන්සේද උන්වහන්සේගේ ශිෂ්‍යවූ මොග්ගලීපුත්ත තිස්ස ස්ථවිරයන්වහන්සේද යන ස්ථවිරවරු ගම්වැදීමෙහි උභයාංශපාරුපනය නොනස්වා මහාසංගීතිකාරකයන් හා මිශ්‍රනොවූ මෙම ජම්බුද්වීපයෙහි වැඩසිටියෝයයි මෙසේ දතයුතු.

සිංහලද්වීපයෙහි ශාසනයට අනුග්‍රහකළාවූ මොග්ගලීපුත්ත තිස්සස්ථවිරයන්වහන්සේගේ ශිෂ්‍යවූ මහාමහීන්ද්‍ර ස්ථවිරයන් වහන්සේ කෙරෙන් පැවැත ආවාවූ ශිෂ්‍යපරම්පරා තොමෝ බොහෝ වන්නීය. ගණන්මග ඉක්මපැවතීය. ඒ කෙසේදයත්?

මහාමහීන්ද්‍ර ස්ථවිරයන් වහන්සේගේ ශිෂ්‍යතෙම අරිට්ඨ නම් ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යතෙම තිස්සදත්ත නම් ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යතෙම කාලසුමන නම් ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යතෙම දීඝ නම් ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යතෙම දීඝසුමන නම් ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යතෙම කාලසුමන නම් ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යතෙම නාග නම් ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යතෙම බුද්ධරක්ඛිත නම් ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යතෙම තිස්ස නම් ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යතෙම දෙව නම් ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යතෙම සුමන නම් ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යතෙම චූලනාග නම් ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යතෙම ධම්මපාලිත නම් ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යතෙම ඛෙම නම් ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යතෙම උපතිස්ස නම්

ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යතෙම ඵුස්සදෙව නම් ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යතෙම සුමන නම් ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යතෙම පුප්ඵ නම් ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යතෙම මහාසීව නම් ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යතෙම උපාලි නම් ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යතෙම මහානාග නම් ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යතෙම අභය නම් ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යතෙම තිස්ස නම් ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යතෙම පුප්ඵ නම් ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යතෙම චූලාභය නම් ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යතෙම තිස්ස නම් ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යතෙම චූලදෙව නම් ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යතෙම සීවනම් ස්ථවිරය. යන මේ ථෙර පරමපරාවඅතුරෙහි විනයට අග්‍රයයි එතදග්‍රපාලියෙහි ආවා වූ ප්‍රථම සඞ්ගායනාවෙහිවැඩසිටියා වූ උපාලි නම් මහතෙරුන් වහන්සේ පටන් කොට තුන්වෙනි සඞ්ගායනාවෙහි වැඩසිටිය මොග්ගලිපුත්තතිස්ස නම් මහතෙරුන්වහන්සේ දක්වා ජම්බුද්වීපයෙහි සම්බුද්ධශාසනය බබුළුවාගෙන ආවාවූ ථෙර පරමපරාව බව දතයුතු. මේ පරමපරාවේද ශම්වැදීමේදී උභයාංශපාරුපනය මිස එකාංශපාරුපනයක් නොපැවැත්තේය. පැවැති බවක් ශාසනවංශීය එතදග්‍රපාඨයක නො දක්වේ.

තුන්වෙනි සඞ්ගායනාවෙන් පසු බුද්ධවර්ෂ දෙසියතිස් හයේ (236) දී ලඞ්කාද්වීපයට වැඩ සම්බුද්ධශාසනය පිහිටුවා වදාළාවූ මහාමහින්දස්ථවිරප්‍රමුඛකොටඇති සීවස්ථවිරයන් වහන්සේ දක්වා ආවාවූ පරමපරාව මහාවිහාරවංශීය පරමපරාව බව දතයුතු.

මහාමහින්දථෙරශිෂ්‍යානුශිෂ්‍යපරමපරාවෙහි අඛණ්ඩව ආවාවූ මහාකාශ්‍යප ශාරීපුත්‍ර රාහුල ධර්මකීර්ති ආදී උතුමෝ ද මහාවිහාරපාරම්පරික උභයාංශවාදීඋත්තමයෝ වෙති.

"සීහලදීපෙ මහින්දථෙරාදීනං වංසභූතෙන මහාවිහාර වාසීනිකායෙන සද්ධිං නයො ගණා භිජ්ජිංසු. තත්‍ථ මහාවිහාර වාසී ගණොව ධම්මවාදී, සෙසා පන අධම්මවාදිනො තෙච

වෙ අධම්මවාදිනො ගණා භූතත්ථං පහාය අභූතත්ථෙන ධම්මං අගරුංකත්වා චරිංසු. සීහලදීපෙ අධම්මවාදිනො චෙපි අලජ්ජීනොගණා පරිමණ්ඩලසුපටිච්ඡන්නාදිසික්ඛාපදානි අනාදියිත්වා චරිංසු. තතො පට්ඨාය සාසනෙ එකච්චානං භික්ඛූනං නානප්පකාරවසෙන නිවාසනපාරුපනාදීනි දිස්සන්තීති වෙදිතබ්බං.”

භාවය: ලංකාද්වීපයෙහි මිහාමහින්ද්‍රස්ථවිරාදි රහතන් වහන්සේලාගේ වංශය වූ මහාවිහාරවාසී සඞ්ඝ සමූහයා සමග ගණ තුනක් හෙවත් කොටස් තුනක්ව බිඳුනාහුය. ඒ කොටස් තුන අතුරෙහි මහා විහාරවාසී සඞ්ඝසමූහයාම ධර්මවාදීවිය. සෙස්සෝ වනාහි හෙවත් දෙනිකාය භික්ෂු සඞ්ඝයෝ අධර්මවාදීහු වූහ. ඒ අධර්මවාදී දෙපක්ෂයෙහිවූ භික්ෂු සමූහයා ධර්මවිනයෙහි විද්‍යමානාර්ථය අත්හැර අවිද්‍යමානාර්ථ ගැනීමෙන් යුක්තව ධර්මවිනය ගරු නොකොට හැසුරුනාහුය. සිංහලද්වීපයෙහි අධර්මවාදී අලජ්ජීවූ දෙනිකායෝම පිරිමඬුළු හැඳීම් හා පෙරවීම්ද ගම්වැදීමෙහිදී සුපටිච්ඡන්න උභයාංශ පාරුපනාදිශික්ෂාපදයන්ද නොපිළිගෙන හිතුමතයේ හැසුරුනාහුය.

එතැන් පටන්කොට ලංකාශාසනයෙහි ඇතැම් භික්ෂූන්ගේ නොඑක් ප්‍රකාරවශයෙන් හැඳීම් පෙරවීම් ආදිය දක්නා ලැබෙත් යයි දතයුත්තේය.

යටකී පරිදි නිර්මලව පැවැති ලංකාශාසනයෙහි මහසෙන් රජු දවස අධර්මවාදී අවිනයවාදී අලජ්ජී නොහොත් තිස්තෙර නිසා ගම්වැදීමේ දී සුපටිච්ඡන්න උභයාංශපාරුපනය නොකොට දුප්පටිච්ඡන්න එකාංශපාරුපනය පහළවූ බවද එතැන් පටන් ඒ දුර්මතය පිළිගත් ඇතැම් භික්ෂූන් අසංවරව එකාංශපාරුපනයෙන් යුක්තව ගම්නියම්ගම්වල හැසිරෙන බව දක්නා ලැබේ.

දීපවංශයෙහිද මේ බැව් ප්‍රකාශකරණලදි.

“ඡබ්බග්ගියානං වත්ථුස්මිං දුන්නිවත්ථාදිකාරණං
අනුසඤ්ඤතන්ති දීපෙසුං අලජ්ජීපාපධම්මිනො”

භාවය: ෂඩ්වර්ගීය භික්ෂූන් සම්බන්ධ වස්තුවෙහි වරදවා හැදීමද (ග්‍රාමප්‍රවේශනාදීයෙහි) අඩක් විසා හෙවත් ඒකාංශකොට පෙරවීම බුදුන්වීසින් පනවනලද්දේ යයි මිහසෙන්රජදවස අලජ්ජීලාමක සවභාවඇති භික්ෂූහු ප්‍රකාශ කළාහුය. මෙසේ ලඬකාවීපයෙහි ගම්වැදීමෙහි ඒකාංශ පාරුපනය පහලවූ ආකාරය දතයුතු.

බුරුමරටට අත්‍යන්ත පරිසුද්ධ මහා විහාරවංශීය ශාසන පරම්පරාව පැමිණි ආකාරය සහ එහි උභයාංශපාරුපනය පැවැති සැටිත් මතු පහලවනකරුණු බැලීමෙන් දත යුතු

මෙහි යටදැක්වූ ශාරිපුත්‍රස්ථවිර ප්‍රමුඛ මහාසඞ්ඝයා වහන්සේගෙන් ශිෂ්‍ය පිරිස සමග බුරුමරටින් වැඩම වූ මහාස්වාමිස්ථවිරපාදයන්වහන්සේ උපසම්පදාව රැගෙන ගොස් එහි ශාසනයබැබලවූසේක. බුරුමරටට ගෙනගිය මහාවිහාරවංශික ඒ උපසම්පදාව හා ශිෂ්‍යානුශිෂ්‍යස්ථවිර පරම්පරාව මෙහි මතු පහළ වන කරුණුවලින් දතයුතු.

කලියුගෙ චතුවස්සාධිකෙ අඨසතෙ මහානරපතිනාම රාජා රතනාපුරනගරෙ රජ්ජංකාරෙසි. සො මහාරාජා ධූපාරාමං නාම චෙතියං කාරාපෙසි. තස්ස පන ආචරියො මහාසාමිථෙරො නාම. සොපන ථෙරො සීහලදීපං ගන්ත්වා සීහලින්දස්ස රඤ්ඤො ආචරියස්ස සාරිපුත්තථෙරස්ස සන්තිකෙ සික්ඛං ගහෙත්වා පච්චාගන්ත්වා ථෙරවංසිකොතිදළ්හබ්බා

භාවය: බුරුමරට බණ්ඩ කලියුගඅවසියකතරේ (801) දී මහානරපති නම් රජේක්තෙම බුරුමරට රතනාපුර නම් නුවරෙහි රාජ්‍යය කෙළේය. ඒ මහා නරපතිරජතෙම ධූපාරාම නම් චෛත්‍යයක් කරවී ඒ රජහට වනාහි මහාස්වාමි තෙරුන් වහන්සේ ආචාර්‍ය වූහ. ඒ මහා ස්වාමි තෙරුන්වහන්සේ වනාහි ලක්දිවට පැමිණ ලඞ්කාධීශ්වර මහාපරාක්‍රමබාහු රජහුගේ ආචාර්‍යවූ ද දිඹුලාගල අරණ්‍ය වාසී මහාකාශ්‍යපස්ථවිරයන් වහන්සේගේ අන්තෙවාසිකවූ ද ''මහාසාරත්ථදීපනී මූලසාරත්ථදීපනී පඤ්චිකාලංකාරාදී

ග්‍රන්ථ රූඪියක් කළාවූද මහා විහාරපරම්පරාව හා ජේතවන නිකාය අභයගිරි නිකාය යන නිකායත්‍රය එක් නිකායක් කොට ජේතවන අභයගිරි දෙකේ විපන්න භික්ෂූන් අස් කොට සමගියට ගතහැකි භික්ෂූන් එක්කොට ශාසනශුද්ධිය ඇති කිරීමට උපසම්පදා කළාවූද සාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ ප්‍රමුඛ සඞ්ඝයාගෙන් අධිශීල ශික්ෂා සංඛ්‍යාත උපසම්පදාව ගෙන පෙරළා වැඩියා වූ මහාවිහාරවංශිකස්ථවිරයන්වහන්සේ යයි දතයුතු.

ශාසනවංශයෙහි අවාවූ පිළිවෙළින් මුන්වහන්සේගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව මෙසේ දතයුතු.

මහාසාමිස්ථවිරයන් වහන්සේගේ ශිෂ්‍යතෙම අතුල වංස නම් ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යතෙම රතන රංසි නම්ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යතෙම අභිසඞ්ඛෙත නම් ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යතෙම තිපෙටකාලඞ්කාර නම් ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යතෙම මහාතිස්ස නම් ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යතෙම චන්ද නම් ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යතෙම ගුණසිරි නම් ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යතෙම කල්‍යාණධජ නම් ස්ථවිරය උන්වහන්සේගේ ශිෂ්‍යතෙම විතීය ගුණසිරි නම්ස්ථවිරය.

මේ පරපුරෙහි දසවැනි ගුණසිරි ස්ථවිරයන්වහන්සේගේ ශිෂ්‍යතෙම ඤාණාභිවංසධම්මසේනාපතිසඞ්ඝරාජ ස්ථවිරයන් වහන්සේය. අමරපුරයෙහි යඩ්කී සඞ්ඝපරම්පරාව ලඞ්කාද්වීපයෙහි සම්බුද්ධශාසනය පිහිටුවාවදාළාවූ මහාමගීන්ද ස්ථවිරාභිධානානුයාත නිකායාන්තර ලබ්ධියෙන් විනිර්මුක්ත මහාවිහාරවංශික පරම්පරාවබව දතයුතු. මේ පරම්පරාවේ ශම්වැදීමේදී සුපරිවජ්ජනා උභයාංශපාරුපනය මිස එකාංශ පාරුපනයක් පැවැත්වූබව කිසිම ශාසන වංශග්‍රන්ථයක නොදක්වේ.

රාමඤ්ඤදේශයෙහි විසූ ධම්මචෙතියරජතුමාගේ කාල යෙහි ලඞ්කාද්වීපයට පැමිණි ධම්මකිත්තිස්ථවිර ප්‍රමුඛ මහාවිහාර

වංශිය සඞ්ඝයාවහන්සේගෙන් නිර්මල ප්‍රව්‍රජ්‍යාපසම්පදාව රැගෙන ගිය මොග්ගල්ලානත්ථෙරාදි ස්ථවිර පරම්පරාව සැකෙවින් මෙසේ දතයුතු.

ලඞ්කාද්වීපයෙහි වැඩවිසූ මහාවිහාරවංශික ශ්‍රීරාහුල ස්ථවිරප්‍රමුඛ මහාසඞ්ඝයාවහන්සේගෙන් ලබනලද ප්‍රව්‍රජ්‍යාපසම්පදාව ඇති සුවණ්ණසොභන තෙරුන්වහන්සේ උපාධ්‍යාය ව මොග්ගල්ලානත්ථෙරාදි මහාසඞ්ඝයාවහන්සේගෙන් රාමඤ්ඤරට කල්‍යාණීසීමාවෙහි උපසම්පදාව ලැබූ මහායසස්ථවිරයන්වහන්සේගේ ශිෂ්‍ය සුජාතස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යවූ අතුලාධිපතිස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යවූ ඤාණාලංකාරස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යවූ අනන්තධජස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යවූ සාසනධජස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යවූ ධම්මකිත්ති ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යවූ ගුණාභිලංකාරස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යවූ සද්ධම්මසාමිස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යවූ කවින්දුකිසද්ධම්ම ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යවූ සීලාචාරාභිධජ ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යවූ ඤාණාලඞ්කාර ස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යවූ සිරිවංසධජස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යවූ කවින්දසාරධජස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යවූ ජොතිධජස්ථවිරය. උන්වහන්සේගේ ශිෂ්‍යවූ මෙධානන්දධජස්ථවිරය. යන මේ මහාවිහාර වංශිකස්ථවිරපරම්පරාව හංසාවතී මුත්තිම සුවණ්ණභූමි යන රාමඤ්ඤදේශයෙහි හා සුනාපරාන්තනම්වූ බුරුමරටෙහි ව්‍යාප්තව පැවැති බව

"ධම්මචෙතිය රඤ්ඤා කාරාපිතසාසනං සකලම්රම්මරණ්ණං බ්‍යාපෙත්වා ඔගාහෙත්වා තිට්ඨති."

යන කල්‍යාණීශිලාලිපියෙන්ද හොඳින් දතයුතු. මේ මහාවිහාරවංශිකපරම්පරාවෙහි ගම්වැදීමෙහිදී සුපටිච්ඡන්න උභයාංශපාරුපනය මිස එකාංශපාරුපනයක් පැවැති බව ශාසනවංශීය ඉතිහාස ග්‍රන්ථයෙක්හි නොදැක්වේ. තව දක්වනු ලැබූ අමරපුරයෙහි වැඩවිසූ ඤාණාභිවංශ සඞ්ඝරාජ පරම්පරාවෙන් හා හංසාවතියෙහි වැඩවිසූ මෙධානන්දධජ පරම්පරා

වෙන්ද අද ලංකාද්වීපයෙහි පවතින අමරපුරනිකාය ප්‍රභව වූ බැවින් ගම්වැදීමෙහි උභයාංශපාරුපනය සම්බන්ධව චෝදනා කරන්ටවත් අභූතයෙන් උපවාද කරන්ටවත් නොලබන බව දතයුතු.

ලඞ්කාද්වීපයෙහි උඩරට වැඩවිසූ බෝධිසත්වගුණෝපෙත ශික්ෂාකාමීශ්‍රද්ධාබුද්ධිසම්පන්න වැලිවිට පිණ්ඩපාතික ශ්‍රීසරණඞ්කරසඞ්ඝරාජමහාස්වාමිපාදයන්වහන්සේ පවත්වාගෙන ආවාවූ උභයාංශපාරුපනය සියම්මහනිකායේ අතිගරුමහානායකස්වාමිපාදයන්වහන්සේලාවිසින්ද උඩරට ගැටවටුවතමින් මේ මෑතක් වනතෙක් පැවැත්වූ බැව් රහස්‍යක් නොවේ.

මේ දක්වනුලැබූයේ බුරුමරට හා ලඞ්කාද්වීපයෙහි සුප පිවජ්ජන උභයාංශපාරුපනය පැවැති ආකාරයයි.

දඹදිව ශ්‍රීධර්මාශෝකරජතුමාගේ කාලයෙහි ඒ ඒ ප්‍රත්‍යන්ත රටවල ශාසනය පිහිටුවනුපිණිස පිටත් කළ භික්ෂූන් අතුරෙන් සුණාපරන්තසංඛ්‍යාත බුරුම් රටට වැඩියා වූ සෝණ උත්තර පරම්පරාව කාලාතික්‍රාන්ත වීමෙන් භින්න භින්නව විරූපපාරුපනාදිය උපදවාගෙන විවාද කළ බව ශාසනවංශ ප්‍රදීපිකා නම්වූ බුරුම ශාසනවංශයෙහි මෙසේ කියා තිබේ.

“සිරිමහාසීහසුරසුධම්මරඤ්ඤො කාලෙ පාරුපනභික්ඛූ නානා හුත්වා විරූපං ආපජ්ජිත්වා එකංසික ගණො නාමාති විසුං භිජ්ජි. යථා පන අයමලං අයතො උට්ඨිත්වා, විසදිසං හුත්වා විරුද්ධං හොති. එවං අත්තනො අත්තනො රුචිවසෙන චරිත්වා නිසීදිංසු තෙසු ද්වීසු ගණෙසු පාරුපන ගණෙ ථෙරා පාලිඅට්ඨකථා ටීකා ගන්ථන්තරෙසු වුත්තවචනං නිස්සාය තික්ඛක්ඛාහුත්වා නිද්දොසාව හුත්වා නිසීදිංසු එකංසික ගණෙ පන ථෙරා අත්තනොවාදෙ න පාලියං. නෙව අට්ඨකථාසු නෙව ටීකාසු නාපිගන්ථන්තරෙසු දිස්සතීති ඉම මත්ථං අජානන්තා ඉදමෙව සච්චන්ති මොඝමඤ්ඤන්ති.”

භාවය: බුරුමරට විසූ සිරිමහාසීහසුරසුධම්ම රජහුගේ කාලයෙහි දෙවුර වසා සිවුරු පොරොවන භික්ෂූනු වෙනස්

වෙනස්ව හෙවත් වෙන් වෙන්ව විකාර සවභාවයට පැමිණි ඒකාංසිකගණයා නමැයි. වෙන්ව බිඳුනේය. යම් සේ වනාහි යමල යතබයෙන් නැඟී විසදෘශව විරුද්ධවේද. එසේ තම තමන්ව කැමැති පරිද්දෙන් හැසිර හුන්නාහුය. ඒ ගණ දෙක අතුරෙහි උභයාංශපාරුපනගණයෙහි ස්ථවිරවරු පෙළ අටුවා ටීකා ග්‍රන්ථවිශෙෂයන්හි කියන ලද "සුප්පටිච්ඡන්නො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛාකරණීයා" යි වදාළ වචනය නිසා සැක නැත්තෝව නිර්දෝෂයෝවම වැඩ හුන්නාහුය. ඒකාංසිකගණයෙහි ස්ථවිරවරු තමන්ගේ වාදය පාළියෙහිත් නැත. අටුවාකථාහිත් නොමැත. ග්‍රන්ථාන්තරයන්හිත් නො දක්නා ලැබේය. යන මේ අර්ථය නොදන්නාහු මෙය ම සැබවයි සෙස්ස බොරු යයි හඟිත්ය යනුයි. මේ පාඨයෙහි දැක්වෙන ඒකාංශිකගණයා විනය පොත පත ඇසුරු නො කළ කප්පියා කප්පිය විචාරණ බුද්ධි රහිත අව්‍යක්ත පිරිසක් බව ප්‍රකාශවේ. විනය පිටකයෙහි සුප්පටිච්ඡන්න ශික්ෂාපදය කුමට වදාළේ දැයි ඒ පමණවත් නොදත් ඒකාංශිකගණයත් යථාර්ථය දත් උභයාංශිකගණයත් වෙන් වෙන්ව විසූහ.

කලියුගෙ අට්ඨතිංසාධිකෙ වස්සසතෙ සහස්සෙව සම්පත්තෙ තස්ස රඤ්ඤො පුත්තො මහාධම්මරාජාති නාමරාජා රජ්ජං කාරෙසි, -පෙ- තස්මිං ච කාලෙ නන්දමාලො නාම ථෙරො වලඹගනගරස්ස පුරත්ථිමදිසාභාගෙ විහාරෙ නිසීදිත්වා, බහුන්නං භික්ඛුසාමණෙරානං ගන්ථං වාචෙසි, සාමණෙරානං ගාමප්පවෙසනකාලෙ පාරුපනවත්තමෙව පූරෙත්වා පවිසිතබ්බං, ඒකංසිකවත්තං පන නෙව පාලියං. න අට්ඨකථායං. නච ටීකාසු නාපි ගන්ථන්තරෙසු දිස්සති. න ධම්මානුලොමන්ති ඔවාදං අභිණ්හං අදාසි. පාලි අට්ඨකථාදිසු ආගත විනිච්ඡයං දස්සෙත්වා එකම්පි ගන්ථං අකාසි. අථ ඒකංසිකගණිකා භික්ඛූ තං ගන්ථං රඤ්ඤො සන්තිකං පෙසෙසුං. දෙසා විතරණත්ථාය තස්මිං ච කාලෙ රාජා එවරූපං සුපිනං පස්සි -පෙ- පස්සිත්වා නන්දමාලත්ථෙරං පක්කොසාපෙත්වා රතනාපුර නගරස්ස ආසන්නට්ඨානෙ උදකකීළනත්ථාය කාරාපිතෙ

රාජගෙහෙ වසාපෙසි. අථ ථෙරො සාමණෙරානං ගාමප්පවෙසන කාලෙ පාරුපන වසෙන පවිසිතබ්බන්ති පාළි අට්ඨකථා ටීකා ගන්ථන්තරෙහි රාජානං සඤ්ඤාපෙසි. යථා මොග්ගලිපුත්තතිස්සත්ථෙරො සිරි ධම්මාසොක මහාරාජානං වදති. අථ රාජා පූරිත පාරමීපුඤ්ඤසම්භාරො මහාඤ්ඤො අඤ්ඤාසි. පාරුපනවාදෙයෙව අට්ඨකථා ටීකා ගන්ථන්තරෙසු ආගතො. එකංසිකවාදෙ පන තෙසු කත්ථචිපි අනාගතොති එවම්පි ඤත්වා රඤ්ඤො ගෙහෙ චොදකථෙරෙ සන්නිපාතාපෙත්වා අත්තනො අත්තනො වාදං කථාපෙසි.

අථෙකංසිකථෙරා එවමාහංසු. තුම්හාකං පාරුපනවාදෙ කත්ථ ආගතොති? තදා පාරුපනථෙරා පරිමණ්ඩලං නිවාසෙස්සාමීති ආදිනා නයෙන පාළි අට්ඨකථා ටීකා ගන්ථන්තරෙසු පාරුපනවාදෙ ආගතොති ආහංසු තතො, පච්ඡා පාරුපන ථෙරා එවමාහංසු. තුම්හාකං පන එකංසිකවාදෙ කත්ථ ආගතොති? තදා තෙ එකංසිකථෙරා අචාරසාරං පවිට්ඨකාලෙ විය රත්තිභාගෙ මහාවනම්හෙ ගමනකාලෙ විය ච හුත්වා කිඤ්චි වත්තුං න සක්කා. මුඛං නාම කථනත්ථාය භුඤ්ජනත්ථාය හොතීති වුත්තත්තා යං වා තං වා වදන්තාපි රාජානං ආරාධෙතුං නාසක්ඛිංසු. රාජා ච ථෙරං තිස්සාය විනය කොසල්ලතාය පාළියං ඊදිසො යෙව ආගතො. අට්ඨකථාදීසු ඊදිසොයෙවාති වත්වා තුම්හාකං එකංසිකවාදෙ පාළි අට්ඨකථා ටීකා ගන්ථන්තරෙසු න දිස්සති. එවම්පි සමානා අනවස්සං අකංසූති පුච්ඡි. අථ තෙ එකංසිකථෙරා චතුන්නෙව ගබ්භෙ සභණ්ඩනගහිත චොරා විය ච මනුස්සෙහි ගහිත කාකා විය ච කිඤ්චි වත්තුං අසක්කුණෙය්‍යතාය සබ්බදිසාසු ඔලොකෙත්වා, යෙව අම්හාකං චාරිත්තං පාළි ආදීසු න දිට්ඨපුබ්බං. අථ ඛො පන ආචරියපවෙණී වසෙනෙව චරිම්හාති වත්වා පරාජයං පත්වා පාරුපනපක්ඛෙයෙව පවිසිංසූති, රාජා ච ඉතො පට්ඨාය භික්ඛූ පාරුපනවත්තමෙව කාරාපෙතුං සාමණෙරානං ඔවදන්තූති රාජාණං ඨපෙසි.

භාවය: බුරුමරට ඛණ්ඩකාලියුග එක්දහස් එකසිය තිස් අට (1188) ට පැමිණි වර්ෂයෙහි ඒ රජුගේ නෙවත්

සිරි මහාසීහ සූර සුධම්මරජහුගේ පුත්‍රතෙම මහාධර්මරාජ
යන නමින් රාජ්‍යය කරවී. -පෙ- ඒ කාලයෙහි වනාහි නන්ද
මාල නම් තෙරුන්වහන්සේ ද වලඩගනුවරට පූර්වදිශා
භාගයෙහි විහාරයෙහි වැඩහිඳ බොහෝ භික්ෂු සාමණේර
යන්ට ග්‍රන්ථ ඉගැන්වීම කෙළේය. සාමණේරයන් ගම් වදින
කල්හි උභයාංශපාරුපනවතම සම්පූර්ණ කොට පිරිසිය යුතු
ය. ගම්වදින කල්හි එකාංසිකපාරුපනවත වනාහි පෙළෙහි
නොමැත්තේය. අටුවාකථායෙහි ද නැත. ටීකාවන්හි ද
නැත ග්‍රන්ථාන්තරයන්හි ද නොදක්නා ලැබේය. ධර්මයම
එතකද නොවේයයි තිතොර අවවාද දුන්නේය. පාරුපනය
සම්බන්ධව පෙළ අටුවා ටීකාදියෙහි ආවාවූ විනිශ්චය දක්වා
එක් ග්‍රන්ථයක් ද කෙළේය. එකල්හි එකාංසිකගණයෙහි
මහණහු ඒ ග්‍රන්ථය රජහු වෙත දෙස් පහළ කරනු පිණිස
යැවූහ. ඒ කාලයෙහි රජ තෙමේ මෙබඳු ස්වප්නයක් දුටුයේ
ය. -පෙ- දූත නන්දමාල තෙරුන් වහන්සේ කැඳවා රතනා
පුර නුවරට ආසන්නස්ථානයෙහි ජලක්‍රීඩාව පිණිස කරවන
ලද රජගෙහි වාසය කරවී. ඉක්බිති තෙරුන්වහන්සේ
සාමණේරයන් විසින් ගම්වදින කල්හි උභයාංශපාරුපනය
කිරීම වශයෙන්ම පිරිසිය යුතුයයි පෙළ අටුවා ටීකා ග්‍රන්ථ
වලින් රජහට අවබෝධ කරවී.

මොග්ගලිපුත්ත තිස්ස ස්ථවිරයන් වහන්සේ ශ්‍රීධර්මාශෝක
මහරජහට ධර්මවිනය යම්සේ අවබෝධ කෙළේ ද? එසේය.
එකල්හි පුරණලද පාරමීපුණ්‍යසම්භාරඇති මහනුවණ
ඇති රජතෙමේ පාරුපනයෙහි තත්ත්වය අවබෝධ කෙළේය.
උභයාංශපාරුපනවාදයම පෙළ අටුවා ටීකා ග්‍රන්ථාන්තර
යන්හි ආයේය. ගම්වැදීමේහිදී එකාංසිකපාරුපනවාදය
වනාහි ඒ කිසිතැනෙක්හිම නොආයේයයි මෙසේ දූත
රජගෙහි දෙපක්ෂයෙහි තෙරුන් රැස් කරවා තම තමන්ගේ
වාදය කරවී. එකල්හි එකාංසිකතෙරහු මෙසේ විචාලාහුය.
ඔබවහන්සේලාගේ උභයාංශපාරුපනවාදය කවර තැනෙක
ආයේ දැයි කීයාය. එකල්හි උභයාංශපාරුපනගණයෙහි
තෙරහු "පරිමණ්ඩලං නිවාසෙස්සාමි" යනුද සුපටිච්ඡන්නො

අනනාගතභවෙ ගමිස්සාමීති” යනාදීක්‍රමයෙන් පෙළ අටුවා ටීකා ග්‍රන්ථාන්තරයන්හි උභයාංශපාරුපනවාදය ආයේ යයි කීවාහුය. ඉන්පසුව උභයාංශපාරුපනගණයෙහි සථවිර වරු මෙසේ විචාළාහුය. නුඹවහන්සේලා ශ්වනාති ගම් වදින කල්හි එකාංශපාරුපනවාදය කවර තැනෙක්හි ආයේදැයි කියාය. එකල්හි එකංසිකගණයෙහි තෙරහු පිටවීමට දොරක් නැති ගෘහයට පැමිණි කලක් මෙන් ද රාත්‍රී කාලයෙහි ගනාදුරු වනමගෙහි යන කලක් මෙන් ද කිසිවක් කියන්ට නොහැකිවූහ. කට නම් කථාවටත් කෑමටත් වේ යයි කියනලද බැවින් කටට ආ ඒ යමක් කියමින් ද රජ්ජුරුවන් සතුටු කරන්ට නොහැකි වූහ. රජතෙමේ ද තන්‍දමාල තෙරුන් ආශ්‍රයකොට විනයපිටකයෙහි පටුන්තවය ඇති වූ බැවින් පෙළෙහි මෙසේම ආවේය. අභිකථාදියෙහි ද මෙසේ ආයේ යයි කියා නුඹවහන්සේලාගේ එකංසික පාරුපනවාදය පෙළ අටුවා ටීකා ග්‍රන්ථාන්තරයන්හි නො දක්නා ලැබේ. මෙසේත් ඇති කල්හි නොකටයුත්තක් කළාහු යයි මෙසේ විචාළේය. එකල්හි ඒ එකංසිකගණයෙහි තෙරහු සිව්රියන් වූම ශෝකය බඩු සහිතව අල්වා ගන්නා ලද සොරුන් මෙන්ද මිණිසුන්විසින් අල්වා ගන්නා ලද කවුඩන් මෙන්ද කිසිවක් කියන්ට නො හැකි වූ බැවින් සියළු දිසාවන්හි ඔවුනොවුන් බලාම අපගේ එකාංශචරිතය පෙළ අටුවාදියෙහි නොදක්ක විරිය.

එතකුදු වුවත් ගුරුවරයන්ගේ ප්‍රවේණිය වශයෙන්ම හැසුරුනෙමුයි කියා එකාංශපාරුපනවාදයෙන් පරාජයට පැමිණ උභයාංශපාරුපනපක්ෂයටම ඇතුල්වූහයි දතයුතු. රජතෙමේද මෙතැන් පටන් භික්ෂූහු උභයාංශපාරුපනවනම කරන්ට හෙරණපැවිද්දන්ට අවවාදකරත්වයි රාජාඥ පිහිට වී.

මෙසේ යට දක්වනු ලැබූ පරිදි බුරුමරටෙහි හා ලංකා ද්වීපයෙහි ගම්වැදීමේදී පැවැති එකාංශපාරුපනය වලක්වා සියළු නිකායවල ගම්වදිනඅවස්ථාවෙහි උභයාංශපාරු පනය පවත්වන්නේ වීනමුත් සියම් මහනිකායයෙහි

කොටසක පමණක් එකාංශපාරුපනයෙන් ගම්වදින බැව් දක්නා ලැබේ.

ප්‍රඥප්තියක් කඩකොට පවත්වන මේ ශාසන විලෝමක ප්‍රතිපත්තිය ශ්‍රද්ධාවෙන් පැවිදිවූ භික්ෂූන්විසින් නොකටයුතු බැව් මෙහි කරුණු විමසීමෙන් දතයුතු. ග්‍රාමප්‍රවෙශනාදියෙහි උභයාංශපාරුපනවතම සම්පූර්ණකිරීමෙන් ප්‍රතිපත්ති පූජාවෙන් බුදුන් පුදා නිවන් පසක් කටයුතු,

උභයාංශපාරුපනශාසනෙ තිභාග පරිච්ඡෙදයයි.

---

පාරුපනාදිසික්ඛාය-දුරුත්ත විනයක්කමං
විභාවෙත්වාත්‍රවක්ඛාමි-සවුත්තර විනිච්ඡයං

පාරුපනසිඛයෙහි වරදවා කියනලද විනයක්‍රමය විභාග කොට මෙහි උත්තරසහිත විනිශ්චය කියන්නෙමි.

සමන්තභද්‍ර අනන්ත නයින් හැවසීගත්තාවූ මහාකරුණා ඥානයෙන් දෙශනාකරවදාළාවූ විනයධර්මය දූකසේ අවබොධ කටයුත්තේවේ. ඒ විනයපිටකයෙහි විනයාචාර්යෝපදෙශ නොලද බාහිරශාස්ත්‍රාන්තරප්‍රවීණ පණ්ඩිතයාද මූලාවට පැමිණේ.

පණ්ඩිත කෝදූගොඩ ඥාණාලෝක සථවිරයන් වහන්සේ පාරුපනාදියෙහි තත්ත්වාවබොධයක් නොකොට යථාලාභ සඞ්ගෘහිත පාරුපනසිඛ කටැටිව කරණ ප්‍රකාරය දක්වනුවෝ

ලිඞ්ගා සාමණකං බ්‍රූතෙ-ඤාණාලොකො තපොධනො
මහා විහාර වාසීනං-සමයං අවිලොමයං

යනගයරවතාකලෝ. සිඛකතීඃ ආයුෂ්මතුන්ගේ ශ්‍රමණ ලිඞ්ගසඞ්ඛ්‍යාතමහණඅවයවනමහාවිහාරවාසී සමයට සමද? සම්බවක්නොපැනේ. සමනම් ප්‍රාතඃ කාලයෙහි බිම වැටෙන විළිකුත් එලයක් මෙන් වමත පාත හෙළූ විට ඇද වැටෙන විකාර පාරුපනයක් දරන්නේ මන්ද? මහාවිහාරපරම්පරාවෙන් පැවත ආ එකක් නාම් ගුරුවරයන්ගෙන්ම ලැබිය

යුත්තකි. ගුරුවරයන්ගෙන් ලද ලිඞ්ගය හැරදමා ඔය ලිඞ්ගය ගත්තේ ඉබවියේ නොවේද?

ඉබවියේ ලිඞ්ගග්‍රහණය ලිඞ්ගලක්‍ෂණ ශෛෂ්‍යසංචාරක නොවීමට හේතු තිබේද?

මූසිපත්තුවකාය මහාවිහාරවාසී ඇර පෑ මහාසුමම මහාපදුමසමයෙහි තුන්සිවුරු අධිෂ්ඨානය නො නැගෙන ඌනතාය බව පෙනෙව නෙසු තිචීවරාධිෂ්ඨානං කරූහති යි එහෙයින්ම ඒ මූසිපත්තුවකාදි සිවුරු අතුරෙහි තුන්සිවුරු අධිෂ්ඨානය නො නැගේ යයි වදාළ නියමය දූත පුරුදු ද? දූත පුරුදු නම් පෙරපටන් වැළඳි සිවුරු හැරියේමන්ද? ඔය මූසිපත්තුවකය සිබකනීෘ කියන පරිදි මහාවිහාරවාසීන්ද සමයටත් සුගත් සිවුරට ඌනව කරගැනීමට වදාළ මහසිවුර වත් දෙකටම සම නැත. යට කී කරණප්‍රකාරයේ හැටි මේ කරුණු විමසන විට මහාවිහාරවාසීන්ගේ සමයට සම නොවන හෙයින් හාස්‍ය ජනකමය.

යුෂ්මත්හු ග්‍රන්ථරචනයෙහි දක්ෂ නමුත් කල් යල් පැනපු කට ඇද කරවන භාෂායෙන් පාරුෂ්‍යසිබ ලියා තිබෙන බැවින් උච්චාරණ පහසුවක් නැත. වසී එක්දහස් ගණනකට පෙර දිඹුලාගල් කාලයෙහි වැඩසිටි මෙධඞ්කර මහා සාමිහුගේ පරිජීවිනය සත්තයෙහි උච්චාරණයට අපහසු කට ඇද කර වන-භාෂාවක් නැත.

යුෂ්මතුන් කල්වයස් නොපිරී බොහෝ ඇසූ පිරිවැහු තැන් නැතිව විමසිය යුතු තැන් නොවිමසා විනයසම්බන්ධ පොතක් ලියන්ට අදහස් කර අදහසට නො ගැලපෙන සමහර තැන් වුවමනා හැටියට ලියාගත්තේ මන්ද? අත්පිඩු යන තන්හි අත්පට කියාද පත්පිඩු යන තැන පත්පට කියාද ලියා තිබේ.

ව්‍යාකරණවිධියෙන් කෘත්‍ර සුඞියක් නම් අජ්පට පජ්පට කියා ශුද්ධ කටයුතු නොවේද? මෙසේ වුවමනා කෙළෙස් ශාසනප්‍රතිපත්තියක් පහළ කරණ අදහසින්ම නොව ප්‍රසිඞියක් ලැබීමේ බලාපොරොත්තුවෙනැයි හැඟේ.

ඒ එසේම බැව් හියම් අමරපුර රාමඤ්ඤ නිකායික උතුමන්ට කසමාලාප පොතේ දක්වා තිබීමෙන් හැඟේ. ප්‍රතිපත්තියක් පනදදීමට කළ පොතක් නම් අනුන්ට නිග්‍රහ කිරීමෙන් වැඩක් නැත. ඒ කාරුණ්‍ය කෙසේ වෙතත් සිබ මුල්පිටේ පාරුපන වාදකළ කව්රුත් පැරද ගිය බව කියයි. මේ විත ලිව්වේ තමන් නොපරදින්නෙක් බව හැඟවීමටයි.

"සුපටිච්ඡන්නෙන හා අනන්තරසරෙගනනබ්බං" යන්න මේතාක් සේරුම් නොගත් සිබනතීන පාරුපනවාදකර දිනන්නේ කොහොමද? මහා ප්‍රාඥ සිජ්තාඩුවේ මාහිමියන් වහන්සේ සමග වාදකළ සිබනතීලාගේ එකාංශ පක්ෂය පැරදුන බැව් දන්නවුන්නගෙන් අසා දැනගන්න. පෙර පාරුපනවාදකර පැරදුන පක්ෂය ඇත්ත පිළිගැනීමෙන් උභයාංශපක්ෂයට ඇතුළත් වූ බැව් ඉතිහාසපරිච්ඡේදය බලා දතයුතු.

2 වෙනි

3 වෙනි පිටුවල විමසියයුත්තක් නැත.

4 වෙනි පිටේ ලක්දිව ත්‍රෛනිකායික කිසිවෙක් පාරුපනය නොදත් බව කියයි. තමන්ගේ දැනීමේ පමණ අත පාතම හෙලූ විට ඇද වැටෙන විකාර පාරුපනයෙන් ප්‍රකාශ වේ. දැනීමත්, පාරුපනයත් එකිනෙක සම බැව් කිව හැක.

5 වෙනි පිටේ පුනර්දනඃ යනාදි ශ්ලෝකයෙහි අදහස් අනුව කීරතවා නම් ගම්වැදීමෙහි එකාංශපාරුපන මැලේරියා වසංගතය සංසිඳුවා නොගෙන සිබනතීය විවරපාරුපන විෂමොපචාරයෙන් පාරුපනජ්වරය තවත් අසාධ්‍යතැනට පමුණුවා උපද්‍රව ඇතිකරගත් බව කියයුතු.

6 වෙනි පිටේ උත්තර යමපරිච්ඡේදවල ඇත.

7 වෙනි පිටේ 1 වෙනි 2 වෙනි ප්‍රශ්නවලට උත්තර පාරුපන පරිච්ඡේදයේ ඇත.

8 වෙනි ප්‍රශ්නයවූ "සුප්‍රාවෘත" යන්න විමසිය යුත්තකි. "ප්‍රාවෘත" යන්නෙහි අර්ථ ශබ්දශාස්ත්‍රමහානිධියෙහි "ප්‍රකෂීනාවෘතෙනවශෙන" ප්‍රකෂීයෙන් වටකරණලද වස්ත්‍රයක්

සුප්‍රාවෘත යන්නෙන් මොනවට ප්‍රකාශියෙන් වටකරණලද වස්ත්‍රයත් ප්‍රකාශවේ. මේ තිරපච්ඡක්වන්ද? පෙළේ වදාළ සුපටිච්ඡන්න යන්නෙහි අර්ථයෝ දක්වේ. සුපටිච්ඡන්න යන්නෙහි අර්ථ සුඩුපටිච්ඡන්නො මැනවින් පිළිසන් කරණ ලද්දේය. එනම් ගලඬිඑයෙන් උඩ හිසත් මිණිබහණෙන් යට අත්තල දෙකත් දශෙහි පිඩුමසෙන් යටපා දෙකත් විවෘත කොට උරහිස්දෙක සහිත මුළු ශරීරය වසාගැණීමයයි විවරණය කරතිබේ.

සුප්‍රාවෘත යන්නෙහි යටකී අර්ථය තිබෙනබව ඕනෑම සංස්කෘත කොෂයකින් පෙන්වාදුනහොත් යෙහෙකි. අති පණ්ඩිත සංස්කෘතපෙරළිය නිසා මහායානික ප්‍රතිපත්ති විපර්‍යාසය දැකදැනත් මෙබඳු යෙදුම් යොදනවා පුදුමයි.

8 වෙනි පිටේ පෙළබස නොදත් මිණිසුන් අනත්මනන් බැන මූලකරනබව කියයි. සුගත්වියනෙහි පමණ තේරුම් නොගත් සිබත්තීෟ අනත්මනන් දෙබවා ඇත්ත මූලාකර අනුන්පිට දෙස්නගාලයි. අටුවා ටීකාවල දක්වෙන අදහස් නොපිළිගෙන පෙළ තේරුම්කරන්න සිබත්තීට පිළිවන්ද? නොපිළිවන. සුගත්වියන අටුවා ටීකාවල දක්වූ ගණනින් මැනනොගෙන දූමීත පළකිරීමෙන් වැඩෙක්නැත.

භික්ෂුණීයට වදාළ ජලසාටිකය අටුවා ටීකාවල දක්වෙන ගණනින් මැනගත්කල්හි ඒදළබහලමූලාව පහකරගන්ට පිළිවන.

පූජාවලි පාඨයගැන සඟලසිවුර සිව්පටක් ගුණකොට සැටයොදුන්දිග පනස්යොදුන්පළල ශක්‍රාශනය වැසුයේ බුඩානුභාවයෙනි. නවවියත් සවියත් සුගතචීවරයෙහි සාධාරණ පරිභොගයක් අපට නොවදාළබැව් දූන දූන නවවියත් සවියත් සිවුර බුදුන්මෙන් පොරවන්ට අපට කියන හපනට තමන්ගේ සිවුරෙන් ශක්‍රාශනය වසන්ම නොහැකිවාක් මෙන්ම චීවරපාරුපනයෙන් පුරන එකමසිකපදයක්වත් පුරන්ට නොහැකිබැව් පොරෙරවන සිවුරෙන් කාදීමට ප්‍රකාශවේ. සුගත්වියනෙන් දිගින් නවවියක් පරසින් සවියත් සුගත චීවරය පාරුපනය කළහැක්කේ බුදුන්වත් මහසුප් තෙරුන් වත් පමණකි.

ඊට හේතු- භගවතා චීවරේසාධාරණ පරිභොගෙනච සමසමට්ඨපනෙනච අහං අනුග්ගහිතො සි.

භාවය: භගවත්හුවිසින් සුගතචීවරයෙහි සාධාරණ පරිභොගයෙන්ද තමන්වහන්සේ හා සම සම කොට තැබීමෙන්ද මහාකස්සප නම්වූ මම අනුග්‍රහකරණලද්දෙමි යනුයි. ඒ ආනුභාවය සිඛකතීමට හෝ අපට හෝ නැත. අප වියතට වඩා තුන් ගුණයක් දික්වූ සුගත් වියත වදාලේ ඒ වියතෙන් සිවුරු මැනගන්ට නොව සුගතචීවරයාගේ ප්‍රමාණය දක්වීමටයි ඒ වියතෙන් සිවුරු මැනගන්ට නියමයක් මූළවිනයපිටකයේ තිබේද? නැත. පිළිවන්නම් පෙන්වන්න.

මුඨිපඤ්චකය ථෙරවාදයෙහි සුගත් වියතෙන් නො මැන රියනෙන් මැන්නේමන්ද? ථෙරවාදො'ති මහාසුමත්ථෙරාදීනං ගාහො යි යූ බැවින් ඒ මහාසුමත්ථ මහාපදුම තෙරුන්වහන්සේලාගේ වාදග්‍රහණයෙහිවත් සුගත්වියතෙන් හෝ අපවියතෙන් හෝ සිවුරුමැනගන්ට නියමකරතිබේද? ඉෂමතුන් ගෙනතිබෙන මුඨිපඤ්චකය මැනගන්ට නියමකල හැටි මෙන්න. සිහිඑලවා බලන්න!

"මුඨිපඤ්චකනති" මුඨියාඋපලක්ඛිතං පඤ්චකං චතුහත්ථෙ මිණිත්වා පඤ්චමං හත්ථං මුඨිංකත්වා මිණිතබ්බංති අධිප්පායො

භාවය: මුඨිපඤ්චකය යනු කවරේද? මිටිරියනෙන් උපලක්ෂිත පඤ්චකයයි. සතරරියනක්මැන පස්වැනිරියන මිටිකොට මැනගතයුතුය යන අභිප්‍රායයි. දන්වත් මෙය හොඳින් තේරුම්ගෙන වියතෙන් සිවුරුමැනගැනීමට විධාන නොකටයුතු.

නියම මහසිවුර මහරුවල වගේයයි අපහසකලේ රුවල් ගැන දනද?

මහරුවල, පුංචිරුවල, ගෝස්රුවල, වැහිරුවල යයි රුවල් අනෙකාකාරයි. මින් තමන්ගෙනතිබෙන සිවුර ගෝස්රුවල වගේ නොවේදැයි නොවැටහුනු බැවින් දන්වත් වටහාගන්න.

9 වෙනි පිටේ උත්තර යටපරිච්ඡේදවල ඇත

බුද්ධවංස අටුවායෙහි අම්හාකං ගතවා අඨාරසහත්ථු බ්බෙධො යනු ප්‍රමාද පතිත ලියවිල්ලක් වියයුතු.

ඊට හේතු: කකුසඳ බුදුන් පටන් තුන්බුදුවරයන්ගේ උස යුගවශයෙන් පිළිවෙලට දසදසරියනින් අඩුවී අප බුදුන්ගේ උස දෙරියනකින් අඩුවීම පෙළෙව්වදුළ ගණනට සමනොවන හෙයින් අම්හාකං ගතවා මාදසහත්ථුබ්බෙධො යනුම සුද්ධ පාඨබව සැලකියයුතු.

අප බුදුන්ගේ ශ්‍රීදෙහය දොළොසක්බව් අම්හාකං බුද්ධො මාදසහත්ථො යන අටුවාපාඨයෙන්ද ප්‍රකාශවේ.

නැමද අබ තුළ සිව්-ඉරියව්වටත් පොහොනා
උතුතිරිනොවී දොළොසක්-බුදුබඳින් ඒ මහත්මා

මේ පෞරාණිකාචාර්ය ශිෂ්ට පණ්ඩිතයන්ගේ අවබෝධයයි.

10 වෙනි
11 වෙනි පිටුවල උත්තර සාරූපන පරිච්ඡේද බලා දතයුතු.

12 වෙනි පිටේ දක්වනු ලැබූ

බුද්ධකං චීවරං මහන්තං කාරෙන්ති යනාදි පාඨයෙන් කුඩාසිවුරක් ලොකුකරගැනීමෙන් මහසිවුරක් කුඩාකරගැනීමෙන් අදිටන් නොබිඳෙන බව ප්‍රකාශිතයි. සසුන් පරපුරෙන් පැවතෙන මහසිවුර තමන් පමණට කුඩාකරගැනීමත් කුඩා සිවුර මහත්කරගැනීමත් හැර මූඪපඤ්ඤාවක සිවුරක් කරගැනීමට නියමයක් නැත.

13 වෙනි 14 වෙනි 15 වෙනි පිටුවල කරුණුද යට ප්‍රකාශවී ඇත. 16 වෙනි පිටේ සිව්අඟුල්මිටි නන්දතෙරුන් වහන්සේ සාධකකරයි. නන්දතෙරුන්වහන්සේ සවලපවෙන සක් ඇතැත් බුදුන් හා සම්බැවින්ම සුගත් සිවුර පමණ සිවුරක් කරගැනීම ඊට නිදර්ශනයි.

කිසස පහා කංළුදසී යනාදි පාඨයෙහි දැක්වෙන නියී දනය මධ්‍යමපුරුෂ රියනෙන් දිග තුන්රියනකි. පුළුල

දෙරියන් සිව්අඟුල් සමාරකි. ඒ නිසීදනය උදායි හාමුදුරුවන්ට වැඩහිඳීමට කුඩාබැවින්ම බුදුන් අභිමුව එලා පුළුල් කරගැනීමට වරින් ඇද්දේය.

පාචිත්තියපාලියෙහි

ආයස්මා උදායි මහාකායෝ හොති යි ආයුෂ්මත්වූ උදායි මහකායක් ඇත්තේයයි වදාළසේක. උදායිහාමුදුරුවන්ගේ ශරීරය මහත්බැවින් නිසීදනය කුඩාවී ඒ කරණකොට තවත් එක්රියන් සමාරක දාවළුවක් එකතුකරගැනීමට වදාරා ඒ නිසීදනයත් මදවීම හේතුකොට

මහාවග්ගපාලියෙහි

තෙන ඛො පන සමයෙන අතිඛුද්දකං නිසීදනං න සබ්බං සේනාසනං ගොපෙති භගවතො එතමත්ථං ආරොචෙසුං. අනුජානාමි භික්ඛවෙ යාව මහන්තං පච්චත්ථරණං ආකඞ්ඛති තාවමහන්තං පච්චත්ථරණං කාතුං–

භාවය: එකල්හිවනාහි නිසීදනය ඉතා කුඩාවේ. භගවත්හට මේ කරුණ සැලකළෝය. මහණෙනි! පසතුරුණ යම්තාක් මහත්කොට කරනු කැමතිද? ඒතාක් මහත්කොට කරගන්නට අනුදනිමියි වදාළසේක.

සිඛකතීං නිසීදනය කුඩාබව දක්වා බුදුන් කුඩා සමසම බව දැක්වීමට ගෙන පෑ පාඨය අප්‍රසාධක නොවේ. උදායි හාමුදුරුවන්වහන්සේ විශාල කය ඇත්තෙක් බැවින් නිසීදනය කුඩාවූවා මිස බුදුරජහුගේ රූපකායය කුඩාබවක් සෙස්සන් හා සමබවක් ප්‍රකාශ නොවේ.

17 වෙනි පිටේ මහසූජ් තෙරුන්වහන්සේ පැතුන්බලයෙන් සවල්ප වෙනසක් ඇතත් බුදුන් හා සමබැවින් චීවර පරිවර්තනය කටහැකිවිය. සෙස්සන් හා සමබවක් නොදක්වේ

සිඛකතීං කණ්ඩුපටිච්ඡාදිනාම යනාදි පාඨය දක්වා අභෙද්‍යසාධකයයිද අටුවා ටීකාපාඨයන්ගෙන් නොබිඳියහැකි යයිද කියයි. දෙරියනක් දිග රියනක්පුළුල කඩහැඳ නාභියේ පටන් දණමඩල දක්වා වැළඳුන සෝරිවල පුසාවලින් අදත

යත් සිවුරත් කෙසේ රැකගැනීම කටහැකිද? එවකට හඳින්ට පිළිවන්ද? ඔය අහේතු සාධකයද අනාපත්තිවාර යෙහි

ඌනකං කරෙති අනාපත්ති යි කුඩාකරගැනීමෙන් අනාපත්තියයි වදාළේ දෙරියන් රියන්කඩ කුඩාකරගත්තද? අහෝ මූලාවකහැටි.

කණ්ඩුපටිච්ඡාදියෙහි නියම ගණන දිගසරියනක් හා පුළුල තුන්රියනකි. මේ කඩ වුවමනා විට අනාපත්ති වාර යෙහි කුඩාකරගැනීමට වදාළේ දෙරියන් රියන්කඩ කුඩාකර ගැනීමටදැයි අවිපරීත බුද්ධියෙන් යුක්තව සලකාබලන්ට හොඳයි. පූජාදියේ බහුල අවස්ථාවක ගුණකොට හැඳීම නොකළිනයද වේ.

18 වෙනි පිටේ සම්බුදුදෙහප්‍රමාණය අප හා වෙනසක් නැතැයි කීයයි. වෙනසක් නැතිබවට මහාපුරුෂ ලක්ෂණ දක්වීමෙන් වැඩක්නැත. රූපකායෙන් හා මහාපුරුෂලක්ෂණ යන්ගෙන්ද සම්බුදුයන්වහන්සේ සෙස්සන් හා සම්නොවේ. අසමසම බුදුන් සිබකතීං හා සම්කොට සිතීම බලවත් වරදකි.

19, 20, 21, 22 වෙනි පිටුවල උත්තරපාරූපත පරිච්ඡේද යෙන් දතහැක. 23 වෙනි පිටේ කුටිය ගැන කරුණු දක්වන සිබකතීං දිග සුගත්වියත් දොළසක් හා සරස සත්වියතක් බව කීයයි. සිබකතීං කියන මේ කුටිය දිග සරියනයි. පළල තුන්රියන්සමාරයි. මේ කුටිය මැනගැනීමෙහි සඳෙහ වලකනු පිණිස විමතිවිනොදනී ටීකායෙහි

සුගතඞ්ගුලෙන අට්ඨඞ්ගුලං වඩ්ඪකිහත්ථප්පමාණං යි සුගත්අඟුලෙන් අටඟුලක් වඩුරියන පමණයයි විවරණයකළ බැවින් වඩුරියන අඟල් 12) දොළසකි. වඩුඅතින් වියත් එකහමාරක් මධ්‍යමපුරුෂ රියනයි. ඒගණනින් කුටිය මැන ගත්විට දිගත අටලොස්රියනකි. පුළුල දසරියන් නවඅඟලකි. ගැලක් පැදවීමට තරම් උපචාරය ඇති කුණුකිපීලිකාදි උපද්‍රව නැති භූමියක කුටිවත්ථුදේශනාව පිණිස භික්ෂූන්

රැස්කරගෙන ඒ නියමිත ගණනින් කෙසෙලක්වත් ලොකු නොකොට කුටියකිරීමෙහි ඉහලපරිච්ඡේදය ඉක්මවීමෙන් මහලුක විහාරයක් වනබවත් ඇවැත්වන බවත් වදාළෝය. කුඩා කරගැනීමෙන් වරදනොවන බව

විමතිවිනොදනියෙහි

පකතිහත්ථෙන චතුහත්ථායපි කුටියා පමාණයුත්තා මජ්ඣිමා නපරිවත්තනති සා අකුටියෙව යනුවෙන් මැදුම් පුරුෂයාගේ අතින් සිවුරියන් කුටියෙහි ප්‍රමාණවත් මජ්ඣිම පරිවර්තනය නොවේයයි වදාළ බැවින්ද සමුච්චයාර්‍ථ අපි ශබ්දයෙන් පස්රියන් සරියන් පමණ කුටියද කුටිසඞ්ඛ්‍යාවට නොගැනේ. ප්‍රමාණවත්ව කුඩා කරගැනීමෙහි වරදක් නැත. මේ කුටිය එකල බුද්ධාගනයද පණවා තැබීමවත් වුවමනා කරන බැවින් සිඛකතීෘ සිතාසිටින පමණ කුඩා කුටියක් නොවන බව සමෘති සම්ප්‍රයුක්තව සැලකියයුතු.

මධ්‍යමපුරුෂ වියතෙහි පමණ දක්වීමට ඉදානි ශබ්දය යෙදූ බුද්ධඝොෂසාමුදුරුවන්වහන්සේට ව්‍යාජයෙන් දෝස් නැගුවේ කරුණු වටහා නොගැනීමෙනි.

ඉදානි ආහාරගවෙසනදුක්ඛං යි වදාළේ බුදුන් ජීවමාන කාලයෙහි පමණක් ආහාර සොයාගැනීමේ දුකසඳහාද? දැන් ඒ දුක නැද්ද? ඒතන් කාලය අතීත වර්‍තමාන අනාගත කාලවල පවතින බව ඉමස්මිංකාලෙ යන වාක්‍යයෙන්ම ප්‍රකාශවේ. අටුවාලියනකාලයයි සිඛකතීෘහැර වෙන කවරෙක් අර්‍ථකියනවාද? ධනියගොපයා විසූ කුටියෙහි කීදෙනෙක් සිටියාද? දුපුතුන් සහිත මහපවුලක් එහි විසූබව ධනියසූත්‍ර අටුවාව බලා දතයුතු. කරුණු පරීක්ෂා නොකොට බුද්ධඝොෂසාමුදුරුවන්ට නැගූ දෝෂ සිඛකතීෘම භාරගතයුතුය.

24, 25 වෙනි පිටුවල කරුණු ද විස්තරවිය. සිඛකතීෘ වඩුරියන ගැන හිඤ්ඤත්පිට මොහය ආරූඪකොට කථාකරයි. ඒ රියන ගැන සිඛකතීෘට හැර වෙන කිසිවෙකුට මුලාවක් නැත.

සුගත් අඟුලෙන් අටඟුලක් වඩුරියනෙහි පමණවේ. වඩුවියත් එකහමාරක් මධ්‍යමපුරුෂරියනෙහි පමණවේ. මේ රියන් ගැන සිඛකතීගේ මෝහය නම් දළබහලයි. ඒ බැවි වටහාගැනීම පිණිස සිඛකතීගේම වාක්‍යය මෙහි දක්වන් නෙමු.

“අටුවාහි එක වඩුරියනයැ මිටිරියනයැයි කීකල සියල්ලන් කෙරෙහි මිටිරියන පවත්නේයැ. පුරුෂයන්ගේ හ්‍රස්ව මධ්‍යම දීර්ඝ භෙදයෙන් මිටිරියන හා වෙනස්ව යන්නේයැ අටුවාහි වඩුරියන හා එබඳුමැයැ. දෙවිත වඩුරියනයැ සියල්ලන් කෙරෙහි එම වඩුරියන හා පවත්නේයැ” යනුයි. මේ උම්මත්තක වාක්‍යඛණ්ඩය කියවන කාහටවත් සිඛකතීගේ තත්ත්වය හොඳින් වටහාගත හැක. මිනුෂ්‍යයෙක් උස්මිටිවූ පමණින් වඩුරියන හෝ මිටිරියන හෝ වෙනස්වන්නේනම් මැනීමේ ක්‍රම වරදින බව තේරුම් නොගෙන මේ රියන් විභාගය කිනම් පොතකින් ගත් එකක්ද? ගුරුවරයන්ගේ ඉගැන්වීමක්ද? අභිකල ප්‍රකෘති සිහියෙන් ලියනලද්දක්ද? රියන් විභාගය පාරුපන පරිච්ඡෙදය බලා තේරුම්ගතයුතු

ජානුමණ්ඩලතො හෙට්ඨා යනාදි පාඨය දක්වා තමන් අඟුල වඩුඅඟුලයයි කියයි. මේයද පුදුම විකාර කථාවකි. 26, 27 වෙනි පිටුවල කඨිනය හෝ දණ්ඩකඨිනං හෝ දක්වීමෙන් මූටසීපඤ්ඤත්තිය හෝ සුගත්වියතෙහි පමණ හෝ බුදුන් තමතමන් පමණයයි හෝ නොදක්වේ. බුදුන් ජීවමාන දවස ථෙරවාදයෙහි ආ මූටසීපඤ්ඤත්තිය කඨිනයෙහි හෝ දණ්ඩකඨිනයෙහි හෝ එළා මැහුවාද? එදවස ථෙරවාදයක් තිබුනාද? නැත.

මෙම ලංකාද්වීපයෙහි බැමිණිතියාසාය සමයෙහි මුඛ පාඨවශයෙන් අටුවා සහිත ත්‍රිපිටකය නොනස්වා දරා වැඩ සිටි උපතිස්ස ඵුස්සදෙව තෙරුන්වහන්සේලා දෙනම ආචාර්‍ය්‍යාන්තෙවාසිකයෝය. මහාසුමම මහාපදුම දෙනමද උපතිස්ස තෙරුන්වහන්සේගේ අන්තෙවාසිකයෝය. ථෙරවාදය මහාසුමමතේරාදීන්ගේ ග්‍රහණයක් බැවින් බුදුන් ලොව පහළවූද පටන් මහාසුමමතේරාදීන් දක්වා මූටසීපඤ්ඤත්ත

සිවුරක් නොපැවතීය. අනාගතයෙහි විනයෙහි අව්‍යක්ත අයට මහසිවුරේ පශ්චිමාන්තය නුමුලාව තේරුම්ගැනීමට ථෙරවාදයෙහි මුටසී සඤ්ඤාවකය දක්වීය. පාඨතිබුනු පමණට ගෙන පෑමෙන් ඇති ඵලය කිම?

28 වෙනි පිටේ බුද්ධකාලයෙහිම අටුවා ඇතිව ගිය බව කියයි.

"මගදබසින් වැගෙමිණ් ආ බුදුකැලි අටුවා හෙලදිව ඇජුරෝ හෙළුබසින් තුබුහ"යි එයට සාධක කරයි. සිඛනතී විනයෙ වීනයසඤ්ඤී යි වදාළ අයුරු විනයසම්බන්ධ පණ්ඩිත යෙක් නම් මෙසේ නොකියයි. බුදුකැලියන් අටුවා බුදුකැලි අටුවා බුද්ධකාලීනයන්ගේ අටුවා බුදුකැලිඅටුවා නමු. ඔහු කවරහුද? මහාකාශ්‍යපාදි අටුවාචාර්යයෝය. බුදුන් පිරිනිවි මෙන් පසු උන්වහන්සේලා අටුවා කළෝය. බුදුකලැ අටුවා යයි යටපාඨයෙහි නොදක්වෙන හෙයින්ම සිඛනතීගේ කථාව හාස්‍යජනකමය.

සුත්ත, සුත්තානුලොම, ආචරියවාද, අත්තනොමති යන විනය සතර අතුරෙන් ආචරියවාදය අටුවාකථාව බව

ආචරියා වදන්ති සංවණ්ණෙන්ති පාලිං එතායාති ආචරියවාදො යන්නෙන් ප්‍රකාශවේ. කරුණු නොවිමසා සිඛනතී බුදුන්ජීවමානදවස අටුවා තිබුනා යයි කරන ප්‍රකාශය මහමුලාවකි.

29, 30, 31 වෙනි පිටුවල කරුණු යට ප්‍රකාශවිය.

32 වෙනි පිටේ පාරුපණෙ නාභිං සකණ්ඨා නාභිං පටිච්ඡා දෙත්ථං යනාදි පාඨය දක්වා තුන්සිවුරම එකතරම්යයි කියයි මේ පාඨයේ එබඳු අදහසක් නැත. පටුඅඳනය නාභියෙන් පාත්තොට හැඳ සිවුරෙන් නාභිය වසන්ට පිළිවන් බව දක්වයි. නැති අදහස් දක්වීම පණ්ඩිතයන්ට අයත් නොවේ.

33, 34, 35, 36 වෙනි පිටුවල පූජාවට නියම්කරපු නව රියන් රෙදිකැබැල්ල නිදශීනය කොට ඉන් සිවුරක් කරගත් බව කියයි. නමුත් රෙදිකැබලි ඊට එකතුකළාදැයි කියා නැත. වස්සාවාසික වශයෙන්ද අටරියන් දසරියන් රෙදිකැබලි

ලැබුන බව දක්වයි. සිබකතීගේ මේ රෙදිකැබලි හෙනපෑම නිශශාර කථාවකි.

ශාසනයෙහි චීවරවස්ත්‍රයන්ගේ ලැබීම් අනන්තයි.

මහාවග්ගපාළියෙහි

අස්සොසුං බො රාජගහෙ මනුස්සා භගවතා කිරභික්ඛූනං ගහපති චීවරං අනුඤ්ඤාතන්ති තෙච මනුස්සා. හට්ඨා අහෙසුං උදග්ගා. ඉදානි බො මයං දානානි දස්සාම පුඤ්ඤානි කරිස්සාම. යතො භගවතා භික්ඛූනං ගහපති චීවරං අනුඤ්ඤාතන්ති එකාහෙනෙව රාජගහෙ බහූනි චීවර සහස්සානි උප්පජ්ජිංසු. අස්සොසුං බො ජානපදා මනුස්සා භගවතා කිර භික්ඛූනං ගහපති චීවරං අනුඤ්ඤාතන්ති තෙච මනුස්සා හට්ඨා අහෙසුං. උදග්ගා. ඉදානි බො මයං දානානි දස්සාම පුඤ්ඤානි කරිස්සාම යතො භගවතා භික්ඛූනං ගහපති චීවරං අනුඤ්ඤාතන්ති ජනපදෙපි එකාහෙනෙව බහූනි ගහපති චීවර සහස්සානි උප්පජ්ජිංසු''

භාවය: ජීවකයන්ගේ ආරාධනයෙන් ගහපති චීවර අනුදත්තේ යම් කලෙක්හිද එකල්හි වනාහි රජගහ නුවර මනුෂ්‍යයෝ භගවත්හුවිසින් වනාහි භික්ෂූන්ට ගහපති චීවරය අනුදන්නා ලද්දේයයි ඇසුවාහුය. ඒ මනුෂ්‍යයෝද සතුටුවූවාහුය. ඔදවැඩියෝ වූහ. යම් හෙයකින් භගවත්හු විසින් භික්ෂූන්ට ගහපති චීවරය අනුදන්නාලද්දේවේද? එහෙයින් අපි දන් වනාහි සිවුරුපිළි දන්දෙන්නෙමුයි සිවුරුපිළි දන් දුන්නෝය. එක දවසෙහිම රජගහනුවර දහස් ගණන් බොහෝ සිවුරු වස්ත්‍ර උපන්නාහ. භගවත්හු විසින් වනාහි භික්ෂූන්ට ගහපති චීවරය අනු දන්නාලද්දේයයි ජනපදවාසී මනුෂ්‍යයෝ ඇසුවාහුමය. ඒ මනුෂ්‍යයෝද සතුටුවූහ. ඔද වැඩියෝ වූහ. යම් හෙයකින් භගවත්හු විසින් භික්ෂූන්ට ගහපති චීවරය අනුදන්නාලද්දේවේද. එහෙයින් අපි දන් වනාහි සිවුරුපිළි දන් දෙන්නෙමු පින්කරන්නෙමුයි සිවුරු පිළි දන් දුන්නෝය. ජනපදයෙහිද එකදවසෙහිම බොහෝ ගෘහපති සිවුරු දහස් ගණන් උපන්නාහුය.

සාමාවතී ප්‍රමුඛ අන්තඃපුර රාජස්ත්‍රීහු ආනන්දමහතෙරුන් වහන්සේට එකදවසෙහිම උතුරුසළු පන්සියයක් දුන්නාහුය. රෙදි රියන් හත අටකට පමණ හිම් කට නොහැක්කේය. එක කැබැල්ලෙන්ම සිවුරුකර ගතිත්නම් මේසා මහත් සිවුරුපිළි දීමෙන් වැඩක් නැත. භාණ්ඩාගාරයෙහි එකතුවූ සඟසතු සිවුරුපිළි බෙදීමේදී එකනමකට සිවුරට පමණක් එක වස්ත්‍රයක්ම නොදෙයි. චීවර විකලය සතුටුකොට සිවුරු වස්ත්‍ර දෙන හැටි

විනයාට්ඨකථායෙහි

එත්ථ චීවර විකලං පුග්ගල විකලන්ති මෙ විකලා. චීවර විකලං නාම සබ්බෙසං පඤ්චපඤ්චවත්ථානි දෙන්තානි සෙසානිපි අත්ථි එතෙසං පන න පාපුණාති. ජිණ්ණිකා දාතබ්බානි ජිණ්ණකෙනපි ච අඩ්ඪමණ්ඩලාදීනං වා උපාහනත්ථවිකාදීනං වා පහොනකානි ඛණ්ඩානි කත්වා දාතබ්බානි. හෙට්ඨිම පරිච්ඡෙදෙන චතුරඞ්ගුලවිත්ථාරම්පි අනුවාතප්පහොනකායාමං ඛණ්ඩං කත්වා දාතුං වට්ටති"

භාවය: මෙහි චීවරවිකලය පුද්ගලවිකලයයි විකලයෝ දෙදෙනෙක්වෙති. චීවරවිකලය නම් සියළු භික්ෂූන්ට එක එක නමට වස්ත්‍ර පසක් පසක් පැමිණියාහුවේද්ද තවත් ඉතිරිවූ සෙසු වස්ත්‍ර වේද්ද එකනමකට එකක් එකක්ම නො පැමිණේද කඩකොට සිඳදියයුත්තාහුවෙත්. කඩකොට සිඳිනවුන්විසින්ද අඩමැඩලි ආදීන්ට හෝ වහන් පසුම්බි ආදියට හෝ පෝහොනා පරිදි කඩවල්කොට දියයුත්තාහු වෙත්. යටත්පිරිසිදීමෙන් සිව්අගලක් පුළුල්වූද නුවාවට පෝහොනා පමණ දික්වූ කඩවල්කොට දෙන්ට වටී.

මෙසේ එකනමට වස්ත්‍රපසක් ලැබුනු කල්හි ඒ වස්ත්‍ර පසින් ශාසනික නියමසිවුරු මසාගැනීම කටහැක. සිඛනතීඃ හත්අට රියන් රෙදිකැබැල්ලකින් සිවුරු මසාගන්න බව කියයි. ඒ එසේ නම් වස්ත්‍ර පහ පහ බැගින් දෙන්ට නියම කළේ මන්ද? දහරියන් පහක් පණස්රියනකි. නවරියන් පහක් හතළිස්පස්රියනකි. මේ තුන් සිවුරට පෝහොනේ නොවේද ? මේ කරුණු සිතුවිලි රැහැණින් නොවෙලී හොඳින් බලා දූමිත බැහැරකරගන්න.

විශුද්ධිමාර්ගයෙන් ගෙන දක්වනලද

රජනකාලෙ පඨමං අන්තරවාසකංවා යනාදි පාඨය දැක්වීමෙන් තුන්සිවුර එකපමණයයි නොදැක්වේ. උක්කට්ඨ තෙචීවරිකයා විසින් ගමෙහි සිවුරු රදන් කරන කල්හි පළමු කොට අඳනය හෝ තනිපොට සිවුර හෝ රදන්කොට එය හැඳ ඉතිරි සිවුර රදන්කටයුත්තේය. සඞ්ඝාටිය හඳින්ට නොවටීය යනුයි.

අන්තරවාසකංවා උත්තරාසඞ්ගංවා අන්තරවාසකය හෝ උත්තරාසඞ්ගය හෝ යන මෙහි වා ශබ්දය යෙදූවේ උක්කට්ඨ තෙචීවරිකයාට ඇතැම්විටක තනිපොටසිවුර ශරීරය වසාහැනීමටය. ඒ මිසක් තුන්සිවුර එකපමණ බැව් ප්‍රකාශකිරීමට නොවන බැව් සැලකියයුතු.

ආරඤ්ඤකෙන පන මෙ එකතො ධොවිත්වා රජිතුං වට්ටන්ති යනුවෙන් උක්කට්ඨ ආරඤ්ඤකයා විසින් කටයුතු වෙනසකම් උත්තරාසඞ්ග සඞ්ඝාටිදෙක එකටධොවනයකොට එකට රදන්කරන්ට වටිත්ය.

මෙයින් අඳනය වෙනම ධොවනය වදාළ බැවින් උත්තරාසඞ්ග සඞ්ඝාටිදෙක වියළෙන්ට වැලෙහි දමා ඒ සමීපයෙහි සිට අඳනය සේදීම හා රදන්කිරීම කටයුතුය. ඒ අතර යමෙක් දැක්කොත් වහා වියළෙන්ට දමා තිබුන සිවුරගෙන ශරීරය වසාගතයුතුබව දැක්වෙන හෙයින් තනිපොට සිවුර ඇඳීමට ගතයුතු සිවුරක් නොවන බවත් මජ්ඣිම තෙචීවරිකයාට රදන්හලේ වැලලා තිබූ රදන්සළුව හැඳ තුන්සිවුරු රදන්කරගන්නට වදාළහෙයින්ද තනිපොට සිවුර හැඳීමට නොගතයුතු සිවුරක්බව දැක්වේ. තවද මුදු තෙචීවරිකයාට සභාගතැනකින් තාවකාලික අඳනයක්ගෙන හැඳ සිවුරු රදන්කරගන්ට වදාළබැවින්ම තනිපොට සිවුර හැඳීමට නොගතයුතුබවත් අඳනයත් තනිපොට සිවුරත් එකපමණ නම් යට විස්තර දැක්වීමෙන් වැඩක්නැත. එබැවින් තුන්සිවුර එකපමණයයිකීම ප්‍රලාප කථාවකි.

37 වෙනි පිටේද තුන්සිවුරම එකසේ හඳින්ට පිළිවන් බව කියයි.

හැබ සිඛකතීාවරයාණෙනි, තුන්සිවුර හදින්ටම පමණක්ද පිළිවන්. කැස බැඳගන්ට බැරිද? තුන්සිවුර එකතැටි හදින්ට පිළිවන්නම් උත්කෘෂ්ට තෛචීවරිකයාට අරණ්‍යයෙහිදී නගනාව තුන්සිවුරු රඳන්කිරීමවත් මධ්‍යමතෛචීවරිකයාට රදන්නලේ තිබූ රදන්සළුව හැඳ රදන්කරගන්ටවත් මෘදුකතෛචීවරිකයාට සභාකතැනකින් තාවකාලික අඳනයක්ගෙන හැඳ රදන් කරගන්ටවත් නීතමකර වදාළ බැවින් තුන්සිවුරම එකසැටි හදින්ට පිළිවනැයි සිඛකතීාගේ කීම අසත්‍ය වෛතුල්‍ය මතයෙකි. තුන්සිවුරේ වෙනස දතහැක්කේ පස්වටු ගැටවටු බැඳගත් ලකුණෙන් හා සරසනුවාවෙනුත් යයි කියයි. අවිචාරිත මේ පස්වටු ගැටවටු තවරතැනක බැඳගැනීමෙන් සිවුරේ වෙනස දතහැකිද? ඇතුපිට බහාලූ ගණ්ඨාවන් මෙන් දෙකොන් සමකොට වම්පසින් අකුලාගන්නාලද කර මතුයෙන් ගෙන මිණිබහණ මත තබන වැටිකළ සිවුරු දෙපොට ගැටවටු යයි කියනු ලැබේ. ගැට එව ගැට ගැට වූත් ඔහුම වැටිවූත් ඔහුමනුයි ගැටවටු, මින්වාව්‍යවින්නේ ගැටයකටබඳු සිවුරුවැටියයි.

සිඛවලඳවිනිසෙහි

"අතුරු ඝෙවරති අතින් එව පිළි ආදි එක්නෙරකින් එව අකවටු අවුළුවා කිඳුත් නොවටිණසි' දක්වනලදි.

හස්ථපල්ලත්ථිකාය දුස්සපල්ලත්ථිකාය යනාදීන් පාචිත්තිය පාලියෙහි අතින් අත අකුළුවා පලක්බැඳගැනීමත් වස්ත්‍රය අකුළුවා පළක්බැඳගැනීමත් යන ක්‍රමයෙන් අකවටු දැක්වූවාක්මෙන් ගැටවටු යනුද සිඛවූවකි. මෙයින් සිවුරේ වෙනස දතහැනීමට කරුණක් නැත. ගණ්ඨිකංපටිමුඤ්චිත්වා යන පදයට ගැටවටු කර යයි කරන ව්‍යවහාරය බලවත් මූලාවෙන් වූවකි. ගණ්ඨිපාස අනුදන වදාළේ සගුණසඞ්ඝාටිය ගැටවටුකර පොරෙවා පිඬුපිණිස ඇතුල්ගම්වවැඩිය අනඳ හාමුදුරුවන්වහන්සේගේ සැහැල්ලු සගුණසඞ්ඝාටිය වාතයෙන් ඉහලනගතු ලැබීම නිමිත්තකොට බැවින් ගැටවටු යන්නෙන් ප්‍රකාශවන්නේ සිවුරුපොරෙවනවිට දෙකොන් සමකොට අකුලාගන්නාලද සිවුරුවැටිය බව සැලකියයුතු.

38, 39, 40, 41, 42 වෙනි පිටුවල උත්තර යට පරිච්ඡෙද බැලීමෙන් දතහැක.

43 වෙනි පිටේ බුදුරජාණන්වහන්සේ තුන්සිවුර එක තරම්කොට පොරවා වදාළෝයයි කියයි. මෙබඳු නියමයක් අප බුදුරජාණන්වහන්සේ කිසිතැනක නොවදාළසේක. මේ නියමය සිඛකතීලාගේ කළුන්දෑවේ බුදුන්වත් වදාළේදැයි නොදනිමු.

44 වෙනි පිටේ ශුද්ධාවාස යන්න යට විස්තරවිය. උභයාංශපාරුපනය අසාසනික යයි කීම ප්‍රඥප්තිය නොදනී මෙන් කරන ප්‍රලාප කථාවකි.

45 වෙනි පිටේ සුපටිච්ඡන්නෙන අන්තරඝරෙගමිස්සාමි යනු නවවිධ ප්‍රඥප්ති අතුරෙන් අනුපඤ්ඤත්ති යයි දතයුතු. සුපටිච්ඡන්න ශික්ෂාපදය පාරුපනය සම්බන්ධව නොවදාළේ යයි කීම සම්පජාන මුසාවාදයකි.

46 පිටේ කායංවිවරිත්වා යන්නෙහි එකාංශකොට යන අර්ථය නැතැයි පාළිපාඨයක් හඳුදමාතිබේ.

විමතිවිනොදනියෙහි කාය විවෘතකරගැනීම සම්බන්ධව විස්තරෙ විය එකංසපාරුපනං සන්ධායවුත්තං යනුවෙන් කාය විවෘතකරගැනීම විස්තරයෙහිමෙන් එකාංශකොට පොරෙවාගැනීම සඳහා කියනලද්දේයයි දැකදැනත් අසම්බන්ධ තෙපුල් බිනීම ඉතා නොහොබී.

47 පිටේ කාය විවෘතකරයන්න සඳහා ජානුං යන එක වචනය ඉදිරිපත්කර එකළුරය වනබව කියයි. අහෝ මූලාවක මහත. යුගනද්ධ වස්තුන් සම්බන්ධව අනෙකාවයව බැවින් දෙශනාඅර්ථකථා ටීකාහි බහුවචන විග්‍රහයෙහි එකවචනයද එකවචනාර්ථවිග්‍රහයෙහි බහුවචනයද යෙදීම නීතිරීති බව දැනගත්හැකියක් නොපැනේ.

සිඛකතී

චක්ඛුනා රූපං දිස්වා යන්නට එකැසින් රූපදැකැයිද සොතෙනසද්දංසුත්වා යන්නට එක කනින් ශබ්ද අසායයිද පාදෙන ගාමංගච්ඡති එකපයින් ගමටයයි කියාද අර්ථ කියනවාට කිසිම සැකයක් නැත.

හත්ථංවා පාදංවා කීලාපෙන්තො යනාදීන් දෑත දෙපය සොලවමින් යනතන්හි මෙන්ද සාලිගබ්භං ඵාලෙත්වා හැල් ගැබ් පලා යනාදිතන්හි මෙන්ද ජත්තූං යන්නෙහිද අස්කුළු දෙකම වාච්‍යවේ. හදන්තාචාර්‍ය්‍ය බුද්ධදත්ත මහාස්වාමිපාදයෝ ජත්තූණි යනුවෙන් අංසකූට දෙකයයි අර්ථවර්ණනාකළෝ. එම ටීකාචාර්‍ය්‍යයෝ ජත්තූනි පිති උභො අංසකූටානි කියා උරහිස් දෙකයයි අර්ථ වර්ණනාකළෝ.

මෙසේ අස්කුළු දෙක වසන්ට කල විනය නියමය නොපිළිගෙන ජත්තූංවා උරංවා විවරිත්වා ගච්ඡන්තස්ස දුක්කටං යන මේහි ජත්තූංවා යන බහුවචන විෂයකොට පවත්නාවූ එකවචනය අපෙක්ෂාකොට දෙවුරනොවසා එකඋරයක් වසා ගෙන ගම්වදින මහණහට දුක්කටාපත්තියෙන් නම් වලකින්ට නොහැක. මෙසේ හිර-සඳ මෙන් ප්‍රකට පූජ්‍යාචාර්‍ය්‍යවර යන්ගේ මේ අර්ථය වළක්වාලන්ට කිසිවකුට නොපිළිවන.

48 පිටේ විනයවිනිශ්චයෙහි උරහිස්දෙක වැසීමට කල නියමය වැරදි බව කියයි. තමාට වැරදුනතැන වරද සඟවා ගැනීම පිණිස පොත බොරුකොකර සිටීම ශාසනමාමක පාපභීරුක ප්‍රතිපත්තිගරුක උතුමන්ට අයත් සිරිතකි.

49, 50, 51, 52, 53 පිටුවල කරුණු යට විස්තර බලා දතයුතු.

54 පිටේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්වහන්සේ සැහැල්ලු සඟල පොරොවා පිඬු පිණිස වැඩිය බැව් දක්වූ පාඨයෙහි

"වාතමණ්ඩලිකාය සඞ්ඝාටියො උක්ඛිපිංසු" යනු දක්වා ශරීරයෙන් සිවුරු ගිලිහුණාහයි අසම්බන්ධාර්ථයක් කියයි. පාඨයේ වැරදීම සුද්ධකරනොගෙන නියම අර්ථය කෙසේ දක්විය හැකිද?

එහි සුද්ධපාඨය වාතමණ්ඩලිකාය සඞ්ඝාටියො උක්ඛිපිංසු, යනුවේ. වාතමණ්ඩලිකාය, වාමැඬිල්ල විසින්, සඞ්ඝාටියො, සගුණසඞ්ඝාටීහු; උක්ඛිපිංසු, ඔසවනු ලැබූහ; ඛිප. ඛෙපෙ යන ධාතුව සකර්මකවේ. සඞ්ඝාටියො යනු උක්තකර්මයි. වාතමණ්ඩලිකාය යනු අනුක්තකර්තෘයි.

**උපසග්ගවසෙන ධාත්වත්ථො බලසාඤ්ඤත්ථ නීයතෙ.** උපසර්ගවශයෙන් ධාතු නමැති ඇතා කැමැති පරිදි අර්ථය කරා පමුණුවනු ලැබේයයි කියනලද හෙයින් උ. උද්ධගමෙ. උ. යන උපසර්ගය ඉහළනැඟීම් අර්ථයෙහි වැටේ. එහෙයින් සැහැල්ලු සගුණසඞ්ඝාටීහු ඉහළනඟනු ලැබූහ. යන අර්ථය ප්‍රකාශ කෙරෙති. අවඅධොපාතෙ අව යන උපසර්ගය යටට හෙළීම් අර්ථයෙහි වැටේ. සිඛකර්තෘගේ අර්ථයට එල්ලකරන්ට නම් අවක්ඛිපිසිංසු වියයුතු. සිඛකර්තෘ වැරදි අර්ථයක් ප්‍රකාශ කළේ ගීවෙය්‍ය පස ගණ්ඨිය අවුණාගැනීම පහළ කරන්ටයි. වාතයේ ශක්තිය සැහැල්ලුදේ ඉහළනැඟීම ස්වභාවය වේ. ඒ කරුණ නිමිතිකොට ජඞ්ඝෙය්‍යපස ගණ්ඨිපාසය බැදගැනීමට වදාළසේක. ගන්තව්‍යක්‍රියාවට ගණ්ඨිය මලපතෙහි හෙවත් පුඩුවෙහි අවුණාගැනීම පාරුපනාවශානයෙහි කටයුතු නියමයවේ. පාසඑලකයන්නට පස්වඩුව යයි අර්ථක්යයි. නරකනැහ. එලක පෝරුයයි තද්භවවේ.

**බුද්ධාච නාම ගණ්ඨිකං පටිමුඤ්චිත්වා** යනාදි පාඨය දක්වා පිරිස්මැද දහම්දෙශන සම්බුද්ධයන්වහන්සේ ගලවළව හමුවූතැන සිවුර ගෙන සිව්අඟුලක් පමණ යටට පාත්කළ බව සිඛකර්තෘම කියයි. ඉහළ ගණ්ඨියක් අවුණාතිබුනා නම් ගණ්ඨිය තුමූද සිවුර පාත්කළේ කෙසේද? සිඛකර්තෘගේ අදහසට එල්ලකරන්ට නම්

**ගණ්ඨිකං මුඤ්චිත්වා චීවරං ගහෙත්වා චතුරඞ්ගුලමත්තං ඔතාරෙසි** යනු දක්වියයුතු පාඨයෙහි ගණ්ඨිය මිදීමක් නො දැක්වූ හෙයින් ඉහළ ගීවෙය්‍යපස ගණ්ඨිය අවුණා නොතිබුනු බව කදිමට පැහැදිලිවේ. උභයාංශපාරුපනයෙහි ගන්තව්‍ය ක්‍රියාවට පාරුපනාවසානයෙහි ගණ්ඨිය මලපතෙහි හෙවත් පුඩුවෙහි අවුණාගැනීම පූර්වකාලක්‍රියාව බැවින් ජඞ්ඝෙය්‍යපස ගණ්ඨිය අවුණාගැනීම සම්බුද්ධයන්වහන්සේ විසින් වදාළ නියමය බැව් සැලකියයුතු.

මෙහි **ගණ්ඨිකංපටිමුඤ්චිත්වා** යන්න හා **තිමණ්ඩල පටිච්ඡාදෙන්තෙන-පෙ-ගණ්ඨිකංපටිමුඤ්චිත්වා** යනු සම්බන්ධ කටයුතු. කුමක්හෙයින්දයත්? ගණ්ඨිය අවුණාගැනීම පාරුපනාවසානයෙහි කටයුතු හෙයිනි.

55 පිටේ භික්ඛුණීවිභඞ්ගපාඨය ගැනද යට විස්තර ප්‍රමාණය සිවුර ඉහළ නගනු ලැබූබව විමතිවිනොදනී ටීකායෙහි

**කම්පිතො උබ්භං කායබන්ධනාදිදස්සනවසෙන උක්ඛිපනං සන්ධාය වුත්තං** ඉහළනගනලද සිවුරනම් කටියෙන් ඉහළ කායබන්ධනාදිය දැකීමට හැකිවන පරිදි සිවුර ඉහළට නැගීම සඳහා කියනලදී. මෙතරම් ප්‍රකටව විස්තරකර තිබෙතත් සිවුර පාතට හෙළූහයි දැන දැන සම්පජාන මුසාවාදය භික්ෂුජීවිතයට කොයිතරම් නරකද? ඛිප. ධාතුව අවිශෙෂයෙන් දැමීමෙහි හෙවත් හෙළීමෙහිද උ. පූර්වකල්හි ඉහළනැගීමෙහිද අව පූර්වීමෙහි යටට හෙළීමෙහිද පවතී. නොවරදවා අර්ථකියන්නට පාඨය ශුද්ධකර ගන්නට නොහැකිවීම පාණ්ඩිත්‍යයට මහත් කැළලකි. භික්ෂුණීයට ගණ්ඨියක් නොවදාරා සඞ්කච්චිකය වදාළ බැවින් සිඛතීර්ගේ මොහු ගණ්ඨිය යට ටීකාපාඨ පහරින් හගනාවූ බව සැලකියයුතු.

56 පිටේ **පත්තං ථවිකාය පක්ඛිපිත්වා ගණ්ඨිකං මුඤ්චිත්වා** යනාදිපාඨයෙහි විද්‍යමානාර්ථය. මිත්‍රස්ථවිරයන්වහන්සේ ථවිකගැටය මුදා පාත්‍රය ථවිකයෙහි බහා නැවතී කස්ලෙන දමා වැඩ පාත්‍රය ඇඳයටත් සිවුර සිවුරුවංශයෙහිත් තබා රහත්බවට නොපැමිණ නොහිස්මෙන් නෙමියි අදිටන්කොට වැඩහුන්සේක, මෙසේ සඳිමට පවත්නා අර්ථය අවුල්කොට ඒ ඒ තැනින් පාඨකෑබලි ගෙන දක්වා ගණ්ඨිය ඉහළ අවුණා ගැනීම කළබව දැක්වීමට මූසාපළකර තිබේ.

57, 58, 59, 60, 61, 62 පිටුවල ගතයුතු සාරාංශයක් නැත.

63 පිටේ යට විස්තරකළ **විවරිත්වා නිසීදනො** යනාදි පාඨයෙහි විස්තර පාරුපනපරිච්ඡෙදය බැලීමෙන් දතයුතු. නමුත් **විවරිත්වා නිසීදනොති විහාරෙ විය එකංස පාරුපනං සන්ධාය වුත්තං** යි විවෘතය නම් විහාරයෙහි එකාංශ පාරුපනයෙන් හිඳින්නාක්මෙන් ඇතුල්ගම වාසොපගතයාගේ එකාංශපාරුපනයෙන් හිඳීම සඳහා කියනලද්දේ යයි විස්තරකර තිබෙනබව දැනදැනම අනන්මනන් දෙඩා තිබේ.

64 පිටේ විකාර වාක්‍යඛණ්ඩයන් මිස ගතයුත්තක් නැත.

65 පිටේ යට ප්‍රකාශිත විවෘතය සම්බන්ධව ඒකංසපාරුපනං යනාදිය කියමින් ඒකංසපාරුපණං යන්න සකස්කරගත් බවක් කියයි. මේ සකස්කරගැනීම සිඛකතීගේම කැලපීමක් බව විවරිත්වා නිසීදනො යන අටුවා පාඨය විස්තරකල ටීකා පාඨය කියවන නුවණැත්තන්ට හොඳින් වැටහෙනවා ඇත. මෙහි මූඛ්‍යාර්ථය කායවිවෘතයයි. ඒ අර්ථය විකාරයෙහි එක උරයක් විවෘතකරගැනීම මෙතැයි ටීකායෙහි කල විස්තරයෙන් ප්‍රකාශවිය. සිඛකතී ලොකපාලධර්මයෙන් තොරව ඒකංසපාරුපනං යන්න ගලපා ගත්තමුත් එකසිවුරක් පාරුපනය කල පමණකින් කායවිවෘතය නොවන බව සලකා පොත් කටුගෑම ගැන පරිස්සම් වියයුතු.

66, 67, 68 පිටුවල ස්ථවිරවාදයෙහි ඒකාංශ පෙරවීම මිස උභයාංශ පෙරවීමක් නැතැයි දක්වීමට බුද්ධප්‍රතිමා ගැන කථාකර මහාසඞ්ගීති වාදීන්ගේ පිළිමයයිද ථෙරවාදීන්ගේ පිළිමයයිද කොටස් දෙකකට බෙදයි. මේ අපරීක්ෂාකාරී හේතු රහිත විකාර බෙදීමකි. සිඛකතී සූත්‍ර, සූත්‍රානුලොම, ආචරියවාද අත්තනොමති. යන සතර අතුරෙන් ථෙරවාදය අත්තනොමතිය බව දැනසිටී නම් පිළිම කොටස් දෙකකට නොබෙදයි.

සියම්, බුරුම, කාම්බොජ, ලඞ්කා, භාරත යනාදි රටවල ශිල්පීන් ශාරිපුත්‍ර, රූපමාලා යන පත් පොත් දැන ඉගෙනගත් පමණින් නොඑක් ආකාර ප්‍රතිමා කරතිබේ. ඉන් ග්‍රීක්, භාරත ලඞ්කා ශිල්පීන් ප්‍රමුඛස්ථානය ගෙන තිබෙතත් ඔවුන්ද දෙශකාර්ථකථා ටීකාදියෙහි දක්වෙන බුද්ධරූප විලාශයවත් පාරුපනයවත් විමසා පිළිමනොකර තිබෙන බවම ඒ ඒ පිළිමවලින් පැහැදිලිය. කතන්දාකාරයෙන් පිළිමයක් නිර්මිත කරන්ට මාරයාටත් බැරිය. එබැවින් පාරුපනයට විනය පත් පොත් හැර පිළිම ගෙන පෑමෙන් වැඩක් නැත බොහෝසෙයින් ඒකාංශ පාරුපනයෙන් යුක්ත පිළිම දක්නා ලැබෙත්. ඊට හේතු? ගමතුළ වඩින පිළිමයක්

කළනොහැකි හෙයින් විහාරයෙහි වැඩහුන්න ආකාරයෙන්ම ඒකාංශ පාරුපනයෙන් යුක්තව පිළිම කරතිබේ. සතර ඉරියව්වෙන් වැඩහිඳීම, වැඩසිටීම, සැතපීම දක්වෙන පිළිමම දක්වෙන හෙයින් එකිනපිළිමයක් දක්වන්ට නොහැක. ඇතැම් තැන පිළිම උභයාංශපාරුපනයෙන් යුක්තව කර තිබේ.

බුද්ධගයාවේ වැඩසිටි ඇම්. පී. සුමඞ්ගල තෙරුන්නාන්සේ විසින් වර්ෂ 1902 දී එවනලද ලියවිල්ලෙහි ධර්මාශෝක මහරජතුමාණන් විසින් බෝමැඩ කරවනලද පිළිම වහන්සේලාගේ පාරුපනාදියෙහි ආකාරය දක්වාතිබේ.

ඒ මෙසේය. ධර්මාශෝක මහරජතුමන් විසින් බුඩගයාවේ කපප්වා තිබෙන වැඩහුන්න ශෛලමය බුඩරූපය ඒකාංශ ගැටවටුවෙන් යුක්ත බවද පිරිසට ධර්මදේශනා කරන අන්දමට සාදතිබෙන බුද්ධරූපවල දෙවුරවසා පොරොවා තිබෙන බවද මහ කළුගල් ලෑලිවල ලකුණුකර තිබෙන බුද්ධරූපවලත් දෙවුරවසා පොරොවා තිබෙන බවද ආලවක දමනාදි තැන්වල ධර්මදේශනා කළ අන්දමට සාදතිබෙන බුද්ධරූපවලත් දෙවුරවසා පොරොවා තිබෙන බවද රාහුලෝවාද සූත්‍රය දේශනාකර වදාරන්නාවූ බුදුරජාණන් වහන්සේටත් රාහුලහාමුදුරුවන්ටත් අතර වතුර පාත්‍රයක් තබා බුදුන් දෙවුරවසාපොරොවා රාහුලහාමුදුරුවෝ ඒකාංශ ගැටවටු ගන්වා උක්කුටිකයෙන් හිඳ දෙඅත හිසමත තබා වැඳගෙන සිටිනාකාරයට කපා තිබෙන ගල්ලෑල්ලක බුදුන්ගේ දකුණු ශ්‍රීහස්තය වතුරපාත්‍රයට දිගුකොට

රාහුල ඉමං උදකපත්තං නිච්චංවා අනිච්චංවා? අනිච්චං භන්තෙ යනාදි තැන බුදුන් දෙවුර වසාම පිරිසට ධර්මදේශනා කළ බවද බුදුරජාණන් වහන්සේ සැතපී වදාරණ අන්දමට දඹදිව් ගල්වලින් කපාතිබෙන මහබුද්ධරූප සියල්ලම ඒකාංශ ගැටවටුවෙන් යුක්ත බවද කියාතිබේ.

දඹදිව පඤ්ජාබ් පළාතට අයිති හොතී නමැති ගමෙහි උභයාංශ පාරුපනය සහිත බුදුපිළිමය පිහිටුවා තිබෙන ශෛලාශනයෙහි මෙම ගාථාවද කොටා තිබේ.

"සුරනරවරජීවහා තුඩශරඩහා භූසාරි
ලලිතධවල කිතනී කීළිතා චොදිතානං
දදති වර විරාගා සාර සංසාර මුනතිං
රමතු රමතු නිච්චං මෙ මනොදෙව දෙවෙ"

ලංකාවේ දඹුළු විහාරයෙහිද උභයාංශපාරුපනයෙන් යුක්ත ගිරිපිළිමයක්කරතිබේ. බුද්ධත්වයට පැමිණ වදාළ ආදියෙහි පටන් උභයාංශපාරුපනය පැවැති බැව්

ශ්‍රී බුඩ වර්ෂ 1478 පමණේදී ලංකාරාජ්‍ය ශ්‍රීපදප්‍රාප්තව රජය කරවූ ධර්මවිනයාතිදක්ෂ පස්වැනි මහා කාශ්‍යප රජහු විසින් ලියනලද අතිපුරාණ දම්පියා අටුවා ගැටපදයෙහි

දෙඅත් වසා පොරෝවුන බැවින් සිවුරු ගැබෙහි සැඟවුනු අත් එයින් නෙරයි පහරයි. යනු ලියා තිබෙන හෙයින් පිළිමගෙන පැමෙත් උභයාංශපාරුපනය වලක්වන්ට නොහැක. ඊශ්වරයාගේ පවා හෘදය කම්පා කරවන්ට තරම් තේජස් ඇති මහාප්‍රාඥයකුටත් බැරිවූ වැඩක් සිබකතීෘට කෙසේ කටහැකිවේද? නොහැකිවේමය. ඒ බැව් වීරකජාතකයෙන් ප්‍රකාශවේ.

ලක්දිව සසුන් පිහිටුවා වදාළ මිහිඳු මහරහතන්වහන්සේ මගද බසින් තුබූ අටුවා හෙළදිව්බසට නැගූහ. ඒ සිංහල අටුවාහි තුබූ පරිදි උභයාංශ පාරුපනය සම්බන්ධව කාශ්‍යප රජහුගේ ලියවිල්ල සිබකතීෘගේ මුළු බලාපොරොත්තු බිඳ වැටීමට ප්‍රමාණය.

69, 70 පිටු ගැන යට උත්තර ප්‍රමාණය.

71 පිටේ කල්‍යාණීශිලාලිපි පාඨයෙහි දක්වෙන කෙශොරොපන විවරබන්ධන දෙක ගැන කරුණු තේරුම් නොගෙන මුළාව කථාකර තිබේ. බුරුම රටේ හිසකෙහෙ

තිබියදී දළුරවුල් පහකිරීම සිරිත බැවින් එසේ නොකොට කෙසමස්සුං ඔහාරෙත්වා යනාදීන් වදාළ පරිදි කිසකෙහෙ සමග දැළිරවුල් පහකරවීම මහා විහාරීය සඞ්ඝයාවහන්සේගේ සිරිතය. ඒ අනුව කෙසොරෝපන විධාන කළ බවත් එමෙන් එරට බොහෝසේ සිවුරුමැසිලි කඩ වෙන්නොකොට චීවරබන්ධනය හෙවත් සිවුරු මැසීම කරන බැවින් එසේ නොකරන්ට කළ විධානයක් හැර කුදිරන්ගේ හා පාදිරින්ගේ බඳපටිය බැඳගැනීම මෙන් සිවුරුපොරොවා පිටතින් බඳපටි බැඳගැනීමට නියම නොකළ බව දතයුතු.

**නකප්පාපෙය්‍ය විසුං මස්සුං වාධිකාංවා ඨපෙය්‍යගො**
**සංහරාපෙය්‍යවා ලොමං සම්බාධෙ තස්ස දුක්කටං,**

මේ විනයවිනිශ්චය නියමය කඩකොට කිසකෙහෙ ඉතිරි නොකොට රැවුල් හරවන මහණහට්ද කෙසා ලොමා යනුවෙන් කෙස් ලොම් කොටස් දෙකක් වදාළ බැවින් සම්බාධස්ථානයෙහි තිබෙන ලොම් හරවන මහණහටද දුක්කටාපත්ති වන්නීය.

72 පිටේ පැපිළියානේ ශිලාලිපියෙහි දක්වෙන පිළිතුරු දෙකේ වටිනාකම රු: 12 ක් පමණ වේ. මින් වටිනා නියම මහසිවුරු කරගැනීමට ප්‍රමාණය යවනී ශිලාලිපි කාලය ඉතා අඩු මිලයෙන් සිවුරු කරගතහැකි කාලයකි. වත්තක්ඛන්ධකයෙහි හෝ විනයෙහි වෙන තැනක හෝ පාරුපනාවශානයෙහි පිටත පටියක් බැඳගැනීමට නියමයක් නැත. එබැවින් සිබකනීෘ දක්වා තිබෙන වක්‍රබන්ධනාව වත්‍රය සම්බන්ධ මුබපුස්සජනය හෝ බකාර වකාර විපයීසාශ වීමෙන්වූ ත්‍රිවිධ වස්තූන් වැඳීමට ගත්තා වම්බණ්ඩය හෝ වියයුතු. වන්දන යනු බන්ධනයි. ශිලාලිපිවල තිබේ.

73 පිටේ උත්තර පාරුපන පරිච්ඡේදවල ඇත.

74 පිටේ වජිරබුද්ධිටීකාගණ්ඨියෙහි දක්වෙන මහසිවුර පරිමණ්ඩල පාරුපනයටත් සුප්පටිච්ඡන්න පාරුපනයටත් ප්‍රමාණ බව

අවස්ථාංශ චූතනාඝකශමෙන සමුපජ්ජති අටුවා කථා යෙහි කියනලද ක්‍රමයෙන් සැපයෙයි. එපමණක් අනතිම ප්‍රමාණයයි සිඩකරනලදි. නංවබො ඒ අනතිම ප්‍රමාණය වනාහී යම්සේ කියනලද මූටසීපඤ්චකාදි විවරයක්වේද ඒ අනතිම ප්‍රමාණයයි කියනු ලැබේ. මෙහින් දක්වෙන්නේ සුගත් සිවුරට උණුව මූටසීපඤ්චක පච්ඡිම ප්‍රමාණ විවරයට උතකෂීව අතර සිවුරුකර ගැනීමට කළ නියමය බව හැර සිඛකනීංව ඕනෑකරන මුටසීපඤ්චක සිවුරක් කරගන්ට නියමයක් නැත. පාඨයේ අදහස කොටින් කියතොත් සුගත් සිවුරට උනුව මුටසීපඤ්චක අනතිම ප්‍රමාණයට උතකෂීව අතර සුපටිච්ඡන්න උභයාංශපාරුපනයට ප්‍රමාණවත් මහ සිවුරම කටයුතු බව ප්‍රකාශ කරන ලද්දේය. අනතිම ප්‍රමාණ කී මූටසීපඤ්චකය තුන්සිවුරු අධිෂ්ඨානයට නොගන්නක් බව යට විස්තරකර ඇත.

75 පිටේ ප්‍රමාණවත් සිවුර පොරෙවන්නහු විසින් සම කරනලද කොන්දෙක අකුලා හෙවත් ගැටවටුකර කරමතු යෙහි බහා කිසිල්ල යටින් ගෙන මිණිබඟක මත තබනලද උභයාන්තය වහිර්මුඛව සිටින බව පාඨයේ දක්වා තිබුනේවී නමුත් විනය පොත වරදවා තේරුම් ගැනීමෙන්ද්‍ය සිඛකනී නමන් මිණිබඟණ මත තැබූ අන්තය වහිර්මුඛ නොව අධො මූඛව තබාගෙන තිබේ.

76 පිට විස්තර කිරීමෙන් වැඩක් නැත.

77 පිටේ මෙච්වරානි පාරුපනස්ස යනාදි පාඨයෙහි දක්වෙන්නේ සුපටිච්ඡන්න උභයාංශපාරුපන ශික්ෂාපද යෙහි කියනලද ක්‍රමයෙන් උත්තරාසඞ්ග සඞ්ඝාටි දෙක එකතුකර පොරුවා ගැනීමයි. සිඛකනීලාගේ එකාංශ පාරුපනයට සඞ්ඝාටිය නියමකළ තැනක් නැත. කතිපොට සිවුර පමණක් පොරෙවාගෙන ගම්වදින මහණහට දුකුලා වන බව විනයනීයමයයි. මේ උභයනාවකාවික බව සැලකියයුතු.

78, 79, 80 පිටුවල සිබතතීං සිවුරු ගැබ ගැනත් දෙඅත් ගැනත් කථා කර තිබේ. චීවරගබ්භතො හත්ථං පසාරෙත්වා යන පාලිපාඨයෙහි අර්ථදක්වන කාශ්‍යපරජතුමා සිවුරු ගැබින් නෙරයි. අත්පහරයි. යන අර්ථ දක්වා නැවත එම අර්ථය මෙසේ විස්තර කරයි.

දෙඅත් වස්ත්‍ර පොරෝවුන බැවින් සිවුරු ගැබෙහි සැඟවුණු අත් එයින් නෙරයි පහරයි කියාය මේ උභයාංශ පාරුපනය දක්වෙන පාඨයෙහි ගබ්භ නාමය ගබ්භෙ වසති මාතෙවා ගබ්භා වක්ඛන්ති හොති යනාදි තන්හි කුසි වාචකයි. එනම් ආමාස පක්වාස උදරපටල පිටසිකණ්ඨක යන මොවුන්ගේ අභ්‍යන්තරයයි.

චිවරගර්භය නම් හිසත් අළුදෙකත් පාදෙකත් වීවෘත කොට මුළුශරීරය වස්‍ාගත් අභ්‍යන්තර ගර්භයයි. ඒ සිවුරු ගැබ තුරෙන් අත නෙරූයයි පහකළ බව කදිමට ප්‍රකාශ කළේවීනමුත් සිබතතීං මවුගැබෙහොත් දරුවා මව උකුලෙන් උපනැයි කියන්නාක් මෙන් උකුලෙන් අත ඉවත්කරගත් බව කියයි. මෙසේ අභූත ප්‍රකාශ කිරීමෙන් ඇති ඵලය කිම? සර් ඩී. බී. ජයතිලක මැතිතුමා ශුද්ධකොට අච්චුගැසූ පොතේ දෙඅත්වස්ත්‍ර පොරවුන බැවින් යනු කියා තිබේ.

හත්ථං පසාරෙත්වා යන පාලියට අර්ථ දක්වූ තැන දෙඅත් යයි කීම මූලා කථාවකි.

81, 82, 83 පිටුවල සිඛවලඳෙවිනිසෙකි ආ පත්පිටු යන්න ගැන කථාකොට අත්පට යනු ශුද්ධපාඨය බව කියයි. මෙසේ ඔහුකළේ තමන්ගේ පාරුපනයෙහි තතිපටින් ඇතුළු ගැටවටුව අත්මත බහා අධොමුඛව තබාගැනීමටයි. ඒ අශාස්ත්‍රීය පාරුපනය සිද්ධකරන්නට අත්පට බැව් කියයි. පත්පිටු යනු ආගන්තුක පත්තං දුක්ඛං යනාදි තන්හි පැනෙන පත්ත නාමයෙන් ගිත්තවූ පත් ශබ්දයත් වස්ත්‍ර වාචක තත්සම පට ශබ්දයත් සමාසවීමෙන් සිද්ධවූ පත්පට ශබ්දයයි. පත්පිටු යනු කර්මවිභක්ති බහුවචනයෙන් වාච්‍ය

වන්නේ උභොහත්ථෙන සමංකත්වා යනුවෙන් වදාළ සිවුරු කන් දෙපොටයි. සිඛවලඳවිනිසෙහි හා හෙරණසිඛ විනිසෙහි පත්පිටු කියාම දක්වේ. එකාංශ පාරුපනයෙහි හා උභයාංශපාරුපනයෙහිත් සිවුරුකන් දෙක එකට අල්ලා සමකිරීමෙහි වෙනසක් නැති බැවින් පත්පට කියා හෝ අත්පට කියා හෝ ශුද්ධපාඨයයි ඔප්පුදිය නොහැක. හෙරණසිඛවිනිසෙහි වරද ශොධකයන්ගේ ප්‍රමාදයෙන් වූවකි. ඇත්ගොව යනු ඇත්ගොමු කියාද පත්පට යනු පත්පිටු කියාද ශුද්ධපාඨ බව නුමුළාව සැලකියයුතු. පිණ්ඩවංශියෙහිද උභයාංශපාරුපනය පැවති බව මැනවින් දක්වේ. සේ මෙසේය.

සික්ඛාය දීයමානාය වාමහත්ථෙන සඞ්ඝාටිං උච්චාරෙත්වා දක්ඛිණෙන හත්ථෙන පත්තං පණාමෙත්වා උභොහි හත්ථෙහි පත්තං පටිග්ගහෙත්වා සික්ඛා පටිග්ගහෙතබ්බා -පෙ- සික්ඛාය දින්නාය සඞ්ඝ ටියා පත්තං පටිච්ඡාදෙත්වා අනතරමානෙන නිවත්තිතබ්බං.

භාවය: ශික්ෂාව දෙනු ලබන කල්හි වමතින් සඟළ සිවුර ඔසවා දකුණතින් පාත්‍රය පිටකර දෙඅතින් පාත්‍රය පිළිගෙන ශික්ෂා තොමෝ පිළිගතයුත්තීය -පෙ- ශික්ෂාව දුන් කල්හි සඟළ සිවුරෙන් පාත්‍රය වසාගෙන යුහුසුළු නොවන්නහු විසින් පෙරළා යායුත්තේ වේ යනුයි. සඟල සිවුරෙන් පාත්‍රය වසාගන්නට නියමකර තිබියදී සිඛකතීය මේ පාඨය දක්වා අත්පටින් පාත්‍රය වැසීමට නියම පාඨයක් හැටියට සළකා කරයි. පාඨයෙහි එබඳු අදහසක් නැත. සුපටිච්ඡන්න උභයාංශ පාරුපනයෙන් පිණ්ඩපාතවත පුරන්නහු විසින් පිඩු පිළිගැනීමේදී සඟළින් වැසුන පාත්‍රය එළියට ගැනීමට වමතින් සඟල සිවුර ඔසවා දකුණතින් සඟලෙන් වැසුන පාත්‍රය පිටකර දෙඅතින් පාත්‍රය අල්වාගෙන ශික්ෂාව පිළිගෙන නැවතත් සඟළ සිවුරෙන් පාත්‍රය වසාගන්නට නියමකර තිබෙනවා මිස අත්පටකින් පාත්‍රය වසාගැනීමට නියමකරපු

එකම පදයක්වත් නැත. අවිද්‍යමානවූවක් විද්‍යමානකොට දක්වීම මායාකාරයක් අයත්ය. පෙර ලක්දිව දෙවුර වසා පිණ්ඩපාතය නොකල බව කියයි. මේ කියන්නේ සිබකනී ලාගේ ආචාර්යප්‍රාචාර්යයන් සඳහා විය යුතු. ලංකාවේ මහා විහාර පරම්පරාවේ නම් පිණ්ඩපාතයෙහි පමණක් නොව ගම්වදින සියලු අවස්ථාවල උභයාංශ පාරුපනය පැවති බව "දෙයත්වසා පොරොවුන බැව්" යන්නෙන් ප්‍රකාශිතය. තනි පොටසිවුර ඒකාංශපාරුපනයටත් ඒකාංශපාරුපනය විහාරයටත් දෙපොට සිවුර සමග තනිපොට සිවුර උභයාංශ පාරුපනයට හා ගම්වැදීමටත් පිණ්ඩපාතවතෙහි ගම්වැදී මේදී ප්‍රකෘති ඒකාංශ වෙශයට වෙනස්ව අංශකූටදෙක සමඟ ග්‍රීවයත් මිණිබඳත්දෙකත් පාදෙකොන් උඩ දඟදෙකත් වසා ගන්නට කල නියමය හේතුවේ.

64, 65 පිටුවල අන්තරාරාමවල ඒකාංශපාරුපනය ගැන කථාකරයි. විකල් ආරොචනය නොකොට අන්තරාරාමාදියෙහි ගමන අනාපත්තියයි වදල පාඨය පෙය්‍යාලංකොට දක්වා සවමතය සවුව කරන්නට තැත්කර තිබේ. පාචිත්තිය පාලියෙහි ඒ පාඨය මෙසේ දක්වේ.

අනාපත්ති තථාරූපෙ අච්චායිකෙ කරණීයෙ සන්තං භික්ඛුං අනාපූච්ඡා පවිසති අසන්තං භික්ඛුං අනාපුච්ඡා පවිසති. අන්තරාරාමං ගච්ඡති. භික්ඛුනුපස්සයං ගච්ඡති තිත්ථියසෙය්‍යං ගච්ඡති පටික්කමණං ගච්ඡති. ගාමෙන මග්ගො හොති අපදාසු උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති,

මෙයින් දක්වෙන්නේ සර්පදෂ්ටාදි අන්තරාදායක යම් ඉක්මන් ගමනක් වේද? එබඳු ඉක්මන් කටයුත්තෙහි දෙලොස්රියන් අත්පස විද්‍යමාන මහණ නොවිචාරායේද අවිද්‍යමානමහණ නොවිචාරායේද ආරාමයක් අතරටයේද මෙහෙණින් වසන තැනකටයේද තීර්ථකයන් වසන තැනකටයේද සිංහව්‍යාඝ්‍රාදීන්ගෙන් යම් ව්‍යාපදාවක් වේද එබඳු ව්‍යාපදාවන්හි ගමෙන් මගක්වේද එමගින්යේද විකාලා

රෙවනය නොකිරීමෙන් ඇපතති නොවේ. උම්මත්තකයා හටද ඇපතති නොවේ. අන්තරාදායක ඉක්මන් කටයුත්තක් පැමිණි කල්හි විකල්ආරෙවනය නොකොට යාහැකි අවස්ථාව සමදක්වූ පාඨයෙන් වදාලසේක. ඒ අනාපත්ති වාරය විස්තර කල විනයාර්ථ කථායෙහි ආපදාවක් ඇති කල්හි විකල් ආරෙවනය පමණක් නොව උභයාංශපාරුපනය නොකොට විහාරයෙහි සිටියවෙශයෙන් යාහැකි බව මෙසේ විස්තරකර තිබේ.

"අන්තරායෙ"ති ආදිසු න කෙවලං අනාපුච්ඡා කායබන්ධනං අබන්ධිත්වා සඞ්ඝාටිං අපාරුපිත්වා ගච්ඡන්තස්සාපි අනාපත්ති. ආපදාසූති සීහො වා ව්‍යග්ඝො වා ආගච්ඡති මෙඝො වා උට්ඨාති අඤ්ඤො වා කොචි උපද්දවො උප්පජ්ජති අනාපත්ති. එවරූපාසු ආපදාසු බහිගාමතො අන්තොගාමං පවිසිතුං වට්ටති.

භාවය: අන්තරායම යනාදි තන්හි හුදෙක් විකල් ආරෙවනය නොකිරීමෙන් පමණක් නොව කායබන්ධනය නො බැඳ සඟල සිවුර උභයාංශකොට නොපොරොවා යන මහණ හටද ඇවැත් නොවේ. ආපදාවන්හි යනු සිංහයෙක් හෝ ව්‍යාඝ්‍රයෙක් හෝ ඒද මේඝය හෝ නැගේද අන් කිසි උපද්‍රව යක් හෝ උපදීද එකල්හි ගමනින් ඇපතති නොවේ. මෙබඳු ආපදාවන්හි ගමෙන් පිටත් අරණ්‍යාරාමයන් තෙරෙන් ඇතුල්ගමට ප්‍රවිෂ්ටවන්ට වටී යනුයි. මේ දෙශනා අටුවා දෙකේ දක්වෙන පාඨවලින් අන්තරායක් ඇති කල්හි පටිය බැඳනොගෙන විකල්ආරෙවනය නොකොට උභයාංශ පාරුපනය නොකොට යාහැකි තැන් පමණක් වෙන්කොට වදාලේස්ක. ඒ මිස මෙන කිසිතැනක විකල් ආරෙවනය නොකොට උභයාංශපාරුපනය නොකොට යාහැකි තැන් නැත. මෙසේ නිරවුල් අදහස් ප්‍රකාශිත පාඨ පටලවා අවුල් කර දක්වා එකාංශපාරුපනය සියළු තැන කටයුතුයයි දැක්වීම සමාන මායාවක් තවත් ඇද්ද? අන්තරායක් ඇති

කල්හි පටිය බැඳගන්ම උභයාංශපාරුපනය කරගන්ට විකල් ආරෙචනය කරන්ට කල්ගතවීමෙන් ඒ අනතරායෙන් වලකින්ට නොහැකිහෙයින් එබඳු විපත්ති අවස්ථාවන එකාංශපාරුපනයෙන් යාහැකියයි කල නියමය ගෙන සියළු තැන එකාංශපාරුපනයෙන් යායුතුයයි යමෙක් කියනවානම් ඔහු හා සමාන අවිනයවාදියෙක් බුද්ධශාසනයෙහි වෙන නැත. සිඛකතීගේ විමතිවිදූරණයට විමති විනොදනී ටීකාපාඨයක් ගෙන මෙහි දක්වන්නෙමු.

අන්තරාරාමාදීසු ඡණෙ උස්සවදිවසාදීසු මනුස්සෙහි ගාමෙ පදක්ඛිණං කරියමානෙහි ජිනබිම්බාදිං පූජෙතුකාමෙහි වා රොගවූපසමාදි අත්ථාය මනුස්සෙහි යාචිතෙහි වා භික්ඛූහි සුපටිච්ඡන්නාදිවිධිං අකත්වාපි වීථිමජ්ඣෙනෙව ගාමෙ පදක්ඛිණං කාතුං වට්ටතීති වදන්ති තං න ගහෙතබ්බං අනාපත්තිවාරෙ අවුත්තත්තා.

භාවය: අන්තරාරාමාදීන්හි යන මෙහි උත්සවාදි දින යන්හි ගමෙහි ප්‍රදක්ෂිණා කරන මනුෂ්‍යයන් විසින් හෝ බුදු පිළිම ආදිය පූජා කරනු පිණිස පැමිණි මනුෂ්‍යයන් විසින් හෝ රොගමය්‍යපසමනාදිය පිණිසද මනුෂ්‍යයන් විසින් යාචඤා කරනලද භික්ෂූන් විසින්ද උභයාංශපාරුපන සුප්‍රතිච්ඡාදන භාවාදි වදාළ විධි නොකොටද වීථිමධ්‍යයෙන් ගමෙහි ප්‍රදක්ෂිණා කරන්නට වටීය යි විතණ්ඩවාදී ඇතැම් අය කියත්. අනාපත්තිවාරයෙහි නොවදාළ බැවින් ඒ කීම නොපිළිගත යුත්තෝය යනුයි.

මෙසින් යම් යම් අයගේ ආරාධනයෙන් නමුත් එකාංශපාරුපනයෙන් වීථිසංචාරණය හා ගමෙහි යාම නොකටයුතු බව ප්‍රකාශවිය. තවද සුපටිච්ඡන්නශික්ෂාපදය පැනවීමට මත්තෙන්ද වීථිආදියෙහි වඩින කල්හි උභයාංශපාරුපනය පැවැති බව යට ටීකායෙහි මෙසේ දක්වා තිබේ.

වෙසාලියං අනුපරියායිත්වා පරිත්තං කරොන්තෙනාපි ආනන්දත්ථෙරෙන සුපටිච්ඡන්නතාදිං අකොපෙන්තෙනෙව අපසද්දෙනෙව සික්ඛාපදෙ කතන්ති දට්ඨබ්බං.

භාවය: විශාලා මහනුවර ප්‍රාකාරත්‍රය අතුළු ප්‍රදක්ෂිණා කොට පිරිත්දෙශනාකරන්නාවූම ආනන්දස්ථවිරයන් වහන්සේ විසින් සුපටිච්ඡන්නඋභයාංශපාරුපන භාවාදිය කොප්‍යනොකරන්නහු විසින්ම ශික්ෂාපද නොපැනවූ කල්හි මත් කරනලද්දේයයි දක්නයුත්තේය යනුයි. මේ ටීකාපාඨ යෙන් රත්නත්‍රය ලොව පහළවූදා පටන් ගම්වැදීම් ආදියෙහි සුපටිච්ඡන්නඋභයාංශපාරුපනය පැවැතිබව අනාවරණව ප්‍රකටවේය. පාරුපනය සම්බන්ධව දළබහල මොහපටලයෙන් වෙළීසිටිගෙණ උභයාංශවාදීන්ගේ මොහයනැත කථාකරයි. පාරුපනය සම්බන්ධව උභයාංශවාදීන්ට කිසියම් මොහයක් නැතිබව යටවිස්තරකළ පාඨබැලීමෙන් දතහැක. ඒ පාඨ නමැති අඳුන් බෙහෙත් සිඛතීගේ ඇසතුළලා මැද්දෙන් පාරුපනමොහපටලය නැපීයනවා ඒකාන්තයි. එවිට ග්‍රාම ප්‍රවේශනාදියෙහි උභයාංශපාරුපනය කටයුතුබව මැනවින් පෙණෙනවා ඇත.

8 පිටේ දක්වෙන ඒකාංශකරගැනීම මහසුප් තෙරුන් වහන්සේ පාවානුවර සිට කුසිණාරා නුවරට වැඩමවීමේදී උභයාංශ පාරුපනයෙන් වැඩිය නිසාම චිතකස්ථානයෙහිදී වැඳීමට සිවුර ඒකාංශකරගත් බවම මිස වෙන යමක් ප්‍රකාශ නොකෙරේ. ඒකාංශකර සිටියේනම් නැවත ඒකාංශකර ගැනීම කියයුත්තක් නොවේ.

කෘතස්‍ය කරණං නාස්ති කරනලදහුගේ නැවත කිරීමෙක් නැත. යනු න්‍යාය හෙයින් ඊමේදී පැවැති උභයාංශ ප්‍රකෘතිය චිතකස්ථානයේදී නැවත ඒකාංශ සංඥාපක වශයෙන් වීකෘති කරගත් බවම පාඨයෙහි අදහසවේ. විශාලා මහනුවර අනඳමහතෙරුන්වහන්සේගේ උභයාංශපාරු

පනය බුදුන්හමුයෙහිම පැවැති හෙයින් ඊට විරුඬව මහසුප් තෙරුන්වහන්සේ ඒකාංශපාරුපනයෙන් නොවඩිනසේක. ඒ පාඨයෙහි

එකංසං චීවරං කත්වාති සිවුර ඒකාංශකොට යන එත්ථ මේ පද සමුදායෙහි පන විශෙෂය නම්

පුනසණ්ඨාපනවසෙන (උභයාංශ පාරුපනයට අනතුරුව) නැවත ඒකාංශ පාරුපන වශයෙන් පිහිටුවා ගැනීම ඒවං වුත්තං මේසේ කියන ලද්දේවේ. මෙයින් උභයාංශ පාරුපනය ඒකාංශ කරගත් බවම ප්‍රකාශිතය. මෙසේ විශෙෂය විදුරා සාමාන්‍ය ඒකාංශය වර්ණනා කරන ආචාර්යයෝ ඒකංසනතිච යනු වදාලහ. එකංසං ඉතිච එකාංශය යනු කවරේද? (මෙහි චකාරයෙන් උභයාංශයත් සමුච්චයකෙරේ) වාමංසං පාරුපිත්වාඨිතස්ස වම්දපරුව වසා සිටියක්හට කියන එතං අධිවචනං මේ නමක්වේ. යෙන යමකින් වාමංසං පාරුපිත්වා වම්උරය වසා පොරොවා ඨිතං සිටීම යථා යම් සේද තථා චීවරං කත්වා ඉති සිවුර එසේ පෙරවීම කොට යන අස්ස අත්ථො මේ ඒකාංශපාරුපනයාගේ අර්ථ එවං වෙදිතබ්බො හොති මේ නිදර්ශිතාකාරයෙන් දතයුත්තේ වේ· යනුයි මෙයින් ඒකාංශ පාරුපනය වර්ණනා කලා මිස මහසුප් මහතෙරුන්වහන්සේ ඒකාංශ කරනෙත වැඩියබවක් වර්ණනා නොකෙළේය. සිඛකතීගේ දුමිතය සපිරකරගන්ට නම් ඒකංසං පාරුපිත්වාඨිතො තිය පාඨය අමුතුවෙන් ගැලපිය යුතුවේ.

87 පිටේ රතන දුපටවං නිවාසෙත්වා යනාදි පාඨයෙන් දක්වෙන්නේ විහාරයෙහි දෙපොට අඳනය හැද වැඩසිටිය බවයි. එබැවින් ඒ පාඨය දැක්වීමෙන් ගතයුත්තක් නැත. දෙවැනි පාඨයෙන් හිමවතින් වැඩ ගම්සමීපයෙහිදී උභයාංශ පාරුපනය කරගත්ත බැවින් ගතයුත්තක් නැත.

88 පිටේ වාසොපනතාසා යට විස්තර විය.

89 පිටේ බුදුරජාණන්වහන්සේ ඒකාංසපාරුපනය කොට ධර්මදේශනා කළසේකැයි දක්වමින් බුජ්ජුත්තරාව උතුරුසළුව ඒකාංශකොට පොරෝවා බණකීවායයි නිදර්ශනය කරයි සිඛකන්‍යා සිඝිකල්පනාව ඇතියෙක්නම් එම පොතෙහි 54 පිටේ මතු පහළවන මේ පාඨය නොදක්වයි.

බුද්ධාචිණ්ණාව ගණ්ඨිකංපටිමුඤ්චිත්වා පටිච්ඡන්න සරීරා පරිසතිං ධම්මං දෙසෙන්ති.

අදහස: බුදුවරයෝ නම් දෙවුර වසා පොරෝවා ගණ්ඨිය මලපත්තෙහි හෙවත් පුඩුවෙහි අවුණාගෙන පිළිසන් ශරීර ඇතිව පිරිස්මැද ධර්මදේශනා කෙරෙත්යයි යටපාඨය සමාතිවිප්‍රවාතවසිබකන්‍යාමදක්වාතිබේ. පිරිත් බණදහම් කීමාදිකටයුත්තෙහි දෙවුර වසා පොරෝවාගැනීම යට විස්තරකර ඇත. සාසනිකගරුකටයුතුවලදී උතුරුසළුව ඒකාංශකොටපොරෝවාගැනීම ගිහියන්ගේද චාරිත්‍රධර්මයකි. බුදුරජාණන්වහන්සේ එදවස සුමන මාලාකාරයාට අනු මෙවැනි ධර්මදේශනාකර වදාළේත් උභයාංසපාරුපනයෙන් යුක්තවයි. බුජ්ජුත්තරාව ධර්මදේශනා කළේ උතුරුසළුව ඒකාංශකොට පොරෝවාගෙනයි. එබැවින් ඒ කටයුතු දෙක අසමාන බැව් සැලකියයුතු.

තවද ඒකාංශ පාරුපනයට ගණ්ඨිය අවුණා ගැනීමේ නියමයක් විනයපිටකයෙහි නැත. ඇතුල්ගම්වැදීම පිඬු පිණිස හැසිරීම පිරිත් බණදහම් දෙසීම යනාදි අවස්ථා වලදී සුප්‍රතිච්ඡාදනඋභයාංශපාරුපනාවශාතයෙහි ගණ්ඨිය අවුණා ගැනීම විනයෙහි වදාළ නියමයයි. බුදුවරයන් වහන්සේලාද යටදක්වූ සියළුම අවස්ථාවලදී සුප්‍රතිච්ඡාදනයයි කියන්ලද උභයාංශපාරුපනය කොට මිණිබඳණෙන් යට අත්තල දෙකත් දණපිඬු මසෙන් යට පාදෙකත් ගෙලමිඩ ලෙන් උඩ ශීර්ෂයත් යන පස්පළ විවෘතකර ගණ්ඨිය මල පතෙහි හෙවත් පුඩුවෙහි අවුණාගෙන මුළු ශරීරය වසාගෙන ධර්මදේශනා කරන බව යට පාඨයෙන් දක්වීය,

90, 91 පිටුවල විමසීමෙන් වැඩක් නැත.

92 පිටේ ඒකාංශකර (එකුළුරයක් විවෘතකරගෙන) ගමනත් ස්තන විවෘතකරගෙන ගමනක් වරදබව සිඛකර්තෘම කියයි. තමන් ඒ වරදින් නොමිදී අනුන්ව උගන්වන්ට කරුණු කියන තැනැත්තා කිළුටුවන බව සැලකිය යුතු.

93 පිටේ සුදින්න ස්ථවිරයන්වහන්සේ උභයාංශ පාරුපනය කොට වැඩිය නිසා අත්පාතල පමණක්ම දැකීමෙන් ඇඳිනගත් බවත් දැසියක් ස්වාමිපුත්‍රයකුගේ මුහුණ බැලීම සිරිත නොවන බවත් දතයුතු. වීමංසනබුද්ධි රහිතව ඕනෑම පාඨයක් ගෙන දැක්වීම සිඛකර්තෘගේ පරමාර්ථයවේ.

94 පිටේ ඒකංසං උත්තරාසඞ්ගං කත්වා යනාදි පාඨයෙන් ප්‍රකාශවන්නේ කරණලද විනයකර්මඇති භික්ෂූනීන් ඊපිආදියෙහි පවා උභයාංශපාරුපනයවෙනස්කොට ඒකාංශකරගෙන භික්ෂූන් සම්මුඛවූ තැනදී වඳින බවයි.

ඒ කාවයුත්ත භික්ෂුණීන්ගේ සාමීචිප්‍රතිපදාවයි. සියළු තැන ඒකාංශපාරුපන ප්‍රතිපදාවක් නොදැක්වේ. අඤ්ජලී කර්මාවස්ථායෙහි උත්තරාසඞ්ගය ඒකාංශකරගැනීම වදාල නියමය බැව් සැලකියයුතු. භික්ෂුණීහු වැඳීම අවසන්කොට උභයාංශපාරුපනය කොට වසිති.

95, 96 පිටුවල තස්ස පන රඤ්ඤො කාලෙ යනාදි පාඨයෙහි ඕනෑතරම තැන් හැරදමා වුවමනාකරන හැටියට ගලපා කරුණු දක්වා තිබේ.

ශාසනවංශප්‍රදීපිකා නම්වූ බුරුම ශාසනවංශයෙහි ඒ පාඨ ඈ පිළිවෙළින් මෙහි දක්වනු ලැබේ.

තස්ස පන රඤ්ඤො කාලෙ සලලවතියා නාම නදියා පච්ඡිමභාගෙ තුණ්ණනාමකෙ ගාමෙ ගුණාභිලංකාරො නාම ථෙරො සාමණෙරානං ගාමප්පවෙසනකාලෙ ඒකංසං උත්තරාසඞ්ගං කාරාපෙත්වා සීසාවරණාන පත්තානි ගණ්හාපෙත්වා තාලවණ්ටමෙව ගණ්හාපෙසි ඒකො

ගණෙහුත්වා පරිවාරෙනසද්ධිං තුසනගාමෙ නිසීදි සොජනථෙරො පාලිඅට්ඨකථාටීකාගන්ථන්තරෙසු අධිප්පායං යථාභූතං නජානාති. අභිධම්මපිටකං සෙව සිස්සානං වාචෙත්වා නිසීදි.

තස්මිං කාලෙ ඛෙතුමතීනගරෙ නිසින්නො බුද්ධඞ්කුර ථෙරො විතත්ථෙරො දීපඞ්ගනගරෙ උලඟ්ගු ගාමෙ නිසින්නො සුනන්දථෙරො තලප්ප නගරෙ ජයබහු අඩ්ඩ ගාමෙ කල්‍යාණථෙරොති ඉමෙ චත්තාරො ථෙරා සාම ණෙරකං ගාමප්පවෙසන කාලෙ එකංසං උත්තරාසඞ්ගං අකාරෙත්වා සීසාවරණාතපත්තානි අගණ්හාපෙත්වා චීවරං පාරුපාපෙත්වා තාලවණ්ටං ගාහාපෙත්වා සක සක ගණං ඔවාදං කත්වා නිසීදිංසු.

එත පන ථෙරා පාලිඅට්ඨකථාටීකාගන්ථන්තරෙසු අධිප්පායං යථාභූතං ජානිංසු තීසුපි පිටකෙසු කොවිදා අහෙසුං.

භාවය: ඒ රජහුගේ කාලයෙහි වනාහි සලලවතී නම් ගංගාවගේ පශ්චිම භාගයෙහි තූසන නම් ගමෙහි ගුණාසීලඞ්කාර නම් ස්ථවිර තෙම සාමණේරයන් ගම්වදින කල්හි තනිපොට සිවුර එකාංශකොට පාරුපනය කරවා ශීර්ෂාවරණ ඡත්‍ර නොගන්වා තල්වැටම ගැන්වී, එක්ගණයක්ව පිරිවර සමග තූසන නම් ගමෙහි හුන්නේය. තූසන ගණයට අයත් ඒ තෙරුන්වහන්සේ වනාහි පෙලඅටුවා ටීකා ග්‍රන්ථාන්තරයන්හි අභිප්‍රාය තත්වූ පරිදි නොදනියි. අභිධර්මපිටක යම් ශිෂ්‍යයන්ට උගන්වා හුන්නේය. ඒ කාලයෙහි ඛෙතුමතී නුවර හුන්නාවූ බුද්ධඞ්කුර තෙරුන්වහන්සේද විතත නම් තෙරුන්වහන්සේද දීපඞ්ග නුවර උලඟු නම් ගම හුන්නාවූ සුනන්ද තෙරුන්වහන්සේද තලප්ප නුවර ජයබහු අඩ්ඩගම කල්‍යාණ තෙරුන්වහන්සේද යන මේ තෙරුන්වහන්සේලා සතර නම සාමණේරයන් ගම්වදින කල තනිපොට සිවුර

ඒකාංශකොට පාරුපනය නොකරවා ශීර්ෂාවරණත්‍ර නො ගන්වා දෙපොට සිවුර උභයාංශකොට පාරුපනය කරවා තල්මැට ගන්වවා සවකීය සවකීය ගණයාට අවවාද කොට හුන්නාහුය.

ඒ තෙරුන්වහන්සේලා පෙළඅටුවාටීකාග්‍රන්ථාන්තර යන්හි අභිප්‍රාය තත්වූ පරිද්දෙන් දක්නාහුය. පිටක ත්‍රයෙහිම දක්‍ෂයෝ වූහ යනුයි.

බුරුම ශාසනවංශයෙන් ගෙන මෙහි යටදක්වනු ලැබූ පාඨයන්ගෙන් ඒකාංශපාරුපනය පහළ කළ ගුණාභි ලඞ්කාර තෙරුන්වහන්සේ විනයපෙළඅටුවා ඇසුරු නොකළ පාරුපනය සම්බන්ධ යථාර්ථ නොදත් තුන්න ගණයට අයත් කෙනෙක් බව ප්‍රකාශිතය. කෙතුමතී නුවර වැඩසිටි බුද්ධඞ්කුරථෙර විනනථෙර දීපඞ්ග නුවර වැඩසිටි සුනන්ද ථෙර තලප්ප නුවර වැඩසිටි කල්‍යාණථෙර යන සතර නම ඒකාංශපාරුපනයට විරුද්ධව සිටියෝය.

මේ සතරනම ත්‍රිපිටකයෙහි දක්‍ෂයෝය. මුන්වහන්සේලා බුදුන් රහතුන් කාලයේ පටන් පැවැති සුපටිච්ඡන්න උභයාංශ පාරුපනය නොනස්වා පවත්වාගෙන ආවෝය. සලලවතී නුවර තුන්න ගණයට අයත් ගුණාභිලඞ්කාර තෙරුන්වහන්සේ විනයනයෙහි අව්‍යක්ත බැවින් පිඩුපිණිස හැසිරෙන සාමණේරයන්ගේ පහසුව පිණිස මේ දුෂ්ප්‍රතිපත්තිය උගැන්විය. මෙහි යටදැක්වූ පාඨ සිඛකතීං අවුල්කර දක්වාපු ආකාරයත් කපටිකමින් කරතිබෙන විකාරයත් හොඳින් තේරුම්ගත හැකිවේ.

97 පිටේ අම්හාකං වාදෙසම්මපසනාලඞ්කාසස සඞ්ධම්මචාරිථෙරසස පහවොති යි පාඨය දක්වා තමන්ට ඕනෑ අදහස් දක්වා තිබේ. සිඛකතීං ගෙනහැරපෑ මේ පාඨය ඒකාංශ ගණයෙහි ඇතමුන්ගේ අභූත දැක්වීමක් බව බුරුම ශාසනවංශයෙහි දැක්වේ. ඒ මෙසේය.

කෙචි පන පාළිආදීසු සකවාදස්ස අනාගතභාවං ඤත්වායෙව අපරිසුද්ධචිත්තා හුත්වා සම්මා සම්බුද්ධස්ස භගවතො මුඛං අනොලොකෙත්වා සම්මා සම්බුද්ධස්ස භගවතො ගුණං අනනුස්සරිත්වා සකවාදෙ ආකාසෙ පසාරිත හත්ථා විය අප්පතිට්ඨා අජිනිත්වායෙව අම්හාකං වාදෙ සම්පත්ත ලද්ධස්ස සබ්‍රහ්මචාරිථෙරස්ස පහොන්ති අනිස්සයභූතං නිස්සයං අකංසු, අභූතෙන මහාථෙරං සීලවන්තං අබ්භාචික්ඛිංසු. ඛ්‍යාතිනාමකෙ ගාමෙ දිට්ඨධම්මිකසම්පරායිකත්ථං අනපෙක්ඛන්තස්ස භින්නවන්තස්ස දුස්සීලස්ස උපාසකස්ස ලඤ්ජං දත්වා අම්හාකං වාදානුරූපං එකං ගන්ථං කරෙහීති උය්‍යොජෙත්වා අනාගතෙ අනුභවියමාන දුක්ඛතො අභායිත්වා නිස්සයං ගවෙසුං.

භාවය: ඇතැම් කෙනෙක් වනාහි පෙළ අටුවා ටීකාදියෙහි ස්වකීය එකාංශවාදය නොදක්නා බවම දැනම අපිරිසුදු අදහස් ඇතිව සියල්ල දත් භාග්‍යවතුන්වහන්සේගේ මුවකමල නොබලා සියල්ල දක්නාවූම භාග්‍යවතුන්වහන්සේගේ ගුණ සිහිනොකර ස්වකීය එකාංශවාදය අහසෙහි ප්‍රසාරිත අත් මෙන් ප්‍රතිෂ්ඨාරහිතව එකාංශවාදයෙන් නොදිනාම අපගේ වාදය ලබනාවට පැමිණි සබ්‍රහ්මචාරී තෙරුන්ගෙන් ප්‍රභව වීයයි නිශ්‍රය නුවූවෙක් නිශ්‍රය කළාහුය. අවවාදකළ සිල්වත් තෙරුන්වහන්සේට අභූතයෙන් අභ්‍යාඛ්‍යානය කළාහුය. ඛ්‍යාති නම් ගමෙහි මෙලොව පරලොව වැඩ නොදන්නාවූ දුශ්ශීල උපාසකයකුට අල්ලස්දී අපගේ එකාංශවාදයට සුදුසු වූ එක් ග්‍රන්ථයක් කරවයි මෙහෙයා මතු සසර විඳිනු ලබන දුකට නොබියව නිඃශ්‍රය සෙවූහ යනුයි.

සබ්‍රහ්මචාරී ස්ථවිරයන්වහන්සේගේ කිසියම් සම්බන්ධයක් නැති එකාංශික ගණයා අනිශ්‍රයක් නිශ්‍රයකොට මූලා කරනු පිණිස දක්වූ පාඨය ගෙන අගමුල නොවිමසා සිබ කතීඃ කරතිබෙන කපටිකම යටපාඨය කියවන කාහටත් හොඳින් වැටහෙනවා ඇත. සබ්‍රහ්මචාරී තෙරුන්වහන්සේ

දෙවුරනොවැසූයේද ලක්දිව දෙවුර නොවැසූයේද කියති. ශාසනවංශ දක්වූ කිසියම් පොතක නාමාවූ කටමැත හැල් ලක්ම දෙබවා තිබේ.

මහාසාමි තෙරුන්වහන්සේ ලක්දිව ධර්මකීර්ති සඞ්ඝ රාජයන් උපාධ්‍යායකොට උපසම්පදාව ගෙනගියබවද කියති. මෙසා සාහසික අසත්‍ය කියන්නෙක් වෙතිය රජහැර තවත් ලොව ඇද්ද? මහාසාමි තෙරුන්වහන්සේගේ උපසම්පදාව ගෙනගිය පිළිවෙළ බුරුම ශාසනවංශයෙහි මෙසේ දක්වේ.

කලියුගෙ චතුවස්සාධිකෙ අට්ඨසතෙ මහානරපතිනාම රාජා රතනාපුර නගරෙ රජ්ජං කාරෙසි. සො මහාරාජා ථූපාරාමං නාම මහාචෙතියං කාරාපෙසි. තස්ස පන ආචරියො මහාසාමිථෙරොනාම සො පන ථෙරො සීහළදීපං ගන්ත්වා සීහලින්දරඤ්ඤො ආචරියස්ස සාරිපුත්තත්ථෙරස්ස සන්තිකෙ සික්ඛං ගහෙත්වා පච්චාගන්ත්වා ථෙරවංසිකොති දට්ඨබ්බො.

සාරාංශ: බුරුම ඛණ්ඩකලියුග වර්ෂ අටසිය සතරේදී මහානරපති නම් රජෙක්තෙම බුරුමරට රතනාපුර නගර යෙහි රාජ්‍යය කෙළේය. ඒ මහා නරපති රජතෙම ථූපාරාම නම් මහා චෛත්‍යයක් කරවී. ඒ රජහට වනාහි මහාසාමි තෙරුන්වහන්සේ ආචාය්‍යීවූහ. ඒ මහාසාමි තෙරුන් වහන්සේ වනාහි ලක්දිවට පැමිණ ලංකේශ්වර රජහුගේ ආචාය්‍යීවූ ශාරිපුත්‍රස්ථවිරයන්වහන්සේගේ සමීපයෙන් අධිශීල ශික්ෂා සඞ්ඛ්‍යාත උපසම්පදාව ගෙන පෙරළා වැඩියාවූ ස්ථවිර වංශික උත්තමයෙක්යයි දතයුතු.

සිඛත්තීගේ ප්‍රකාශවිලහැටි දැන් හෙළිවූ බැවින් පිළියම්කරගැනීමවටී මහාසාමි තෙරුන්වහන් සේගේ ශිෂ්‍යානුශිෂ්‍යපරම්පරාවේ ස්ථවිරවරුන්වත් ලංකාවාසී මහාවිහාර පරම්පරාවේ සඞ්ඝයාවහන්සේවත් කිසිකලෙක ඒකාංශ පාරුපනයෙන් ශූකානව ගම් නොවැදූහෝය. බුදු රජහු අභිමුව විශාලාමහනුවර පිරිත් දෙශනාකළ අනද හාමූ

දුරුවන්වහන්සේගේපැවැත්ම අවිච්ඡින්නව පැවැත අා මහාවිහාරපරම්පරාවේද එසේම පැවැති බවත් කාශ්‍යප රජහු ගේ විවරණයෙන් කදිමට ඔප්පුවේ. සිඛනතීා ශාසනවංශ ප්‍රකාශකයන් අතුරෙන් සාහසිකවූ අසත්‍ය ප්‍රකාශකයෙක් බව මේ කරුණු විමසන කාහටත් හොඳින් වැටහේ.

98 පිටේ උභයාංශපාරුපනය ප්‍රතික්ෂෙපකළ තිරිය පබ්බතවාසී තෙරුන්වහන්සේගේ ආචාර්‍ය්‍යවරයා නොදක්වා ශෝණුත්තර පරම්පරාවේ බව කියති සොණුත්තර මහ රහතන්වහන්සේලා ගම්වැදීමේදී උභයාංශපාරුපනය වෙනස් නොකොළෙෝය. එම පරම්පරාව කාලාතික්‍රම වීමෙන් භින්න භින්නව විරූප පාරුපනය ඇතිකරගත්තේ එකාංශිකයෝය. ඒ මිස අවිච්ඡින්නව පැවත ආ කිසිවෙක් උභයාංශ පාරුපනය නොහැරිය බව සැලකිය යුතු.

99, 100, 101 පිටුවල එලික විහාරවාසී තෙරුන් ඇතුළු සතරනමට පාරුපන වාදය නිෂ්ටා කරන්ට නොහැකිවූ බව හැර ගතයුත්තක් නැත

එක්බිතිරජු යනු කවරෙක්ද? පටිවිසාක ශානවාසීහු එක්බිති හෙවල වැසියෝය. මේ රජද එක බිත්තිය ඇති අල්ලපුහෙයි රජෙක්ද? එක්බිති, ඉක්බිති, දෙක එකාර්ථ කොට ලිවීම බලවත් වරදකි පටිවිසාක එක්බිති, අථ ඉක්බිති; යයි සැලකියයුතු.

102, 103, 104, 105, 106 පිටුවල දක්විතිබෙන කරුණු අතර අමරපුරයෙහි අධර්මවාදී රාජ්වාර්‍ය්‍යවූ අතුල තෙරුන් රාජ බලයෙන් උභයාංශපාරුපන පක්ෂය යටත්කළ බවයි.

107, 108 පිටුවල අලෞංප්‍රාං රජහුගේ ආචාර්‍ය්‍යවූ අතුල තෙරුන්වහන්සේ විසින් කියනලද ගම්වදින කල්හි බඳපටිය බැඳගැනීම කළබව දක්වාපු නීලම්බරමට වැනි චූලගණ්ඨි පදය බුරුම රටේවත් ලංකාවේවත් ඇති පොතක් නොවේ. නිඝණ්ඩුශාස්ත්‍රය කළ මුගලන් තෙරුන්වහන්සේ විසින් එබඳු

පොතක් කලබවක් කිසිම ග්‍රන්ථයක නොදක්වේ. එබැවින් ඒ කරුණු ගෙනපෑමෙන් උභයාංශපාරුපනය වලක්වන්ට නොහැක. ගම්වැදීමෙහි එකාංශපාරුපන අධර්මය ප්‍රකාශකළ අතුල තෙරුන්වහන්සේගේ පන්සලටත් ඊට අනුබල දුන් අලෞංප්‍රාං බුරුම රජහුගේ නෙවත් එකවර හෙණගැහු බව බුරුම ශාසනවංශයෙහි කියාතිබේ. මේ කර්මානුරූපසිද්ධියෙකි. ඒ මෙසේය.

ඉදානි භගෙනන විනයධම්මානුලොමවසෙන ආචරණතානං අම්හාකං ඊදිසං කම්මං අසාරුප්පං අහො අච්ඡරියමෙව ලොකෙති එකො ථෙරො ආහ. අථ පන එකො ථෙරො එවමාහ. ඉදානි ආවුසො ලොකපාලදෙවා ඊදිසං අධම්මකම්මං දිස්වාපෙව අජ්ඣුපෙක්ඛිත්වා අප්පොස්සුක්කා නිසීදිතුං නසක්කා ඉදානි ලොකපාලදෙවා පමජ්ජිත්වා නිසීදන්තීති මඤ්ඤෙ. තස්මිං යෙව ඛණෙ මෙඝෙන මෙඝො උට්ඨහිත්වා අතුලථෙරස්ස විහාරෙච රාජගෙහෙච එකක්ඛණෙ අසනියො පතිංසු.

භාවය: දූත් ස්වාමීනි! විනය ධර්මයට එකඟව උභයාංශ වනෙහි හැසිරෙන්නාවූ අපට කළ මේ ආකාර කටයුත්ත නුසුදුසුය, අනේ! ලෝකයෙහි අපූරුගයන්නවම වටියයි එක් තෙරුන්වහන්සේ නමක් මෙසේ කීයේය. ඇවැත්නි! දූත් ලොකපාල දෙවියෝ මෙබඳුවූ අධර්ම කටයුත්ත දැකම අධ්‍යූපෙක්ෂිතව අල්පොත්සුකව ඉන්ට නොහැක්කාහුය. දූත් ලොකපාල දෙවියෝ ප්‍රමාදව හිඳිත්යයි හඟිමි. ඒ ක්ෂණයෙහි වේගයෙන් මේඝය නැඟී අතුල තෙරුන්වහන්සේගේ විහාරයෙහිද ආධාරකළ අලෞංප්‍රාංරජහුගේ ගෙහිද හෙණ වැටුනාහුය.

මේ හෙණගැසීම කර්මානුරූප සිද්ධියකි. දඬුවම් නොකට යුත්තන්ට දඬුවම් කිරීමේදී කරුණු දශයක් අතුරෙන් එක කට පැමිණීම ඉහාත්මයෙහි ලැබෙන බව ආගමනියමය බව සිඛකනීාද සලකා විලිබිය ඇතිව හෙණගස්වා නොගෙන පරිස්සම්වියයුතු.

109, 110 පිටුවල අඹගහපිටියේ ඤාණවිමල මාහිමියන් වහන්සේ උපසපන් ගෙනෙන්නට ගිය කාලය මහණවෙස් නිවීගිය කාලයයි වියරුහුණුවෙක්මෙන් කියයි. ලඞ්කාවේ මහාවිහාර පරම්පරාවේ පැවැති උභයාංශපාරුපනය මොග්ගලිපුත්ත තිස්ස මහරහතුන්ගේ පෙරවීමයි. ඒ බැව් යම් විස්තරකර ඇත. ඒකාංශකර ගැනීමෙන් හෝ උභයාංශ කර ගැනීමෙන් හෝ මහණකම නිවීයේ නම් අද සියම්නිකායට මහණකමක් නැත. යටකී උපසම්පදාව ගෙනෙන්නට ගිය කාලය මහාවිහාරීය මහණකම අමරපුරයෙහි පුන්සඳමෙන් නිම්ලව දල්වූ කාලයයි. සියම්නිකාය මුඛාරූඪ වචන කියන්නෙක් බව මෙයින් පැහැදිලියි.

111, 112, 113 පිටු විමසීමෙන් වැඩක් නැත.

114 පිටේ සියම්නිකාය තුන්සිවුරම එකපමණයයි කියයි. විනයපිටකයෙහි එබඳු නියමයක් කිසිතැනක නැත. ඒ මුඛාරූඪ කථාවකි. සඞ්ඝාටි උත්තරාසඞ්ග දෙක එකපමණයි. නන්දතෙරුන්වහන්සේ සුගත් සිවුර පමණ සිවුරක් කරගෙන පෙරවීම නිමිත්තකොට පණවා වදාළේ එපමණ පාරුපන චීවරය නොකටයුතුයයි තහනම් කිරීමටයි. අඳනය ගැන කිසිත් නොවදාළසේක. ශාසන පරම්පරාවේ පැවැත ආ අඳනයේ පළල දෙරියන් සමාරකි. සිවුරේ සරස සිව්රියන් සමාරකි. තුන්සිවුරම එකපමණ වන්නේ කෙසේද? ථෙරවාදයේ මුට්ඨිපඤ්චකය වදාළේ සිවුරේ හිම් බැඳීමටය. අඳනයේ සරස දෙරියන වදාළේ අන්තිම පරිච්ඡේදය දක්වීමටය. පොරෝනා සිවුරු සුගත් සිවුරට උනුවත් අඳනය සුගත් අඳනයට උනුවත් කටයුතු බව විනය නියමය බැව් සැලකියයුතු. සාධිසෙන් ලද පාරම්පරික සිවුරු චීවරප්‍රමාණ පරිච්ඡේදය බලා දතයුතු.

115, 116 පිටුවල කරුණු යට විස්තරකර ඇත.

117 පිටේ ගණ්ඨිකං පටිමුඤ්චිත්වා යනාදී පාඨය දේශනාපෙළට අනුව අර්ථදක්වන්ට නොහැකිවූ සියම්නිකායට විනයවිනිශ්චයක් කෙසේ කළහැකිද? ගණ්ඨිය මලපතේ

අවුණා ග්‍රීවය කෙසේ වැසියහැකිද? කෝට්එකේ බොත්තම් අවුණා කෝට්එක අඳින්නට කීමට සමානය. බුදුන් වදාළේ පාරුපනාවශානයෙහි භණ්ඩිය අවුණාගෙන යන්ටයි. ඒ කරුණු නොසලකා හිතුවක්කාර අදහස් දැක්වීම නොහොබී.

118, 119 පිටුවල දැක්වෙන ගාථාවයට උත්තර යට විස්තරවී ඇත. සිඛකතීගේ මේ ගාථාදෙක දැක්වීම කෙසේද කියතහොත් දවස මුළුද තැනූ වලන්රැසක් පොලූපහරක් හෙළා බිඳදැමීමක් හා සමානවේ. එකාංශපාරුපනය දක්වන්ට අවශානයෙහි දැක්වූයේ උභයාංශපාරුපනය කරගැනීමට වදාල ගාථා දෙකකි.

ඒ මෙසේය.

**ගලවාටකතො උඩං සීසංච මණිබන්ධතො**
**හත්ථෙ පිණ්ඩිකමංසම්හා හෙට්ඨාපාදෙ උභොපිච**
**තථා අකත්වා භික්ඛුස්ස ජනතූනිපි උරම්පිච**
**විවරිත්වා යථාකාමං ගච්ඡතො හොති දුක්කටං**

භාවය: ගලවලුවෙන් (ග්‍රීවයෙන්) උඩහිසත් මිණිබහණෙන් යට අත්තල දෙකත් පිඩුමසින් යට පාදෙකත් (යන පස්පල විවෘතකොට සෙසු මුළු ශරීරය වසාහිඳීද ඒ සුපටිච්ඡන්නඋභයාංශපාරුපනය නම් වේ.) එසේ නොකොට උරහිස් දෙකත් පපුවත් විවෘතකරගෙන යන මහණහට දුක්කට වේ.

සිඛකතීා යට ගාථාදෙක සිහිනුවණින් සෙදී සැලකුවා නම් උදාහරණ නොකරයි. යටදැක්වූ ගාථාවල විස්තර අටුවාහිද මෙසේ දක්වා තිබේ.

**ගලවාටකතො පට්ඨාය සීසං මණිබන්ධතො පට්ඨාය හත්ථෙ පිණ්ඩිකමංසතො පට්ඨාය පාදෙ විවරිත්වා සෙසං ඡාදෙත්වා නිසින්නො සුපටිච්ඡන්නො නාම.**

භාවය: ගලමිඑව පටන් හිසත් මිණිබහණ පටන් අත් තල දෙකත් දඟපිඩුමස පටන් පාදෙකත් යන පස්පල විවෘත කොට හුන්නේ සුපටිච්ඡන්නඋභයාංශපාරුපනය නම් වේ.

මේ පාඨයෙන් ප්‍රකාශවන අශුරූ එකාංශපාරූපනයෙන් එකඅතක් එකළුරයක් විවෘතකරගෙන මුළු ශරීරය වසාගත් තව පිළිවත් කෙසේදැයි විඥප්ඥණය ඇතියෙකුට වටහාගන් නට බැරිනම් පුදුමයකි. සිඛකතීඃ සවමතය සනාථකරගන්නට තම පොතේ ගෙන දක්වාපු එකිනෙක කරුණු අප විසින් කරුණු සහිතව නිරාකරණයකර ඇත.

ඒ කරුණු විමසා බලා චීවරය ගැනත් පාරූපනය ගැනත් සිඛකතීගේ දුර්මත බැහැරකොට ප්‍රතිපත්තිපූජා වෙන් බුදුන් පුදා නිවන්පසක් කටයුතු.

උත්තරපරිච්ඡේදයයි.

---

දෙඹන්දූවේ
විනයාචරිය සද්ධම්මකීර්තිශ්‍රී
**සීලරතන සරණජෝති තිස්ස මහා නායක ස්ථවිරයන්**
විසින් සම්පාදිතවූ පාරූපනය නම්
ප්‍රකරණය නිමි.

---

**නිබ්බාණ පච්චයො හොතු.**

## කතඤ්ඤුසන්දස්සනං.

---

ගාමෙ දෙඩන්දූවභිධෙ කවිසෙවිතමහි
ගබ්භාදිරම්ම විදිතෙ පවරෙ විහාරෙ
යො සඤ්ඤමී ගුණධනො විනයෙතිඡෙකො
ථෙරොසි සීලරතනවහය සඞ්ඝනෙතා

එතස්ස සාධුචරිතස්ස මහාදයස්ස
සිස්සො සිරි සරණජොති සමඤ්ඤූපපතො
සද්ධම්මයුත්තික නිකාය වරෙ මහාදි
නෙතා "නුවිජ්ජක ධූරෙ" පිපුරෙ නිවුත්තො

කොටදූගොඩවහ නිගමෙ ඉහදක්ඛිණස්මිං
පාචීන පණ්ඩිතඋපාධි ධුරන්ධරෙන
ඤාණාදිලොකයතිනා ජිනසාසනස්මිං
උප්පාදිතබ්බුද නිරුත්තරණමපවිච්ච

ආදාය පාලිසහිතට්ඨකථානයං තං
සඞ්ගය්හ පාරූපත ආදි නයං අකාසි
ගන්ථස්සිමස්ස පරිසීලන සජ්ජනානං
අත්ථාය හොති අපිචබ්බුද නාසනඤ්ච

විජ්ජන්ති චෙ ඉහපමාද කමාදි දොසා
සොධෙන්තු තෙ ජිනමතාව ගතානතීසා
තෙනෙව අස්ස විසදී කරණෙපමාණා
අඤ්ඤෙහි කිං අවිදිතෙහි යථාසභාවං

කුක්කුච්චකා විනයවාදි සුලද්ධසද්ධා
ධම්මානුලොම පටිපත්ති පථානුයාතා
ලඞ්කාය සාසනධරා යතයො වියත්තා
සම්මාභජන්තු ඉහමෙ සමුදීරිතං යං

සංවච්ඡරෙ මනුවරප්පමිතෙ ජිනස්ස
සංදෙහ ඤාතක නයස්ස නිදස්සනෙන
සම්බුද්ධසාසනහිතාය කතො මයායං
සම්භාතු භරතිපථෙ ජිනසාසනස්මිං

ධම්මො පවත්තතු සමං පටිපත්තියත්ථං
දෙවො පවත්තතු සමං සමයෙ සුඛත්ථං
ලොකො පවත්තතු සමං සජ්ජනෙ හිතත්ථං
රාජා පවත්තතු සමං ජනපාලනත්ථං

කතෙනෙතෙන ගන්ථෙන යං පුඤ්ඤං පසුතං මයා
සබ්බෙතං අනුමොදිත්වා සාධයන්තු සිවං පදන්ති

# පාරුපනනය

(චීවරප්‍රමාණාදිය සහිතයි)

දෙඩන්දූවේ ගංගාරාමාධිපති විනයාචරිය සද්ධම්මකිත්තිස්සිරි
මහොපාධ්‍යාය
ශ්‍රී සීලරතන සරණජෝතිතිස්සාභිධාන
මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් සම්පාදිතයි.

ධර්මදානය පිණිස යි.